# මධ්‍යම සංස්කෘතික අරමුදල

දැක්ම

**ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමයන්**

**ගෝලීය ආශ්චර්යය බවට**

**පත් කිරීම**

මෙහෙවර

**ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන්**

**පර්යේෂණය, ආරක්ෂණය, සංරක්ෂණය, සංවර්ධනය, පුවර්ධනය**

**හා**

**තිරසාර සංස්කෘතික ආර්ථික සාධනය මගින්**

**පෙරදිග සංස්කෘතික උරුම කළමනාකරණය**

**පිළිබඳ**

**විශිෂ්ඨතම ආයතනය වීම.**

## මධ්‍යම සංස්කෘතික අරමුදල කාර්යයන් හා පරමාර්ථ

- සංස්කෘතික ත්‍රිකෝණය තුළ ඇති සංස්කෘතික ස්මාරක සහ සංස්කෘතික ත්‍රිකෝණය හැර වෙනත් යම් ප්‍රදේශයක ඇති මහජන යහපත සඳහා දියුණු කිරීම අවශ්‍ය බව මණ්ඩලය විසින් අදහස් කරනු ලබන වෙනත් යම් සංස්කෘතික ස්මාරක සංවර්ධනය කිරීමේ දී වන වියදම් දැරීම.

- ජේතවන දාගැබ යෝජනා ක්‍රමයෙහි සහ වෙනත් ඒ හා සමාන යෝජනා ක්‍රමයන්හි සියලු වියදම් දැරීම.

- ශ්‍රී ලංකාව ඇතුළත හෝ විදේශයන්හි ආගමික කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා කටයුතු කිරීම.

- ආගම නංවාලීම, ආගමික ස්ථාන හෝ ආගමික වත් පිළිවෙත් පවත්වාගෙන යාම සඳහා ආධාර ලබා දීම.

- සංස්කෘතික සහ ආගමික ක්ෂේත්‍රයන්ගෙන් ජාතියට සේවය කර ඇති අය සඳහා ප්‍රදානයන් පිරිනැමීම.

- කලාකරුවන්ට, ලේඛකයන්ට, චිත්‍ර ශිල්පීන්ට, සංගීතඥයන්ට, මූර්ති ශිල්පීන්ට සහ සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය කිරීමෙහිලා නිරත වෙනත් තැනැත්තන්ට ආධාර සැලසීම.

- මණ්ඩලයේ මතය අනුව මහජනයාට ප්‍රතිලාභයක් හෝ යහපතක් සැලසෙන වෙනත් යම් ආගමික හෝ සංස්කෘතික කාර්යයන්ට ආධාර ලබා දීම.

# අරමුණු

- පුරාවිද්‍යාත්මක ගවේෂණ, පර්යේෂණ, කැණීම් හා සංරක්ෂණ සිදු කිරීම.
- ස්පර්ශීය හා අස්පර්ශීය සංස්කෘතික උරුමයන් පර්යේෂණය, ආරක්ෂණය, සංරක්ෂණය සහ ප්‍රවර්ධනය කිරීම.
- ආයතනික මානව සම්පත දැනුම, ආකල්ප සහ කුසලතා වලින් පරිපූර්ණ තෘප්තිමත් පිරිසක් බවට පත් කිරීම.
- ආයතනය සතු තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය, බෙදා හැරීම සහ ප්‍රදර්ශනය කිරීමේ මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම, ප්‍රවර්ධනය සහ පවත්වාගෙන යාම.
- සංස්කෘතික අගයයන් රකිමින් පෙර අපර දෙදිග සංචාරක ආකර්ෂණය තුළින් ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන් ප්‍රචලිත කිරීම.
- ආයතනයේ ආදායම් ඉලක්කයන් ඉදිරි වසර හතර තුළදී 30% කින් වර්ධනය කරගැනීම සහ ඒ තුළින් ආයතනික සේවාවන් වඩාත් කාර්යක්ෂම ව සහ උසස් පාරිභෝගික තෘප්තියකින් පවත්වාගෙන යාම.
- හඳුනාගත් සංස්කෘතික අගයන් සහ හර පද්ධතීන් සමාජගත කිරීම.
- බහු ආගමික සහ බහුජන සංහිඳියාවට සහ ජාතික සමගියට උරදීම.
- ජාතික ප්‍රතිපත්තීන්ට අනුව අන්තර්ජාතික සංවිධාන සහ ආයතනික සහයෝගීතාව ගොඩනැගීම.
- නූතන සමාජයට ගැළපෙන අයුරින් ආයතනයේ සේවාවන් නවීකරණය හා විවිධාංගීකරණය.

# මධ්‍යම සංස්කෘතික අරමුදලේ තිස් දෙවන වාර්ෂික වාර්තාව - 2014

## පාලක මණ්ඩලය

### 2014 වර්ෂයට අදාළ මධ්‍යම සංස්කෘතික අරමුදලේ පාලක මණ්ඩලය

පාලක මණ්ඩලයේ සභාපති
අග්‍රාමාත්‍ය හා බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා
ගරු දි.මු. ජයරත්න මැතිතුමා

ගරු ටී.බී. ඒකනායක මැතිතුමා
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා

ගරු ගීතාංජන ගුණවර්ධන මැතිතුමා
නියෝජ්‍ය මුදල් අමාත්‍යතුමා

ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා
ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා

ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා
අධ්‍යාපන අමාත්‍යතුමා

ආචාර්ය ජගත් බාලසූරිය මැතිතුමා
ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමා

එස්. අමරසේකර මැතිතුමා
අග්‍රාමාත්‍ය ලේකම්

වසන්ත ඒකනායක මැතිතුමා
ලේකම්
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

ආචාර්ය සෙනරත් දිසානායක මැතිතුමා
පුරාවිද්‍යාඥ අධ්‍යක්ෂ ජනරාල්

ඩබ්. ඒ. රණවීර මහතා
ක්‍රියාකාරී අධ්‍යක්ෂ
මධ්‍යම සංස්කෘතික අරමුදල

**පරීක්ෂක නිලධාරීන්**

එන්. ගොඩකන්ද මහත්මිය
අධ්‍යක්ෂ ජනරාල්
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව

ජී.ඩී.සී. ඒකනායක මෙනවිය
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අයවැය දෙපාර්තමේන්තුව

මධ්‍යම සංස්කෘතික අරමුදලේ පාලක මණ්ඩල හා රැස්වීම් කාර්යමණ්ඩල ප්‍රතිපත්ති සහ ආයතන කමිටු රැස්වීම් 2014 වර්ෂය තුළ දී ද පවත්වන ලද අතර, මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්යයන්ට අදාළ ප්‍රතිපත්තිමය තීරණ හා අවශ්‍ය මාර්ගෝපදේශයන් පාලක මණ්ඩලය විසින් තීරණය කර එකී උපදෙස් හා නියමයන්ට අනුව අදාළ කාර්යයන් ක්‍රියාත්මක කර ඇත.

# මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්යමණ්ඩලය

1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත පරිදි ස්ථාපිත කර ඇති මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධාරී වශයෙන් සංස්කෘතික කටයුතු විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා කටයුතු කරයි. ආයතන ප්‍රධානියා වශයෙන් අධ්‍යක්ෂ ජනරාල් කටයුතු කරනු ලබන අතර, මධ්‍යම සංස්කෘතික අරමුදලේ සමස්ත කාර්යභාරය සංවර්ධන, පාලන සහ මුදල් වශයෙන් විෂයභාර අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගේ මෙහෙයවීමෙන් ප්‍රධාන අංශ තුනක් යටතේ සිදුකරගෙන යනු ලබයි.

මෙම කාර්යභාරය ඉටුකරගෙන යාම සඳහා පහත සඳහන් කාර්යමණ්ඩලය මෙම වසර තුළ දී සේවයේ යොදවා ගන්නා ලදී.

| | |
|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිලධාරීන් | 01 |
| තෘතියික කළමනාකරණ මට්ටමේ නිලධාරීන් | 21 |
| ද්විතියික නිලධාරීන් | 335 |
| ප්‍රාථමික නිලධාරීන් | 1475 |
| | 1832 |

# ආයතනයේ සංවිධාන සටහන



## සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

ගරු ටී.බී. ඒකනායක මැතිතුමා

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා

## මධ්‍යම සංස්කෘතික අරමුදල - 2013
## ප්‍රධාන කළමනාකරණ මට්ටමේ නිලධාරීන්

**ප්‍රධාන පරිපාලන නිලධාරි**
වසන්ත ඒකනායක මහතා
ලේකම්
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

**අධ්‍යක්ෂ ජනරාල්**
ජ්‍යෙෂ්ඨ පුරාවිද්‍යාඥ මහාචාර්ය ගාමිණී අදිකාරී මහතා

**ක්‍රියාකාරී අධ්‍යක්ෂ**
ඩබ්.ඒ. රණවීර මහතා

**අධ්‍යක්ෂ (මුදල්)**
ඩබ්.පී. සරත් මහතා

**අධ්‍යක්ෂ (සංවර්ධන)**
පී.එම්.ජී. මල්දෙණිය මහත්මිය

**සහකාර අධ්‍යක්ෂ (පාලන)**
පුරාවිද්‍යාඥ ගාමිණී දොඩම්වල මහතා

# 2014 වසරේ භෞතික ප්‍රගතිය

ශ්‍රී ලංකාවේ ඇති පුරාවිද්‍යා ස්මාරක සංරක්ෂණය කර අනාගත පරපුර වෙනුවෙන් රැක ගැනීම අරමුණු කර ගනිමින් මධ්‍යම සංස්කෘතික අරමුදල පිහිටුවන ලදී. මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් ආරම්භ කොට දැනට පවත්වාගෙන යන ව්‍යාපෘති පහත දැක්වෙන අතර එයින් අභයගිරිය හා ජේතවනය ස්තූප සංරක්ෂණය දැනට අවසන් කර ඇති විශාල වියදමක් දැරූ ව්‍යාපෘති වේ.

* අභයගිරිය
* ජේතවනය
* සීගිරිය
* පොළොන්නරුව
* මහනුවර
* තිස්සමහාරාමය
* ගාල්ල
* රම්බා විහාරය
* දඹුල්ල
* වයඹ සංස්කෘතික චතුරශ්‍ර ව්‍යාපෘතිය (යාපහුව, දඹදෙණිය, පඬුවස්නුවර, කුරුණෑගල)
* රුහුණු සංස්කෘතික කලාපය

ඒ අනුව 2014 වර්ෂය සඳහා,

- කැණීම් හා පුරාවිද්‍යා පර්යේෂණ කාර්යයන් - 105
- සංරක්ෂණ වැඩබිම් - 196

වශයෙන් වැඩබිම් - 301 ක් යෝජනා වී තිබුණි.

එයින් වැඩබිම් 266 ක කාර්යයන් ආරම්භ කිරීමට හැකි වූ අතර, ඉන් ව්‍යාපෘති 48 ක වැඩ නිම කිරීමට හැකි විය (කැණීම් 22, සංරක්ෂණ 26).

මෙම වර්ෂය තුළ දී අපේක්ෂා කළ වැඩ ඒකක 239,299.03 ක ප්‍රමාණයෙන් වැඩ ඒකක 157, 340. 85 ක් අවසන් කර ඇති අතර, ඒ අනුව භෞතික ප්‍රගතිය 65.8 % කි. මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා සෘජු වියදම් වශයෙන් රුපියල් 482,616,697. 91 ක් වැය කළ අතර, එම සෘජු වියදම් වල මූල්‍යමය ප්‍රගතිය 54.9% කි.

ඒ අනුව එක් එක් ව්‍යාපෘතිවල කැණීම්, ගවේෂණ හා සංරක්ෂණ කාර්යයන්ට අදාළ සංක්ෂිප්ත විස්තර පහතින් දක්වා ඇත.

# ජේතවන ව්‍යාපෘතිය

## කැණීම් අංශය

මෙම වසරේ දී ජේතවන ආරාම සංකීර්ණයට අයත් ගොඩනැගිල්ලක් වූ JMMC 2014 කැණීම, බෝධිඝරය අගල් කැණීම හා ජේතවන මහින්ද පිරිවෙන කැණීම ද මල්වතු ජනාවාස ගවේෂණය යන කාර්යයන් ඉටු කරන ලදී.

එසේම 2013 වසරේ සහ 2014 වසරේ කැණීම් වලින් සොයා ගන්නා ලද පුරාවස්තු වර්ගීකරණය හා විශ්ලේෂණය, පුරාවිද්‍යා පර්යේෂණ වාර්තා සකස් කිරීම හා ප්‍රවර්ධන ක්‍රියාකාරකම් කිහිපයක් ද මෙම වසර තුළ සිදු කළ හැකි විය.

ඒ අනුව සුවිශේෂී වැසිකිලි හා කැසිකිලි පද්ධතියක ඉදිකිරීම් සාධක මතුකර ගැනීමේ අරමුණින් ක්‍රියාත්මක කළ ජේතවන මහින්ද පිරිවෙන කැණීම තුළින් ගොඩනැගිල්ල හරහා භූගත ව විහිදී ඇති මැටි නල පද්ධතියක සාධක මතුකර ගැනීමට හැකි විය.

ජේතවන භූමියේ සීමාවන් හඳුනා ගැනීම සහ අනාගත කැණීම් කටයුතු සඳහා පූර්ව පසුතලයක් සකසා ගැනීමේ අරමුණින් මල්වතු ජනාවාස ගවේෂණය සිදු කරන ලදී.

එසේම වෙස්සගිරිය පුරාවිද්‍යා ප්‍රදේශය වාර්තාකරණය ද මෙම වසර තුළ සිදු කළ තවත් වැදගත් කාර්යයකි. එහි පබ්බතාරාමයේ පිහිටි සියලු ගොඩනැගිලිවල වාර්තාකරණ කටයුතු සිදු කිරීමට හැකි වූ අතර ඉන් ගොඩනැගිලි නවයක් වර්ගීකරණය කර එහි විශේෂ පුරාවස්තුවල සැලසුම් ඇඳීම ද සිදු කරන ලදී.

2010 වර්ෂයට අදාළ පුරාවස්තු වාර්තා සකස් කිරීම, ජේතවන ආරාම සංකීර්ණයේ බොරදම් භාවිතය පිළිබඳව කුඩා පොත් පිංච තුනක් සකස් කිරීම, භූගෝලීය තොරතුරු පද්ධතිය හා ජේතවන පුරාවිද්‍යා භූමියේ ත්‍රිමාන විශ්ලේෂණය, ජේතවන විහාර සංකීර්ණය ආශ්‍රිත ශිලා කර්මාන්තයේ ශිල්ප ක්‍රම සහ තාක්ෂණය පිළිබඳව ග්‍රන්ථ සම්පාදනය සහ ජේතවන මාර්ගෝපදේශක ග්‍රන්ථය සම්පාදනය කිරීම යනාදිය මෙම වසර තුළ සිදු කළ තවත් වැදගත් කාර්යයන් වේ.

එසේම පුරාවස්තු වර්ගීකරණය හා විශ්ලේෂණය යටතේ පබළු, මැටි බඳුන්, පාෂාණ හා ලෝහ වර්ග අධ්‍යයනය යන කාර්යයන් සිදු විය. එසේම ප්‍රවර්ධන කාර්යයන් යටතේ දේශන හතර ක් පවත්වන ලදී.

**කැණීම් අංශයේ ප්‍රගතිය දැක්වෙන ඡායාරූප කිහිපයක් පහත දැක්වේ.**



JMMC 2014 කැණීම සිදු වන අතරතුර



ජේතවන මහින්ද පිරිවෙන කැණීමට පෙර



ජේතවන මහින්ද පිරිවෙන කැණීමෙන් පසු

# සංරක්ෂණ අංශය

අභයගිරිය සංරක්ෂණ අංශය මගින් මෙම වර්ෂයට අදාළ ව මොනර මාළිගය, ශ්‍රී මහා බෝධිප්‍රාකාර බැම්ම හා ස්තූපයේ පැරණි බදාම සංරක්ෂණය යන කාර්යයන් සිදු කරන ලදී. මීට අමතරව උද්‍යාන නඩත්තු හා විද්‍යාත්මක නඩත්තු කිහිපයක් ද සිදු කරනු ලැබීය.

ඒ අනුව පසුගිය වර්ෂයේ කැණීම් මගින් පාදාගත් මොනර මාළිගයේ සංරක්ෂණ කටයුතු මෙම වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා සිදු කරන ලදී. එසේම ශ්‍රී මහාබෝධි බැම්ම හා ජේතවන ස්තූපයේ බදාම සංරක්ෂණය ආදී කාර්යන් ද මෙම වසර තුළ සිදු කළ තවත් වැදගත් සංරක්ෂණ ව්‍යාපෘති වේ.

විද්‍යාත්මක නඩත්තු යටතේ බැමි මත කුස්තුර පිරවීම් හා නව ගඩොල් යෙදීම් ආදී කාර්යයන් සිදු කරන ලදී.

එසේම භූ දර්ශන හා උද්‍යාන නඩත්තු කටයුතු ද වසර පුරාවටම අඛණ්ඩව සිදු විය.

## සංරක්ෂණ කටයුතු වලට අදාළ ඡායාරූප



මොනර මාළිගයේ සංරක්ෂණ කටයුතු සිදු වන අතරතුර



මොනර මාළිගයේ සංරක්ෂණ කටයුතු සිදු වන අතරතුර



කුස්තුර පිරවීමේ අවස්ථාවක්



ආරාම සංකීර්ණයේ බැම්මක සංරක්ෂණ කටයුතු සිදු වන අතරතුර



ආරාම සංකීර්ණයේ බැම්මක සංරක්ෂණ කටයුතු සිදු වන අතරතුර

# අභයගිරිය ව්‍යාපෘතිය

## කැණීම් අංශය

අභයගිරිය ව්‍යාපෘතිය මගින් 2014 වර්ෂයේ දී පහත සඳහන් කැණීම් හා ගවේෂණ සිදු කරන ලදී.

- 2014 කපාරාමූල පර්යේෂණ කැණීම
- වැඩබිම් අංක 36 පිළිමගෙය කැණීම
- කුට්ටම් පොකුණ අසළ භූ දර්ශන කැණීම
- අභයගිරි ස්තූපයට උතුරු පොකුණ කැණීම
- රුවන්වැලි සෑ රෝහලෙන් උතුරු දිශාවේ පිහිටි ගඩොල් ප්‍රාකාරය කැණීම
- රුවන්වැලි සෑ රෝහලෙන් නැගෙනහිර දිශාවෙහි පිහිටි කුඩා ස්මාරක තුන කැණීම
- ථූපාරාමය හා රුවන්වැලිසෑය අතර ඇති පෙත්මග කැණීම
- ථූපාරාමය චෛත්‍ය අසළ පිහිටි අංක 59 ගොඩනැගිල්ල කැණීම
- ථූපාරාමය චෛත්‍යට නැගෙනහිර දිශාවෙන් පිහිටි 'පදලස' චෛත්‍ය ගවේෂණය

කපාරාමූලයෙහි සිදු කළ පර්යේෂණ කැණීම, එහි සංස්කෘතික අවධි අධ්‍යයනය කිරීමේ අරමුණින් සිදු කරන ලදී. අදියර දෙකක් යටතේ සිදු කළ කැණීමෙහි පළමු අදියර මෙම වර්ෂයේ දී ක්‍රියාත්මක කළ අතර ඒ මගින් පැරණි අවධින්හි තොරතුරු රැසක් අනාවරණය කර ගත හැකි විය.

අභයගිරි භූමිය මතුපිට දක්නට ලැබුණු පිළිමගෙයක සාධක සොයා ගැනීමේ අරමුණින් සිදු කළ කැණීම අංක 36 පිළිමගෙය කැණීම නමින් හඳුන්වන ලදී. අභයගිරි භූමියෙන් පිළිමගෙවල් සහිත සාධක හමු වීම දුර්ලභ කරුණක්ව තිබූ බැවින් මෙම කැණීමෙහි අරමුණු සාර්ථක විය.

අභයගිරිය ස්තූපයේ පිටත ප්‍රාකාරයට පිටතින් ඇති පොකුණ කැණීම ද මෙම වසර තුළ සිදු කළ අතර මෙහිදී පොකුණේ පැති බැම් හා එහි ඉදිකිරීම්හි සාධක හමු විය.

එසේම රුවන්වැලි සෑ රෝහලෙන් උතුරු දිශාවෙහි පිහිටි ගඩොල් ප්‍රාකාරය පාදා ගැනීමේ අරමුණින් සිදු කළ කැණීම හා එහිම නැගෙනහිර දිශාවෙහි පිහිටි කුඩා ස්මාරක තුන අනාවරණය කර ගැනීමේ අරමුණින් සිදු කළ කැණීම ද මෙම වසර තුළ සිදුවූ සුවිශේෂී කාර්යයන් වේ.

ථූපාරාමයේ සිට රුවන්වැලිසෑය දෙසට විහිදී ඇති පැරණි පෙත්මග පාදා ගැනීමේ අරමුණින් සිදු කළ කැණීමෙන් හමුවූ දත්ත අනුව, එය පුරාණයේ පිරිවෙන් දෙකක් වෙන් කරන ලද සීමා ප්‍රාකාර දෙකක් බවට අනාවරණය විය. එහිදී කැණීමෙන් හමුවූ සියලු දත්ත වාර්තා කර කැණීම නැවැත්වීමට තීරණය කරන ලදී.

ථූපාරාමයට නැගෙනහිරින් පිහිටි ‘පදලස චෛතිය’ නමින් හැඳින්වෙන සිව් බුදුවරුන්ට අයත් පූජනීය ස්මාරක සංරක්ෂණය කිරීමේ අරමුණින් සිදු කළ කැණීම ද මෙම වසරේ දී සාර්ථකව නිම කළ හැකිවිය.

‘පදලස ස්තූප’ නමින් හැඳින්වෙන ස්තූප සතරින් දෙකක් මේ වන විට කැණීම් මගින් අනාවරණය කරගෙන ඇති අතර සෙසු ස්තූප දෙකෙහි සාධක සොයා ගැනීමේ අරමුණින් පර්යේෂණ කැණීමක් සිදු කරන ලදී. එහෙත් අපේක්ෂිත ප්‍රතිඵල වෙත ළඟා විය නොහැකි වූයේ බ්‍රිතාන්‍ය යුගයේ කළ ඉදිකිරීම් මගින් එහි සාධක විනාශ වී ගොස් ඇති හෙයිනි.

මීට අමතරව උද්‍යාන නඩත්තු, පුස්තකාල සංවර්ධන, කැණීම් වාර්තා සකස් කිරීම හා ප්‍රවර්ධන කටයුතු ආදිය වසර පුරාවටම ක්‍රියාත්මක කරන ලදී.

## කැණීම් අංශයෙහි ප්‍රගතිය දැක්වෙන ඡායාරූප කිහිපයක්




කපාරාමූලයේ පර්යේෂණ කැණීමට පෙර සහ කැණීමෙන් පසු




අංක 36 පිළිමගෙය කැණීමට පෙර හා කැණීමෙන් පසු



රුවන්වැලිසෑ රෝහලෙන් නැගෙනහිර පිහිටි කුඩා ස්මාරක කැණීමට පෙර හා කැණීමෙන් පසු



අංක 59 ගොඩනැගිල්ල කැණීමෙන් පසු



ථූපාරාමය හා රුවන්වැලිසෑය අතර පිහිටි පෙත්මග කැණීම් සිදු වන අතරතුර

## සංරක්ෂණ අංශය

අභයගිරි සංරක්ෂණ ව්‍යාපෘතිය යටතේ 2014 වසර තුළ පහත සඳහන් සංරක්ෂණ, නඩත්තු හා අලුත්වැඩියා සිදු කරන ලදී.

- කුට්ටම් පොකුණ 01 හා 02 ගොඩනැගිලි සංරක්ෂණය
- ථූපාරාම හා රුවන්වැලි සෑය රෝහල සංරක්ෂණය ඉතිරිවැඩ
- අභයගිරිය කෞතුකාගාර ප්‍රවේශ දෙරටුව හා විශේෂ පුරාවස්තු සංරක්ෂණය
- රුවන්වැලිසෑය පිටත ප්‍රාකාරය සංරක්ෂණය
- අභයගිරිය විහාර ස්තූප නඩත්තු
- කෞතුකාගාරයේ අංක 13 ගොඩනැගිල්ලෙහි වහල අලුත්වැඩියාව හා ප්‍රධාන ප්‍රවේශයේ තීන්ත ආලේපනය
- රුවන්වැලිසෑය ජල කාණුව ඉදිකිරීම
- අභයගිරි කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියාව
- සංරක්ෂණ හා සැලසුම් අංශ ගොඩනැගිලි අලුත්වැඩියාව

ඒ අනුව අභයගිරිය විහාර භූමියේ පිහිටා ඇති කුට්ටම් පොකුණට බටහිර දෙසින් වන අංක 01 සහ අංක 02 නමින් හැඳින්වෙන සංඝාවාස ගොඩනැගිලි සංරක්ෂණය කිරීම සිදු විය. එසේම ථූපාරාම ස්තූපයට දකුණින් පිහිටි රෝහලක ලක්ෂණ ශේෂ වී ඇති ගොඩනැගිලි සංකීර්ණය එහි අවශේෂ සාධක වලට අනුව සංරක්ෂණය කිරීම ද සිදු විය.

එසේම අභයගිරිය විහාර භූමිය තුළ පිහිටි සංරක්ෂණය කරන ලද ස්මාරක හායනයට ලක් වී ඇති බැවින් ඒවා නැවත සකස් කිරීමේ කටයුතු ද මෙම වසරේ දී සිදු කරනු ලැබීය. එහිදී හායනකාරක ඉවත්කර නව ගඩොල් ද යොදා ගනිමින් නැවත සංරක්ෂණය කරන ලදී. මීට සමගාමීව රුවන්වැලිසෑයේ වැලි මළුවේ ජලය නිසි ලෙස ගලායෑම සඳහා ජල කාණුවක් යෙදීම ද සිදු විය.

මීට අමතරව අභයගිරිය ව්‍යාපෘති භූමියෙහි නඩත්තු, ස්මාරක සඳහා මාර්ග සකස් කිරීම හා ගොඩනැගිලි නඩත්තු ආදිය ද වසර පුරාවටම සිදු කරනු ලැබීය.

## සංරක්ෂණ අංශයේ ප්‍රගතිය දැක්වෙන ඡායාරූප කිහිපයක්





කුට්ටම් පොකුණ අංක 01 ගොඩනැගිල්ල සංරක්ෂණයට පෙර සහ සංරක්ෂණයෙන් පසු





කුට්ටම් පොකුණ අංක 02 ගොඩනැගිල්ල සංරක්ෂණයට පෙර සහ සංරක්ෂණයෙන් පසු





රුවන්වැලි සෑ රෝහල සංරක්ෂණයට පෙර සහ සංරක්ෂණයෙන් පසු

# අභයගිරිය කෞතුකාගාරය

2014 වසරේ අභයගිරිය කෞතුකාගාරය මගින් දෛනික කෞතුකවස්තු ප්‍රදර්ශනයට අමතරව විශේෂ පුරාවස්තු ප්‍රදර්ශන හා මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදී.

විශේෂ ප්‍රදර්ශන යටතේ 2014 මැයි මාසයේ දී බුද්ධ ප්‍රතිමා තේමා කරගනිමින් දියවන්නා ඔය අසළ පැවැත්වූ ප්‍රදර්ශනයේ දී අභයගිරියෙන් හමුව ඇති ලෝකඩ බුද්ධ ප්‍රතිමා ප්‍රදර්ශනයට කටයුතු කරන ලදී.

එසේම කෞතුකවස්තු ආරක්ෂාව උදෙසා කටයුතු කිරීම සහ පුරාවස්තු සංරක්ෂණය කිරීම ද වසර පුරාවටම සිදු විය. මේ යටතේ කැටයම් රහිත මුරගල සහ කල්ප වෘක්ෂය සහිත මුරගල, හෝරා තැටිය, නාගරාජ හා නාගරාජිණී මුරගල යන විශේෂ පුරාවස්තු සංරක්ෂණය කරන ලදී.

කෞතුකාගාර ගොඩනැගිල්ලෙහි පැවැත්ම තහවුරු කිරීම සඳහා වහලය ප්‍රතිසංස්කරණය හා ආරක්ෂක දොරටු නිසි පරිදි සකස් කිරීම ද සිදු කළ අතර උද්‍යාන අලංකරණ කටයුතු කෙරෙහි ද සැලකිලිමත් විය.

කෞතුකාගාරයේ වාර්ෂික ආදායම රුපියල් 653, 004. 00 කි.

# කෞතුකාගාරයේ වාර්ෂික ප්‍රගතිය






පුරාවස්තු සංරක්ෂණ අවස්ථාවක් සහ කෞතුකාගාරයේ අලංකරණ කටයුතු

# පොළොන්නරුව ව්‍යාපෘතිය

## කැණීම් අංශය

දෙමළ මහාසෑය කැණීම, කාර්තු ක්‍රමය යටතේ අදියර හතරකින් ආරම්භ වූ අතර එහි පළමු අදියර මෙම වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව මෙම කැණීම තුළින් පස් ස්ථර අධ්‍යයනය හා ස්තූපයේ නිර්මාණ තාක්ෂණය පිළිබඳව හඳුනා ගැනීමට හැකි විය.

එසේම මෙම වර්ෂයේ දී 2013 හා 2014 වර්ෂවල පවත්වන ලද ශාස්ත්‍රීය දේශන හා වාර්ෂික පුරාවිද්‍යා සම්මන්ත්‍රණවල දේශන ඇතුළත් සඟරාවක් සකස් කිරීම ද සිදු කරන ලදී.

මෙම වසරේ ද අදියර දෙකක් යටතේ ශිෂ්‍ය පුහුණු වැඩසටහන් දෙකක් ක්‍රියාත්මක කළ අතර ඒ සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ සහ කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයන අංශයේ සිසුන් සහභාගි විය.

**කැණීම් අංශයේ ප්‍රගතිය දැක්වෙන ඡායාරූප කිහිපයක්**





දෙමළ මහාසෑය පළමු අදියර කැණීමට පෙර සහ කැණීමෙන් පසු

## සංරක්ෂණ අංශය

මෙම වර්ෂයේ දී පහත දැක්වෙන සංරක්ෂණ හා නඩත්තු ආදී කාර්යයන් සිදු කරන ලදී.

- ඇතුළුනුවර නැගෙනහිර හා උතුරු ප්‍රාකාර බැම්ම සංරක්ෂණය
- පරාක්‍රමබාහු මාළිගයේ බදාම සංරක්ෂණය
- ලංකාතිලක පිළිමගේ සංරක්ෂණය
- ඇතුළු නුවර දකුණු  ප්‍රාකාර බැම්ම සංරක්ෂණය
- විද්‍යාත්මක නඩත්තු
- පෙත්මං ඉදිකිරීම
- ගොඩනැගිලි නඩත්තුව
- ගොඩනැගිලි නඩත්තුව
- සාමාන්‍ය නඩත්තු
- කිරිවෙහෙර හුණු ආලේපය

ඒ අනුව පසුගිය වසරේ සිට ක්‍රියාත්මක වූ වැඩබිමක් වන ඇතුළුනුවර නැගෙනහිර හා උතුරු ප්‍රාකාර බැම්මේ ඉතිරි වැඩ මෙම වර්ෂයේ ද සිදු කරන ලදී. මෙහිදී බැම්මේ කුස්තුර පිරවීම් සිදු කර පාදමේ දෙපස සිට ගඩොල් ස්ථාපිත කිරීම සිදු විය.

ඇතුළුනුවර පරාක්‍රමබාහු මාළිගා සංකීර්ණය ඇතුළත දැකිය හැකි පැරණි බදාම ස්ථර විවිධ හායනකාරක හේතුවෙන් කොටස් වශයෙන් පුපුරා ගොස් තිබේ. මෙය ස්ථාවර කිරීම සඳහා බන්ධන මාධ්‍යයක් යොදා ගනිමින් එම බදාම ස්ථර සංරක්ෂණය කරන ලදී.

ලංකාතිලක පිළිමගේ උතුරු බිත්තියේ දක්නට ලැබුණු හායනකාරක ඉවත් කර සුදුසු බන්ධන මාධ්‍යයක් යොදා ගනිමින් සංරක්ෂණය කළ අතර එහිදී විශාල වශයෙන් කුස්තුර පිරවීම් හා දුර්වලව තිබූ ගඩොල් ඉවත් කර නව ගඩොල් යෙදීම ද සිදු කරන ලදී.

2013 වර්ෂයේ කැණීම් මගින් මතුකරගත් දකුණු ප්‍රාකාර බැම්ම, ලැබී ඇති දත්ත පදනම් කරගෙන සංරක්ෂණය කිරීම මෙම වසරේ දී සිදු විය. එහෙත් සම්පූර්ණ බැම්ම සංරක්ෂණය කිරීම සඳහා ප්‍රමාණවත් සාධක නොමැති බැවින් තව දුරටත් කැණීම් කිරීම සඳහා යෝජනා විය.

විද්‍යාත්මක නඩත්තු යටතේ පිටත නුවර උතුරු දොරටුවේ සිට රන්කොත් වෙහෙර දක්වා මාර්ගය හා ප්‍රධාන පුරාවිද්‍යා මාර්ගය දෙපස පිහිටි ගඩොළු බැම් සහ දේවාල මෙන්ම බෝධිඝර ආදිය ද

නඩත්තු කරන ලදී. එසේම පොත්ගුල් වෙහෙර, කිරිවෙහෙර හා පරාක්‍රමබාහු මාළිගය සඳහා ඇති මාර්ග අලුත්වැඩියා කිරීම ද මීට සමගාමීව සිදු විය.

පොදු නඩත්තු කාර්යයන් යටතේ වඩු වැඩ කිරීම සඳහා කාමරයක් ඉදිකිරීම, ආරක්ෂක නිලධාරීන් සහ රියදුරන් සඳහා කුඩා කාමර දෙකක් ඉදිකිරීම හා කාර්යාලයේ රථගාල ඉදිකිරීම ආදිය ද මෙම වසරේ සිදු කළ තවත් වැදගත් කාර්යයන් කිහිපයකි.

**වර්ෂයට අදාළ සංරක්ෂණ ප්‍රගතිය දැක්වෙන ඡායාරූප කිහිපයක්**



පිටත නුවර උතුරු දොරටුවේ සිට රන්කොත් වෙහෙර දක්වා මාර්ගයේ බැමි කොටසක් සංරක්ෂණයට පෙර



පිටත නුවර උතුරු දොරටුවේ සිට රන්කොත් වෙහෙර දක්වා මාර්ගයේ බැමි කොටසක් සංරක්ෂණයෙන් පසු



කිරි වෙහෙර හුණු ආලේපයට පෙර



කිරි වෙහෙර හුණු ආලේපයෙන් පසු

# සීගිරිය ව්‍යාපෘතිය

## කැණීම් අංශය

සීගිරි භූමි සැලැස්මේ ඇතුළු දිය අගලෙහි දකුණු හා බටහිර අන්තය පූර්ණ වශයෙන් සංරක්ෂණය කර තිබුණ ද උතුරු අන්තය සංරක්ෂණය කොට නොමැත. එබැවින් පසුගිය වසරෙහි ආරම්භ කරන ලද ඇතුළු දිය අගලෙහි උතුරු දොරටුවේ සිට වාන දක්වා වූ කොටස සංරක්ෂණය කිරීම සඳහා මෙම වසරේ දී ද කැණීම් සිදු කරන ලදී. මෙම කැණීමෙන් සුවිශේෂී මැටි බඳුන් ඇතුලු පුරාවස්තු කිහිපයක් සොයා ගත හැකි විය.

එමෙන්ම සිංහපාදය බටහිර බැම්ම අසළ පුරාවිද්‍යාත්මක දත්ත සොයා ගැනීමේ අරමුණින් සිදු කළ පර්යේෂණ කැණීම ද මෙම වසර තුළ කළ තවත් සුවිශේෂී කැණීමක් වශයෙන් හඳුනාගත හැකි වේ.

සීගිරිය භූමි සැලැස්මෙහි උතුරු පිටදිය අගල සොයා ගැනීමේ අරමුණින් සිදු කළ ගවේෂණය ද මෙම වසර තුළ සිදු කළ තවත් එක් සුවිශේෂී කාර්යයකි. මෙම ගවේෂණය තුළින් ක්‍රි.පූ. පස් වන සියවසට අයත් යැයි විශ්වාස කළ හැකි සුවිශේෂී සාධක රාශියක් අනාවරණය කර ගත හැකි විය.

එසේම මෙම වර්ෂයේ දී සිදු කරන ලද කැණීම් වලින් සොයා ගන්නා ලද මැටි බඳුන් විශ්ලේෂණය, වර්ගීකරණය හා වාර්තාගත කිරීම සිදු කරන ලදී.

මීට අමතරව 2014 වර්ෂයට අදාළ ව සිදු කළ කැණීම්, සංරක්ෂණ හා අනෙකුත් අංශයන්හි සැලසුම් ඇඳීම ද වර්ෂය පුරා ක්‍රියාත්මක විය.

මෙම කටයුතු වලට සමගාමීව සීගිරිය කෞතුකාගාරයේ විශේෂ ප්‍රදර්ශන, මැදිරි සහ පුරාවස්තු දත්ත නිරන්තර නියාමනය හා දෛනික නඩත්තුව ද වර්ෂය පුරාම සිදු කෙරිණි.

**කැණීම් අංශයේ ප්‍රගතිය දැක්වෙන ඡායාරූප කිහිපයක්**





ඇතුල් දිය අගල කැණීමෙන් පසු සහ කැණීමෙන් හමුවූ විශේෂ පුරාවස්තුවක්



සිංහපාදය බටහිර බැම්ම අසළ කැණීමට ප්‍රථම භූමිය දිස්වන අයුරු



කැණීම අවසානයේ භූමිය දිස්වන අයුරු

## සංරක්ෂණ අංශය

සීගිරිය ව්‍යාපෘතිය යටතේ 2014 වර්ෂයට අදාළව පහත සඳහන් සංරක්ෂණ සිදු කරන ලදී.

- සිංහපාද බටහිර කලුගල් බැම්ම සංරක්ෂණය
- බටහිර දොරටුව පිවිසුම් මාර්ගය දෙපස ඇති වෘත්තාකාර බැම් සංරක්ෂණය
- මැද මිදුලෙහි උද්‍යාන බැම් සංරක්ෂණය
- බෝධිඝරය ආශ්‍රිත සංරක්ෂණය
- ක්ෂුද්‍ර ජල උද්‍යානයේ බැම් සංරක්ෂණය
- SW නමින් හැඳින්වෙන පොකුණ සංරක්ෂණය
- දකුණු පිවිසුම් මාර්ගයේ බටහිර දොරටුව දක්වා ඇති සහ නයිපෙන ගුහාව ආශ්‍රිතව ඇති කාණු පද්ධති නඩත්තු කිරීම
- මාලක උද්‍යානය ආසන්නයේ ඇති ගඩොල් බැම් නඩත්තු
- මොරගහමුල භූ දර්ශන නඩත්තු

විශාල වශයෙන් වල් බිහි වී තිබූ සිංහපාද බටහිර කලුගල් බැම්ම සංරක්ෂණයේ පළමු අදියරය මෙම වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද අතර ප්‍රමාණවත් මිනිස් ශ්‍රමය හා ඉදිකිරීම් ද්‍රව්‍ය නොමැති බැවින් එම කාර්යය ඉදිරි වර්ෂය සඳහා කල් දැමීමට සිදු විය.

එසේම සිංහපාද මළුව සෝදා යාම වළක්වා එහි ආරක්ෂාව තහවුරු කිරීමේ අරමුණින් මැද මිදුලෙහි උද්‍යාන බැම් සංරක්ෂණය කරන ලදී.

දකුණු පිවිසුම් මාර්ගයේ බටහිර දොරටුව දක්වා ඇති අඩි 800ක් පමණ විහිදී යන කාණු පද්ධතිය ක්‍රමවත්ව ජලය බැස යාම සඳහා සංරක්ෂණය කරන ලදී.

මැද මිදුලෙහි උද්‍යාන බැම් සංරක්ෂණය ද මෙම වසර තුළ සිදු වූ තවත් වැදගත් සංරක්ෂණයක් වන අතර එහිදී ගැලවී තිබූ පැරණි කලුගල් බැම් විධිමත් ක්‍රමවේදයක් යටතේ නැවත සකස් කරන ලදී.

එසේම විද්‍යාත්මක නඩත්තු යටතේ මාලක උද්‍යානය ආසන්නයේ ඇති ගඩොල් බැම් නඩත්තු කිරීම ද සිදු වූ අතර එහිදී මැද මිදුල, සභාශාලාව හා අංක 02 ස්වාභාවික ගල් ආරුක්කුවට ඉහළින් පිහිටි ආසන ගුහාව ආසන්නයේ ඇති ගඩොල් බැම් ආදිය නඩත්තු කරන ලදී.

නයිපෙන ගුහාවේ කටාරමෙන් ගලා එන වැසි ජලය ක්‍රමවත්ව බැස යාම සඳහා එහි ගඩොල් ඇතිරුමේ ඉදිරියෙන් ගඩොලින් කානුවක් බැඳීම සහ කුස්තුර පිරවීම සිදු කරන ලදී.

එසේම පසුගිය වසරෙහි අවසන් කාර්තුවෙහි ආරම්භ කළ මොරගහමුල උද්‍යානය සැකසීමේ හා විද්‍යාත්මක නඩත්තු කාර්යයන් මෙම වසරේ ද සිදු කළ අතර එහිදී උද්‍යානයේ පිඩලි ඇල්ලීම, පෙත් මං සඳහා බොරළු යෙදීම හා උද්‍යානයේ සුදුසු ස්ථාන සඳහා සිමෙන්ති බදාමයෙන් නිම කළ බංකු යෙදීම යන කාර්යයන් සිදු කරන ලදී.

එමෙන්ම ක්ෂුද්‍ර ජල උද්‍යානයේ ඇති SW නමින් හැඳින්වෙන පොකුණ ක්‍රමවත් අයුරින් පිරිසිදු නොකිරීම නිසා පෙඳ පාසි බැඳී තිබුණෙන් ඒවා ඉවත් කිරීම, ගැලවී ඇති බැම් ආදිය පැරණි ගඩොලු යොදා සංරක්ෂණය කිරීම හා භූගත කාණු පද්ධතිය විධිමත්ව සංරක්ෂණය කිරීම යන කාර්යයන් සිදු කරන ලදී.

**සංරක්ෂණ අංශයේ ප්‍රගතිය දැක්වෙන ඡායාරූප කිහිපයක්**





SW නමින් හැඳින්වෙන පොකුණ සංරක්ෂණයට පෙර හා සංරක්ෂණයෙන් පසු



එම



උද්‍යාන බැමි සංරක්ෂණයට පෙර



උද්‍යාන බැමි සංරක්ෂණයෙන් පසු

# දඹුල්ල ව්‍යාපෘතිය

## සංරක්ෂණ අංශය

දඹුල්ල ව්‍යාපෘතිය මගින් සිදු කළ වාස්තු විද්‍යාත්මක සංරක්ෂණ කාර්යයන් යටතේ වලගම්බා පිරිවෙනේ මැද පන්සල ආවාසගෙය හා බෝධිමාලාකාරාම විහාරගෙය සංරක්‍ෂණය ආදී කාර්යයන් වැදගත් වේ.

එසේම බිතු සිතුවම් සංරක්ෂණය යටතේ වනසිංහාරාම රජමහා විහාරයේ බිතු සිතුවම් හා අඹරුලිය ටැම්පිට විහාරයේ බිතු සිතුවම් සංරක්ෂණය කරන ලදී.

මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි වලගම්බා පිරිවෙන මැද පන්සල ආවාසගෙයි සංරක්ෂණ කටයුතු පසුගිය වර්ෂයේ දී ආරම්භ වුව ද එහි සියලු කාර්යයන් අවසන් කළ හැකි වූයේ මෙම වර්ෂයේ දී ය. ඒ අනුව මෙහි වහලය ඇතුළු දිරාගිය කොටස් විශාල ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කරන ලදී.

එමෙන්ම බෝධිමාලාකාරාම විහාරගෙයි විදුලි පද්ධතිය සකස් කිරීම සහ බිත්ති හා ගෙබිම කපරාරු කිරීමේ කටයුතු මෙම වර්ෂය සඳහා යෝජිත වුවත් ද්‍රව්‍ය රැස් කිරීම පමණක් සිදු කළ අතර සංරක්ෂණ කාර්යය 2015 වර්ෂයට කල් දමන ලදී.

මීට අමතරව අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහවැලි H කලාපයේ පිහිටා ඇති වනසිංහාරාම රජමහා විහාරය හා එහි බිතුසිතුවම් සංරක්ෂණය කිරීම ද මෙම වසර තුළ දඹුල්ල ව්‍යාපෘතිය මගින් ඉටු කළ තවත් එක් වැදගත් සංරක්ෂණ කාර්යයකි.

කැකිරාව ප්‍රදේශයේ පිහිටි අඹරුලිය ටැම්පිට විහාරයේ බිතු සිතුවම් සංරක්ෂණය ද මෙම වසරේ දී සිදු කළ අතර බිතු සිතුවම් ප්‍රතිසංස්කරණය කිරීම හා එහි බදාම අංශු අතර බන්ධන ශක්තිමත් වීම සඳහා ප්‍රතිකර්ම යෙදීම ද සිදු කරන ලදී.

මෙම කාලය තුළදීම බිතුසිතුවම් කෞතුකාගාරයේ අභ්‍යන්තර හා බාහිර නඩත්තු කිහිපයක් සිදු කළ අතර මෙහිදී විදුලි පරිපථ පද්ධතිය නිරීක්‍ෂණය හා අලුත්වැඩියාව ආදිය සිදු කරන ලදී. එසේම සංචාරක ආකර්ෂණය වැඩි කිරීම සඳහා කෞතුකාගාරයෙහි පිටත භූ දර්ශනය ක්‍රමවත් කිරීම හා උද්‍යාන නඩත්තුව යන කාර්යයන් ද වර්ෂය පුරාවටම සිදු විය.

ඉහත කටයුතු සිදු කෙරෙන අතරතුර කෞතුකාගාර කාර්යමණ්ඩලය විසින් අධ්‍යාපන ප්‍රවර්ධන වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කළ අතර පාසැල් චිත්‍ර තරඟ, අධ්‍යාපන සමුළු, බුද්ධ ශ්‍රාවක විශ්වවිද්‍යාලයේ භික්‍ෂූන් වහන්සේ පනස් නමක් සහභාගී කරගනිමින් දේශන මාලාවක් හා ප්‍රයෝගික පුහුණු වැඩමුළුවක් පැවැත්වීම ආදිය ඉන් කිහිපයකි.

මෙම කාර්යයන්ට සමගාමීවම ශ්‍රී ලංකාවේ ඉතා වැදගත් සිතුවම් එකතුවක් සහිත දඹුල්ල සිතුවම් කෞතුකාගාරයේ කැන්වස් චිත්‍ර ගබඩාව දෛනිකව නඩත්තු කිරීම හා පැරණි සිතුවම් සංරක්ෂණය කිරීම ද වසර පුරාවට සිදු කෙරිණි.

## සංරක්ෂණ අංශයේ ප්‍රගතිය දැක්වෙන ඡායාරූප කිහිපයක්




වනසිංහාරාම රජමහා විහාරය සංරක්ෂණයට පෙර සහ සංරක්ෂණයෙන් පසු




වනසිංහාරාම රජමහා විහාරයේ සිතුවම් සංරක්ෂණයට පෙර සහ
සංරක්ෂණයෙන් පසු



කෞතුකාගාර ගබඩාවේ ඇති සිතුවමක් සංරක්ෂණය කරන අතරතුර

# මහනුවර ව්‍යාපෘතිය

## කැණීම් අංශය

මෙම වසරේ දී මූලික වශයෙන් බඹරගල හා ගෝනවත්ත යන පුරාවිද්‍යා ස්ථාන ගවේෂණය කරන ලදී. ඒ අනුව පසුගිය වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද බඹරගල පුරාවිද්‍යා ස්ථානය විධිමත් ලෙස මෙම වසරේ ද ගවේෂණය කරන ලදී. මෙහිදී ප්‍රාග් ඓතිහාසික ශිලා මෙවලම් සහිත ස්ථාන කීපයක් හඳුනා ගැනීමට හැකි විය.

එසේම ගෝනවත්ත පුරාවිද්‍යා ස්ථානය ගවේෂණයේ දී බ්‍රාහ්මීය අක්ෂර සහිත සෙල් ලිපියක් ඇසුරු කර ගනිමින් ඒ අවට ප්‍රදේශය පුරා විහිදී ඇති පුරාවිද්‍යා සාධක හා මානව විද්‍යාත්මක අධ්‍යයන කටයුතු කළ අතර මෙම ප්‍රදේශය ආශ්‍රිතව පිහිටි කුණ්ඩසාල නරේන්ද්‍රසිංහ රජමහා විහාරයට අයත් කෞතුකාගාරය සතු පුස්කොළ පොත් හා විවිධ මාදිලියේ පුරාවස්තූන් අධ්‍යයනයට ලක්කොට සැලසුම් පිළියෙල කිරීම හා දත්ත රැස් කිරීම ද මේ හා සමගාමීව සිදු කරන ලදී.

කැණීම් හා සංරක්ෂණ වාර්තා සකස් කිරීම, පුරාවස්තු විශ්ලේෂණය, අධ්‍යාපන හා ප්‍රචාරණ කටයුතු, පුස්තකාල ප්‍රවර්ධන කටයුතු, පුරාවස්තු අනුරූ හා ප්‍රකාශන අලෙවිය සහ මැදවාසල බිසෝ කෞතුකාගාරය ප්‍රතිසංස්කරණය කිරීම් ආදිය ද වර්ෂය පුරාවටම සිදු කරන ලදී.

**කැණීම් හා ගවේෂණ අංශයේ ප්‍රගතිය දැක්වෙන ඡායාරූප කිහිපයක්**





බඹරගල පුරාවිද්‍යා ගවේෂණය අතරතුර

## සංරක්ෂණ අංශය

මෙම වර්ෂයට අදාළව පහත දැක්වෙන සංරක්ෂණ කාර්යයන් සිදු කරන ලදී.

- රාම විහාරයේ (ඉතිරි වැඩ)
- පිලවල ගල්ඒදණ්ඩ රජමහා විහාරය (ඉතිරි වැඩ)
- වතුපොල පුරාණ විහාරය (ඉතිරි වැඩ)
- දෙගල්දොරුව හා ගඩලාදෙණිය රජමහා විහාර පොහොයගෙය
- අස්ගිරි විහාර පිරිවෙණ
- පොතුහැර මඩුගල්ල විහාරය
- අස්ගිරිය මැද පන්සල හා පැරණි ළිඳ
- වතුපොල පුරාණ විහාර ආවාසගෙය
- අස්ගිරි ගෙඩිගේ විහාර වාහල්කඩ
- ලෝක උරුම ඒකකය
- ලෝක උරුම නගර ස්මාරක සංරක්ෂණය
- ගිරාගම වලව්ව
- ගැලවීමේ හමුදා ගොඩනැගිල්ල
- සාමාන්‍ය නඩත්තු

රාම විහාරයේ 2013 වර්ෂයේ ආරම්භ කළ වැඩ වල ඉතිරි වූ ප්‍රමාණය මෙම වසරේ දී නිම කිරීමට හැකි විය. එසේම පසුගිය වසරේ ආරම්භ කරන ලද පිලවල ගල්ඒදණ්ඩ රජමහා විහාරයේ පිළිම ගෙයි හා ධර්මශාලාවේ සංරක්ෂණ කටයුතු මෙම වසරේ දී අවසන් කරන ලදී.

එමෙන්ම වතුපොල පුරාණ විහාරයේ බණමඩුවෙහි පසුගිය වසරේ ආරම්භ කළ සංරක්ෂණ කාර්යය මෙම වසරේ ද සිදු කළ අතර එහි බොරදම් හා පේකඩ කැටයම් නැවත ඉස්මතු කර සංරක්ෂණය කරන ලදී.

එසේම දෙගල්දොරුව පුරාණ රජමහා විහාරයේ ඉපැරැණි කුඩා පෝයගෙය සහ ගඩලාදෙනිය විහාරයේ පොහොයගෙය සම්පූර්ණයෙන් විනාශයට පත් ව තිබූ බැවින් පෙර ස්වභාවයෙන් ම සංරක්ෂණය කිරීම සිදු විය.

අස්ගිරි විහාර සංකීර්ණයට අයත් පිරිවෙන් ගොඩනැගිල්ල සහ පොතුහර මඩුගල්ල පන්සලෙහි උළු සෙවිලි කිරීම ද මෙම වසර තුළ සිදු කළ අතර, එම කාර්යය මධ්‍යම සංස්කෘතික අරමුදල හා නාවික හමුදාව යන ආයතන ද්විත්වයෙහි සාමුහික ක්‍රියාදාමයක් වශයෙන් සිදු කරනු ලැබීය.

එසේම අස්ගිරි විහාර සංකීර්ණයේ පිහිටි භික්ෂූන් වහන්සේලා විසින් භාවිත කරන ලද පුරාණ ළිඳ ඉතා අබලන් තත්වයක පැවති බැවින් එය ප්‍රතිසංස්කරණය කිරීම සිදු කරන ලදී. මේ හා සමගාමීව අස්ගිරි මැද පන්සලෙහි පැරණි ආවාසගෙයි වහල ප්‍රතිසංස්කරණය කිරීම ද මෙම වසරේ අවසාන කාර්තුවේ දී ආරම්භ කළ අතර එම කාර්යය අවසන් කිරීම සඳහා ප්‍රමාණවත් කාලය නොතිබුණෙන් ඉතිරි වැඩ 2015 වර්ෂයට කල් දමන ලදී.

බිතුසිතුවම් සංරක්ෂණ අංශය යටතේ වළල රජමහා විහාරය, තිත්තපජ්ජල රජමහා විහාරය, දෙඹරලෑව රජමහා විහාරය හා නියංගම්පාය රජමහා විහාරය යන විහාරස්ථානයන්හි බිතුසිතුවම් සංරක්ෂණය, නියාමනය, වාර්තාකරණය හා නඩත්තුව යන කාර්යයන් සිදු කරන ලදී.

වෙනත් නඩත්තු කාර්යයන් යටතේ මහනුවර නගරයේ හා මධ්‍යම පළාත තුළ පිහිටි ස්මාරක නිරීක්ෂණය කර තත්ත්ව වාර්තාවන් සැකසීම සිදු කළ අතර බෝතොට රජමහා විහාරය, හතරලියද්ද සංස්කෘතික මධ්‍යස්ථානය හා ශාන්ත පාවුළු දේවස්ථානය ආදිය ඉන් කිහිපයකි. මෙහිදී මහනුවර ලෝක උරුම කමිටුව හා අනු කමිටුව නියෝජනය කරමින් ගොඩනැගිලි ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කළ අතර ගොඩනැගිලි හිමිකරුවන් හා නිර්මාණකරුවන් වෙත නිසි උපදෙස් ලබා දීම ද සිදු විය.

එසේම ගිරාගම වලව්ව, ගැලවීමේ හමුදා ගොඩනැගිල්ල, වතුපොළ පුරාණ විහාර ආවාසගෙය ආදිය 2015 වර්ෂයේ දී සංරක්ෂණය කිරීමට යෝජිත සැලැසුම් සකස් කිරීම ද මෙම වසර තුළ සිදු කරන ලදී.

ව්‍යාපෘතියේ පහසුකම් වැඩි දියුණු කිරීම යටතේ ජාත්‍යන්තර තොරතුරු මධ්‍යස්ථානය අලුත්වැඩියා කිරීම, කාර්යාල ගොඩනැගිල්ලෙහි උද්‍යානය හා ඒ අවට නඩත්තු කර දර්ශනීයව පවත්වාගෙන යාමට මෙම වසර තුළදී ද කටයුතු කරන ලදී.

**සංරක්ෂණ අංශයේ ප්‍රගතිය දැක්වෙන ඡායාරූප කිහිපයක්**





පිලවල ගල්ඒදණ්ඩ රජමහා විහාරය සංරක්ෂණයට පෙර සහ සංරක්ෂණයෙන් පසු



වතුපොල පුරාණ විහාරය බණමඩුව සංරක්ෂණයට පෙර සහ සංරක්ෂණයෙන් පසු



තිත්තපජ්ජල රජමහා විහාරයේ සිතුවම් සංරක්ෂණයට පෙර සහ සංරක්ෂණයෙන් පසු



දෙඹරලැව රජමහා විහාරයේ සිතුවම් සංරක්ෂණයට පෙර සහ සංරක්ෂණයෙන් පසු

# රම්බා විහාර ව්‍යාපෘතිය

## කැණීම් අංශය

මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කළ කැණීම් අතර බිම් සැලැස්මේ අංක 23/11 ලෙස නම් කර ඇති ගොඩනැගිල්ල කැණීම වැදගත් වේ. මෙහි කටයුතු පසුගිය වසරේ ආරම්භ කළ අතර එහි ඉතිරි වැඩ මෙම වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව මෙය ස්තූප ගොඩනැගිල්ලක් බවට තහවුරු කර ගන්නා ලද අතර කැණීම් වලදී පිඟන්කටු කැබලි, වළං කැබලි, පබළු හා වීදුරු වළලු හමු විය.

එසේම පුරාවිද්‍යාත්මක දත්ත අනාවරණය කර ගැනීමේ අරමුණින් පෞද්ගලික ඉඩමක පර්යේෂණ කැණීමක් සිදු කිරීම ද මෙම වසර තුළ සිදු කළ තවත් එක් සුවිශේෂී කාර්යයකි. මෙහිදී පර්යේෂණ වළවල් 19 ක කැණීම් කටයුතු සිදු කර ඇත.

මැටි බඳුන් හා විශේෂිත පුරාවස්තු විශ්ලේෂණ ආදී කාර්යයන් ද වසර පුරා සිදු කරන ලදී.

## සංරක්ෂණ අංශය

2013 වර්ෂයේ සැප්තැම්බර මස ආරම්භ කළ 10/1 ගොඩනැගිල්ලෙහි සංරක්ෂණ කටයුතු මෙම වසරේ දී සිදු කර අවසන් කළ හැකි විය.

එසේම අංක 15 ගොඩනැගිලි සංකීර්ණයේ පිටපවුර සංරක්ෂණය ද මෙම වසරේ දී සිදු කළ අතර එහි සියලු කටයුතු අවසන් කරන ලදී. එහිම මුර කුටිය ඉදි කිරීමේ කටයුතු ද මෙම වසරේ දී අවසන් කළ හැකි විය.

මීට අමතරව රුහුණු කවය යටතේ පසුගිය වසරේ ආරම්භ කරන ලද සිත්තම්ගල්ලෙන විහාරයේ ධර්මශාලාවේ සහ ගලගම ශෛලාරාමයේ විහාර මන්දිරයේ අලුත්වැඩියා කටයුතු ද මෙම වසර තුළ අවසන් කරන ලදී.

විද්‍යාත්මක නඩත්තු යටතේ සංරක්ෂිත ස්මාරකවල අත්‍යවශ්‍ය නඩත්තු කාර්යයන් කිහිපයක් මෙම වසරේ ද සිදු කළ අතර, උද්‍යාන, බැමි හා හුණු බදාම නඩත්තු, රසායනාගාරය හා පැරණි බදාම සංරක්ෂණය සහ නියාමනය යන කාර්යයන් ඒ අතර වේ.

# තිස්සමහාරාම ව්‍යාපෘතිය

## කැණීම් අංශය

2010 වර්ෂයේ දී ආරම්භ කළ අකුරුගොඩ පුරාවිද්‍යා පර්යේෂණ කැණීමට අදාළ කටයුතු මෙම වර්ෂයේ දී අවසන් කළ හැකි විය. මීටර 5.5 ක් දක්වා මවු පාෂාණය තෙක් ගැඹුරට සිදු කරන ලද මෙම කැණීම මගින් සියවස් ගණනාවක සිට මානව ජනාවාස තිබූ බවට සාධක අනාවරණය කර ගැනීමට හැකිවූ අතර කාසි, කළු රතු මැටි බඳුන් කැබලි, පබළු, අස්ථි හා ආභරණ කොටස් මෙන්ම වීදුරු  හා පාෂාණ නිර්මාණ කිහිපයක් ද සොයා ගත හැකි විය.

එසේම සංරක්ෂණ අවශ්‍යතාවය මත අංක 08 පිළිමගෙය කැණීම ද මෙම වසර තුළ සිදු කරනු ලැබීය.

2014 වර්ෂයේ දී පැවති නියඟය හේතුවෙන් තිස්සමහාරාමය ආශ්‍රිතව ඇති සිඳී ගිය වැව් පිළිබඳව ගවේෂණයක් සිදු කිරීම ද මෙම වසර තුළ ඉටු කළ තවත් වැදගත් කාර්යයකි.

එමෙන්ම 2014 වර්ෂයේ සිදු කළ කැණීම් පිළිබඳ වාර්තා සකස් කිරීම ද මැටි බඳුන් හා පුරාවස්තු වාර්තා කිරීම, විශ්ලේෂණය හා සැලසුම් ඇඳීම ආදිය ද වර්ෂය පුරාවටම ක්‍රියාත්මක විය.

මීට අමතරව රසායනාගාර, කෞතුකාගාර නඩත්තු හා ප්‍රචාරක කටයුතු ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. එසේම පාසල් හා විශ්වවිද්‍යාල සිසුන් සඳහා වාර්ෂිකව පවත්වනු ලබන දේශන හා සම්මන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම, අත් පත්‍රිකා මුද්‍රණය හා වෙබ් අඩවියක් නිර්මාණය කිරීම ආදිය ද මෙම වසර තුළ සිදු කරන ලදී.

## කැණීම් අංශයේ ප්‍රගතිය දැක්වෙන ඡායාරූප කිහිපයක් පහත දැක්වේ.



අකුරුගොඩ කැණීමෙහි වර්ෂ අවසානයේ කැණීම් ප්‍රගතිය දැක්වෙන ඡායාරූපයක්



පාසල් ළමුන් සඳහා සඳහා පැවැත්වූ දේශනයක අවස්ථාවක්

## සංරක්ෂණ අංශය

තිස්සමහාරාම ව්‍යාපෘතිය මගින් 2013 වර්ෂයේ දී ආරම්භ කළ මෙහෙණි ආරාමයේ මුළුතැන්ගෙය සංරක්ෂණය කිරීමේ කටයුතු මෙම වසර තුළ අවසන් කළ හැකි විය.

සාමාන්‍ය නඩත්තු යටතේ පහත ස්ථාන හා ස්මාරක දෛනිකව නඩත්තු කරන ලදී.

- සඳගිරි සතූපය හා පිට පවුර
- සඳගිරි ස්තූපයේ ඉහළ මළුව
- සඳගිරි ස්තූපයේ පහළ මළුව
- සඳගිරි ස්තූපයේ ඉදිරිපස රථගාල සහ මාර්ග
- පිළිමගෙය, බෝධිඝරය හා ජන්තාඝරය සහ ඒ අවට ප්‍රදේශ නඩත්තු
- නගර මධ්‍යයේ ඇති ගොඩනැගිල්ල, සංරක්ෂිත ස්මාරකය සහ  අවට ප්‍රදේශයේ නඩත්තු

එසේම විද්‍යාත්මක නඩත්තු යටතේ පහත සඳහන් ස්ථාන නඩත්තු කිරීම සිදු විය.

- සඳගිරිය ස්තූපය සහ පිට පවුර
- බෝධිඝරය සංරක්ෂිත ගොඩනැගිල්ල
- ජන්තාඝරය සංරක්ෂිත ගොඩනැගිල්ල
- පිළිමගෙය සංරක්ෂිත ගොඩනැගිල්ල
- නගර මධ්‍යයේ පිහිටි සංරක්ෂිත ගොඩනැගිල්ල

2014 වන තෙක් අලුත්වැඩියා කර නොමැති කතරගම කෞතුකාගාර ගොඩනැගිල්ලේ ඇතුළත හා පිටත බිත්ති අලුත්වැඩියා කර නඩත්තු කිරීම ද මෙම වසර තුළ සිදු කරන ලදී.

මීට අමතරව තිස්සමහාරාම පිළිමගෙයි බුද්ධ ප්‍රතිමාව ස්ථාපිත කිරීම, රුහුණු ප්‍රවර්ධන කලාපයේ සමරු ඵලකය ඉදිකිරීම, කතරගම සංචාරක බංගලාව නඩත්තු කිරීම, ගොම්බද්දල ශෛලාරාමයේ භූ දර්ශන සැකසීම හා සිතුල්පව්ව විහාරයේ කෞතුකාගාරය ඉදිකිරීම යනාදී කාර්යයන් ද මෙම ව්‍යාපෘතිය මගින් ඉටු කළ තවත් වැදගත් කාර්යයන් කිහිපයකි.

එසේම සංරක්ෂණ වාර්තා සකස් කිරීම යටතේ 2013 වර්ෂයේ සංරක්ෂණ වාර්තාව සකස් කර අවසන් කිරීම හා 2012 වර්ෂයේ සංරක්ෂණ වාර්තාව සඳහා කරුණු ගොණු කිරීම ද සිදු කරන ලදී.

## ගාල්ල සමුද්‍ර පුරාවිද්‍යා ව්‍යාපෘතිය
## කැණීම් අංශය

සමුද්‍ර පුරාවිද්‍යා ඒකකය මගින් මෙම වර්ෂයට අදාළව පහත දැක්වෙන සංරක්ෂණ හා නඩත්තු කාර්යයන් සිදු කරන ලදී.

- කෞතුක වස්තු දත්ත වාර්තා සකස් කිරීම සඳහා මිනුම් ලබා ගැනීම
- මැදිරි වල ප්‍රදර්ශිත කෞතුක වස්තු වල නව දත්ත වාර්තා සකස් කිරීම
- භාණ්ඩ ප්‍රදර්ශන අල්මාරි ඇතුළත පිරිසිදු කිරීම (මාසිකව)
- කෞතුකාගාරයේ ඇති භාණ්ඩ වල හායනකාරක හඳුනා ගැනීම සහ එම භාණ්ඩ නඩත්තු හා සංරක්‍ෂණ අංශ වෙත යොමු කිරීම
- බෝතල් ප්‍රදර්ශන ටැංකිය සිලිකන් ගම් යොදා ප්‍රතිසංස්කරණය කිරීම හා පිරිසිදු කර නැවත ජලය යෙදීම
- විවෘත අංගනයෙහි තැන්පත් කර ඇති කෞතුක වස්තු, නරඹන්නන් විසින් ඇල්ලීම වැලැක්වීම සඳහා ස්ථාවර පුවරු යෙදීම

එසේම සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය මගින් නරඹන්නන් සඳහා දේශන, වැඩමුළු හා ප්‍රදර්ශන පැවැත්වීම් ද දැනුවත් කිරීම් ආදිය ද වර්ෂය පුරා ක්‍රියාත්මක කරන ලදී. ඒ අතර ගාල්ල පොල්පාගොඩ මහා විද්‍යාලයේ දී පවත්වන ලද "සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය" පිළිබඳව දැනුවත් කිරීමේ දේශනය, ගාල්ල ඕපාත මහාවිද්‍යාලයේ දී පවත්වන ලද "ශ්‍රී ලංකාවේ සංස්කෘතික පරිවර්තනයකට හේතු වූ විදේශීය බලපෑම" පිළිබඳ දේශනය හා අම්බලන්ගොඩ වේනමුල්ල භික්‍ෂු අභ්‍යාස විද්‍යාලයීය සිසුන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය ආදිය ප්‍රධාන වේ.

එසේම පාසල් සිසුන් සම්බන්ධ කර ගනිමින් කථික හා චිත්‍ර තරග ආදිය ද පවත්වන ලදී.

මීට අමතරව පහත සඳහන් කාර්යයන් ද මෙම වර්ෂය තුළ ඉටු කළ තවත් වැදගත් කාර්යයන් කිහිපයකි.

- දියවන්නා වෙසක් කලාපයේ තාවකාලික බුදු පිළිම ප්‍රදර්ශනය සඳහා සහයෝගය ලබාදීම
- දෙස් විදෙස් රාජ්‍ය නායකයින් පිළිගැනීම හා මාර්ගෝපදේශනය ලබාදීම
- විශ්වවිද්‍යාල සිසුන් පුහුණු කිරීම සහ විශේෂ දේශන පැවැත්වීම
- ආයතනික සාමාජිකයින් සහ පර්යේෂකයන් සඳහා පොත් මිලට ගැනීම සහ පුස්තකාලයක් පිහිටුවීම

- අත් පත්‍රිකා නිර්මාණය
- සංචාරක මාර්ගෝපදේශන ග්‍රන්ථ සඳහා දැන්වීම් නිර්මාණය
- කෞතුකාගාරය පිළිබඳ විස්තර ඇතුළත් සූචියක් සහ ප්‍රදර්ශන පුවරු නිර්මාණය
- සංචාරක දිනය වෙනුවෙන් ඡායා රූ පතක් නිර්මාණය

එසේම කෞතුකාගාරය නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගේ තෘප්තිමත් භාවය සහ යටිතල පහසුකම් සම්බන්ධයෙන් ඔවුන් දරන ආකල්පයන් පිළිබඳව අධ්‍යයනය කිරීමේ අරමුණින් මෙම වර්ෂයේ ද සංචාරක සමීක්ෂණයක් ක්‍රියාත්මක කරන ලදී.

## කැණීම් හා ගවේෂණ වලට අදාළ ඡායාරූප කිහිපයක්




පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන්



අංගනයේ ඇති පුරාවස්තු සඳහා සංචාරකයින් දැනුවත් කිරීමේ පුවරු සවි කිරීම



විදේශීය සංචාරකයින්ගේ පැමිණීම



සංචාරකයින් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක්

# වයඹ සංස්කෘතික චතුරශ්‍රය

## යාපහුව වැඩබිම

### කැණීම් අංශය

යාපහුව ව්‍යාපෘතිය මගින් මෙම වර්ෂයට අදාළව පහත සඳහන් කැණීම් හා ගවේෂණ කාර්යයන් ඉටු කරන ලදී.

1. ඩී-13 , ඩී-36 හා ඩී-37 ගුහා කැණීම
2. ඇතුළත හා පිටත නගරයේ පර්යේෂණ කැණීම
3. පිට දිය අගල කැණීම
4. ගුරුගොඩ මෙගලිතික සුසානය කැණීම
5. නාගොල්ල පධානඝර සංකීර්ණය කැණීම
6. ගුරුගොඩ ස්තූපය කැණීම
7. පොල්පිතිගම මෙගලිතික සුසාන කැණීම
8. ගුරුගොඩ සුසාන භූමිය පිහිටි මී ඔය ආශ්‍රිත ප්‍රදේශය ගවේෂණය

ඒ අනුව පසුගිය වසරේ ආරම්භ කළ ඩී-13 ගුහා කැණීම මෙම වසරේ දී සාර්ථකව අවසන් කළ අතර ඩී-36 හා ඩී-37 නමින් නව ගුහා දෙකක ද කැණීම් කටයුතු සිදු කෙරිණි. මෙහි මූලික කැණීම් අවසන් වූ අතර දත්ත විශ්ලේෂණය හා වාර්තා සකස් කිරීම සිදු වෙමින් පවතී.

එසේම ගුරුගොඩ සුසානයේ ද වසර කිහිපයක සිට කළ කැණීම් මෙම වසරේ දී අවසන් කළ හැකි වූ අතර වාර්තා සකස් කිරීම හා දත්ත විශ්ලේෂණ කටයුතු ද සිදු කෙරෙමින් පවතී.

යාපහුව රාජධානියේ ඇතුළු නගරයේ හා පිටත නගරයේ තොරතුරු අනාවරණය කර ගැනීමේ අරමුණින් සිදු කළ පර්යේෂණ කැණීම ද සාර්ථකව අවසන් කළ හැකි විය.

එසේම පසුගිය වසරේ දී නාගොල්ල පධානඝර සංකීර්ණයට අයත් සාධක අනාවරණය කර ගැනීමේ අරමුණින් සිදු කළ කැණීම ද මෙම වසරේ සාර්ථකව අවසන් කළ හැකි විය. මෙහිදී ගොඩනැගිල්ලේ නිර්මාණ තාක්ෂණය හා එකල පැවති සංස්කෘතීන් ආදිය හඳුනා ගන්නා ලදී.

මීට අමතරව මී ඔය ආශ්‍රිත ප්‍රදේශයේ පුරාවිද්‍යාත්මක හා මානව විද්‍යාත්මක සාධක අනාවරණය කර ගැනීමේ අරමුණින් ගවේෂණයක් සිදු කිරීම, වාර්ෂික වැඩමුළු හා සමුළු පැවැත්වීම, කැණීම් හා ගවේෂණ අංශයන්ට අදාළ වාර්ෂික වාර්තා පිළියෙළ කිරීම හා විශේෂ පුරාවස්තු ඒකකයේ කාර්යයන් ද වසර පුරාවටම ක්‍රියාත්මක කරන ලදී.

## සංරක්ෂණ අංශය

නාගොල්ල පධානඝරයේ පළමු හා දෙවන අදියරයේ සංරක්ෂණ කටයුතු මෙම වසරේ දී නිම කිරීමට හැකි විය. ඒ අනුව එම සංරක්ෂිත ස්මාරක වල නඩත්තු කටයුතු ද වර්ෂය පුරාවටම සිදු කරන ලදී.

2013 වසරේ ආරම්භ කළ යාපහුව මාළිගා සංකීර්ණයේ පිට දිය අගලෙහි සංරක්ෂණ කටයුතු මෙම වසර තුළ අවසන් කළ හැකි විය.

එසේම කඩවල ටැම්පිට විහාරය, ගුරුගොඩ රජමහා විහාරය, හාතිගමුව බණ මඩුව හා මුළුතැන්ගෙය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු ද මෙම වසර තුළ සිදු කළ හැකි විය.

බිතු සිතුවම් සංරක්ෂණ අංශය යටතේ කඩවල ටැම්පිට විහාරය, රත්ගල්ලේගම ටැම්පිට විහාරය, බුල්නෑව ටැම්පිට විහාරය, නියඳවන රජමහා විහාරයේ ගුහා අංක 01, හාතිගමුව ගුරුගොඩ රජමහා විහාරය හා අඹගස්වැව රජමහා විහාරය යන විහාර වල බිතුසිතුවම් සංරක්ෂණය කරන ලදී. මින් නියඳවන රජමහා විහාරයේ සංරක්ෂණ කටයුතු අවසන් කළ හැකි වූ අතර සෙසු විහාරස්ථාන වල සංරක්ෂණ කාර්යයන් මීළඟ වර්ෂයට ගෙන යන ලදී.

ඉදි කිරීම්, නඩත්තු හා ප්‍රතිසංස්කරණ යටතේ මෙම වර්ෂයට අදාළ ව සිදු කළ කාර්යයන් ලෙස, නව පුරාවස්තු ගබඩාව හා ප්‍රධාන ගබඩාව ඉදිකිරීම, රථගාල ඉදිකිරීම හා ඓතිහාසික කළුදේවතා බංඩාර දේවාලයට පියැස්සක් ඉදිකිරීම ආදී කටයුතු ප්‍රධාන වේ.

## සංරක්ෂණ කටයුතු වලට අදාළ ඡායාරූප කිහිපයක්.



පිටදිය අගල බැම්ම සංරක්ෂණය



පධානඝරය සංරක්ෂණයට පසු

# දඹදෙණිය

## කැණීම් අංශය

දඹදෙණිය ව්‍යාපෘතිය මගින් මෙම වර්ෂයට අදාලව මාළිගාගල රජමාළිගය හා මැටි ප්‍රාකාර බැම්ම, බිහල්පොල විහාරය, කළුන්දාව හා රුවන්ගිරිකන්ද යන පුරාවිද්‍යාත්මක ස්ථාන වල කැණීම් සිදු කරන ලදී.

ඒ අනුව දඹදෙණිය යුගයේ නගර ආරක්ෂාව පතා ඉදි කළ බවට සඳහන් වන ඓතිහාසික මැටි ප්‍රාකාර බැම්ම සොයා ගැනීමේ අරමුණින් කළ කැණීම මෙම වසරේ සිදු කළ සුවිශේෂී කාර්යයකි. මෙහිදී විජයසුන්දරාරාමය ආශ්‍රිතව දැනට ශේෂ වී ඇති ප්‍රාකාර බැම්ම හා දිය අගල ආශ්‍රිතව පර්යේෂණ අගල් ත්‍රිත්වයක් ඇසුරෙන් කැණීම් කළ අතර ප්‍රාකාර බැම්මේ නිර්මාණ තාක්ෂණය හා ව්‍යාප්තිය පිළිබඳ පැහැදිලි තොරතුරු රැසක් අනාවරණය කර ගත හැකි විය.

එසේම මාළිගාගල පර්වත මස්තකයේ ඇති 'මැද මිදුල' නමින් හඳුන්වන ස්මාරකයට බටහිර දිශානුගතව සිදු කළ කැණීමෙන් රජමාලිගය ලෙස සැලකෙන ගොඩනැගිල්ලේ කොටස් කිහිපයක් අනාවරණය කර ගත හැකි විය.

මීට අමතරව අනුරාධපුර යුගයේ පැවති ආරණ්‍ය සේනාසනයක් බවට විශ්වාස කෙරෙන රුවන්ගිරිකන්ද ප්‍රදේශයේ පුරාවිද්‍යාත්මක සාධක අනාවරණය කර ගැනීමේ අරමුණින් සිදු කළ ගවේෂණය, සාම්ප්‍රදායික ජන කොටසක් වාසය කරන කළුන්දාව ගමෙහි මානවවිද්‍යාත්මක ගවේෂණය හා මහනුවර යුගයේ සංවර්ධනය වූ බිහල්පොළ විහාරය අවට ප්‍රදේශය ගවේෂණය ආදිය මෙම වසර තුළ ඉටු කළ තවත් සුවිශේෂී කාර්යයක් කිහිපයක් වේ.

එසේම සංචාරක තොරතුරු එක් රැස් කිරීම, පුරාවස්තු විශ්ලේෂණය, වාර්ෂික වාර්තා සකස් කිරීම හා ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආදී ක්‍රියාකාරකම් රැසක් මෙම වර්ෂයට අදාළව සිදු කරන ලදී.

## සංරක්ෂණ අංශය

මෙම වර්ෂයට අදාළව බිතු සිතුවම් සංරක්ෂණ අංශය යටතේ යටත්තාවල පුරාණ විහාරයේ බිතුසිතුවම් හා මුරුතැන්ගේ රජමහා විහාරයේ පිළිම සහ බිතුසිතුවම් සංරක්ෂණය සිදු කරන ලදී.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති යටත්තාවල විහාරයේ බිතු සිතුවම් බොහෝ සෙයින් විනාශ වී ගොස් තිබූ බැවින් ඒවා මෙම වර්ෂයේ දී සංරක්ෂණය කරන ලදී. මෙහිදී සිතුවම් සංරක්ෂණය පමණක් නොව, බිත්තිවල වරිච්චි ආධාරකය දිරාපත්වූ ස්ථාන නැවත සවිගැන්වීම, කෘමී සතුන් මර්දනය හා පෙති ගැළවීමට ලක්වූ වර්ණ ස්තරය නැවත සවිගැන්වීම යන කාර්යයන් ද සිදු කරන ලදී.

මහනුවර යුගයට අයත් සාධක සහිත මුරුතැන්ගේ රජමහා විහාරයේ ද මකර තොරණ, මූර්ති හා සිතුවම් යන සියල්ලම විනාශ වී ඇති අතර ශේෂ වී ඇති සාධක වලට අනුව සංරක්ෂණය කිරීම මෙම වසරේ දී සිදු කරන ලදී. ඒ අනුව මෙම විහාර ප්‍රතිසංස්කරණය යටතේ පහත සඳහන් කාර්යයන් සිදු කෙරිණි.

- කැබලි වී ඇති පැරණි මකර තොරණේ කොටස් එකතු කර ප්‍රතිනිර්මාණය කිරීම.
- මකර තොරණ මධ්‍යයේ පැවති සමාධි පිළිමය නැවත ගොඩනැගීම
- බිත්තිවල ආධාරකයෙන් ගැලවී ඇති බදාමය නැවත සවි කිරීම හා අක්‍රමවත් බදාම ඉවත් කර නැවත බදාම යෙදීම
- ගිලිහී ගිය සිතුවම් ප්‍රතිනිර්මාණය කිරීම
- මකර තොරණ ඉහළ දේව විමානය ප්‍රතිනිර්මාණය කිරීම
- සමාධි පිළිමය දෙපස ඇති දේව ප්‍රතිමා සහ හිටි බුද්ධ ප්‍රතිමා යළි තහවුරු කිරීම සහ විනාශ වූ පිළිම නැවත ගොඩනැගීම
- සිවිලිමේ ලැලි අතර අවකාශ පිරවීම සහ ඉහළින් ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම
- කැටයම් සහිත ලී උළුවස්ස තහවුරු කිරීම
- දිරාපත් වූ ලී ගරාදි වැට ඉවත් කර නැවත සැකසීම
- පිළිම, මකර තොරණ සහ සිතුවම් නැවත වර්ණ ගැන්වීම

වාස්තු විද්‍යාත්මක සංරක්ෂණ යටතේ කළුන්දාව පුරාණ විහාරස්ථානයේ ටැම්පිට විහාර මන්දිරය සංරක්ෂණය කරන ලදී. ඒ අනුව පූර්ණ වශයෙන්ම නවීකරණය වී ඇති මෙම විහාරයෙහි ටැම්පිට විහාරය පමණක් පෙර ස්වරූපයෙන් ආරක්ෂා වී තිබුණ ද එය ද ඉතා අබලන් තත්වයක පැවති බැවින් සංරක්ෂණය සඳහා යෝජනා විය. මේ අනුව ටැම්පිට විහාරයේ බාහිර හා අභ්‍යන්තර සියලුම කොටස් ප්‍රතිසංස්කරණය කරන ලදී.

එසේම විජයසුන්දරාරාම විහාර මළුවේ දකුණු පසට වන්නට පිහිටා ඇති දකුණු ප්‍රාකාර බැම්ම හා එහිම බටහිර දෙසට වන්නට පිහිටා ඇති පැරණි ගොඩනැගිල්ල සංරක්ෂණය කිරීම ද මාර්ග නඩත්තු ආදිය ද මෙම වසරේ සිදුවූ තවත් සුවිශේෂී සංරක්ෂණ කාර්යයන් වේ.

## සංරක්ෂණ අංශයේ ප්‍රගතිය දැක්වෙන ඡායාරූප කිහිපයක්



යටත්තාවල ටැම්පිට විහාරයේ මූර්ති සංරක්ෂණයට පෙර සහ සංරක්ෂණයෙන් පසු



මුරුතැන්නේ පුරාණ විහාරයේ මකර තොරණ සහිත මූර්ති සංරක්ෂණයට පෙර



මුරුතැන්නේ පුරාණ විහාරයේ මකර තොරණ සහිත මූර්ති
සංරක්ෂණයෙන් පසු





කළුන්දාව ටැම්පිට විහාරය සංරක්ෂණයට පෙර සහ සංරක්ෂණයෙන් පසු අවස්ථාව

# පඬුවස්නුවර

## කැණීම් අංශය

මෙම වසර තුළ පඬුවස්නුවර ව්‍යාපෘතිය යටතේ සිදු කළ කැණීම් හා ගවේෂණ අතර (PNB 3-2014) හෙවත් ගොඩනැගිලි අංක 03 කැණීම ප්‍රධාන වශයෙන් වැදගත් වේ. මේ මගින් පොළොන්නරු යුගයට අයත් යැයි විශ්වාස කළ හැකි ගොඩනැගිල්ලක අවශේෂ හමුවී ඇත.

එමෙන්ම නිකසලානුවර ප්‍රාකාරයට ආසන්නව පිහිටා ඇති ගොඩනැගිල්ලක් ද මෙම වසර තුළ කැණීම් කළ අතර එහි මතුපිට දැකිය හැකි පුරාවිද්‍යාත්මක අවශේෂ අනුව එම ගොඩනැගිල්ල අනුරාධපුර යුගයේ සිට මහනුවර පාලන සමය දක්වා සක්‍රීයව පැවති නිර්මාණයක් බව විශ්වාස කළ හැකිය.

පඬුවස්නුවර ව්‍යාපෘතියට අයත් නාථගනේ පුරාවිද්‍යාත්මක වැඩබිමෙහි බටහිර දිශාවේ පිහිටා ඇති පොකුණ කැණීම ද මෙම වසර තුළ කළ තවත් එක් සුවිශේෂී කාර්යයකි. මෙම කැණීම තුළින් එහි නිර්මාණ තාක්ෂණය මෙන්ම සුවිශේෂී මැටි බඳුන් හා පබළු ආදී පුරාවස්තු රැසක් ද අනාවරණය කර ගත හැකි විය.

මෙම වර්ෂය තුළදී ඓතිහාසික පඬුවස්නුවර රාජධානිය හා සම්බන්ධ සාම්ප්‍රදායික කර්මාන්ත පිළිබඳව ගවේෂණයක් සිදු කළ අතර එහිදී සාම්ප්‍රදායික කර්මාන්ත ඇසුරින් සිය වෘත්තිය ගෙන යන පිරිස් පිළිබඳව ද අධ්‍යයනය කරන ලදී.

එසේම පඬුවස්නුවර ව්‍යාපෘතිය මගින් මෙම වර්ෂයට අදාළව ගවේෂණ කිහිපයක් ද සිදු කරන ලදී. ඒ අතර ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට යටත් විජිත පාලන සමය දක්වා පුරාවිද්‍යාත්මක දත්ත වාර්තාකරණය කිරීමේ අරමුණින් සිදු කළ නාථගනේ හා රිදී කන්ද ඇතුළු පුරාවිද්‍යාත්මක භූමි ආශ්‍රිතව සිදු කළ ගවේෂණත් පඬාවැව ආශ්‍රිත ගවේෂණයත් වැදගත් වේ. මේ තුළින් පුරාවිද්‍යාත්මක දත්ත රැසක් අනාවරණය කර ගත හැකි විය.

මෙම කටයුතු වලට සමගාමීව පුරාවස්තු විශ්ලේෂණය, වර්ගීකරණය, සැලසුම් ඇඳීම හා වාර්තාකරණය යන කාර්යයන් ද වර්ෂය පුරා ක්‍රියාත්මක විය.

## කැණීම් අංශයේ ප්‍රගතිය දැක්වෙන ඡායාරූප කිහිපයක්




නිකසලානුවර ප්‍රාකාරයට ආසන්නව පිහිටා ඇති ගොඩනැගිල්ල කැණීමට පෙර සහ කැණීමෙන් පසු




ගොඩනැගිලි අංක 03 කැණීමට පෙර සහ කැණීමෙන් පසු




සාම්ප්‍රදායික කර්මාන්ත පිළිබඳව කළ අධ්‍යයනය

## සංරක්ෂණ අංශය

2012 වර්ෂයේ කැණීම් කරන ලද PNB 01 හා PNB 02 යන ගොඩනැගිලි සංරක්ෂණය කිරීම මෙම වසරේ දී සිදු කළ අතර පොළොන්නරු යුගයේ වාස්තු විද්‍යාත්මක අංග ආරක්ෂා වන පරිදි මෙම සංරක්ෂණ සිදු කළ හැකි විය.

එසේම පඬුවස්නුවර ටැම්පිට විහාරය හා පිළිමගෙය සංරක්‍ෂණය ද මෙම වසරේ දී සිදු කළ තවත් වැදගත් කාර්යයක් වන අතර එහිදී ටැම්පිට විහාරයෙහි පහත ගෙබිම, බිතු සිතුවම් සහ මූර්ති යන අංග සංරක්‍ෂණය කරන ලදී. එසේම බුදු මැදුරෙහි පැරණි කපරාරු බිත්ති, වහලය හා ඉදිරිපස තොරණ ආදිය ද ප්‍රතිසංස්කරණය කරන ලදී.

මීට අමතරව නිකසලානුවර ගොඩනැගිලි අංක 02, නිකසලානුවර ප්‍රාකාර බැම්ම සංරක්‍ෂණය හා පඬුවස්නුවර ප්‍රවේශ මාර්ගය අසළ ගොඩනැගිලි අංක 01 හා 02 සංරක්‍ෂණය යන කාර්යයන් ද සිදු කෙරිණි.

එමෙන්ම PNB 01 ගොඩනැගිල්ල නඩත්තු කිරීම හා වැඩබිම් අවට භූ දර්ශනය සකස් කිරීම ආදිය ද වසර පුරා සිදු කරනු ලැබීය.

මීට අමතරව මෙම වර්ෂයේ දී ද ශාස්ත්‍රීය වැඩමුළු 03 ක්, සමාජ සේවා වැඩසටහන් කිහිපයක් හා ආගමික වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කළ හැකි විය.

### සංරක්ෂණ අංශයට අදාළ කාර්යයන් හි ප්‍රගතිය දැක්වෙන ඡායාරූප කිහිපයක් පහත දැක්වේ





PNB 01 ගොඩනැගිල්ල සංරක්ෂණයට පෙර සහ සංරක්ෂණයෙන් පසු





ටැම්පිට විහාරය හා පිළිමගෙය සංරක්ෂණයට පෙර සහ සංරක්ෂණයෙන් පසු





ගොඩනැගිලි අංක 02 සංරක්ෂණයට පෙර සහ සංරක්ෂණයෙන් පසු

# කුරුණෑගල වැඩබිම

## කැණීම් අංශය

කැණීම් අංශයේ නිලධාරීන් විසින් හඳුනාගත් පරිදි භූමිය මතුපිට තිබූ සාධක වලට අනුව පැරණි බැම්මක අවශේෂ අනාවරණය කර ගැනීමේ අරමුණින් සැරසුම්ගල පොකුණු බැම්ම කැණීම කළ අතර, මීටර 1 1/2 ක් පමණ කැණීමෙන් පසු පැරණි බැම්මෙහි අපේක්ෂිත සාධක මතු කර ගත හැකි විය.

මීට අමතරව පසුගිය වර්ෂ වල කැණීම් මගින් හමුවූ මැටි බඳුන් ඇතුළු පුරාවස්තු රැසක් විශ්ලේෂණය, වර්ගීකරණය හා වාර්තාකරණය මෙන්ම සැලසුම් ඇඳීම ද මෙම වර්ෂය පුරාවටම සිදු කළ අතර මීට සමගාමීව කැණීම් වාර්තා සකස් කිරීම ද සිදු විය.

## සංරක්ෂණ අංශය

කුරුණෑගල ව්‍යාපෘතිය යටතේ 2014 වර්ෂයට අදාළව පහත සඳහන් සංරක්ෂණ ව්‍යාපෘතීන් සිදු කරන ලදී.

- සොහොන් ගොඩැල්ල බැම්ම සංරක්ෂණය
- මරළුවාව රජමහා විහායේ වහල සංරක්ෂණය
- මකුළාන විහාරයේ සලපතල මළුව සංරක්ෂණය
- ජාකඩුව රජමහා විහාරය සංරක්ෂණ
- වැව රවුම පියගැටපෙළ සංරක්ෂණය

ඒ අනුව කැණීම් මගින් හඳුනාගත් සොහොන් ගොඩැල්ලෙහි වහලය හා පැති බැම්ම එහි අවශේෂ සාධක වලට අනුව සංරක්ෂණය කරන ලදී. මෙහි ආරක්ෂාව සඳහා වහලය ඉදි කිරීම ද සිදු විය.

මරළුවාව රජමහා විහාරයේ කොන්ක්‍රීට් සහිත කොටස ඉවත් කර නව වහලය ඉදි කිරීම හා ගෙබිම සැකසීම සිදු කරනු ලැබීය.

මකුළාන රජමහා විහාරයේ සලපතල මළුවෙහි අතුරා තිබූ කොන්ක්‍රීට් කැට සහිත ගල් පතුරු ඉවත් කර ගල් කුඩු අතුරා මළුව සකස් කිරීමත් වැව රවුමෙහි ඇති පියගැටපෙළ නව ගල් කුට්ටි යොදා ගනිමින් සංරක්ෂණය කිරීමත් මෙම ව්‍යාපෘතිය මගින් ඉටු කරන ලදී.

ජාකඩුව රජමහා විහාරයේ වහල සංරක්ෂණය ද මෙම වර්ෂයේ දී සිදු කිරීමට යොජිත වුවත් ප්‍රමාණවත් අමුද්‍රව්‍ය සොයා ගත නොහැකි වීමෙන් එය ඉදිරි වර්ෂයට කල් දමන ලදී.

එසේම පසුගිය වසරේ දී ආරම්භ කළ රිදී විහාර ව්‍යාපෘති කාර්යාලය ඉදි කිරීම් කටයුතු මෙම වසරේ දී අවසන් කළ හැකි විය.

පුරාවස්තු සංරක්ෂණාගාරයේ දෛනික කටයුතු හා රිදී විහාර නඩත්තු ආදිය ද වසර පුරාවට ක්‍රියාත්මක විය.

# බටලීය අනුරූ නිකේතනය

මෙම ව්‍යාපෘතිය අධ්‍යයන, නිෂ්පාදන හා අලෙවි යන අංශ තුනෙන් සමන්විත වන අතර 2014 වර්ෂය තුළ මෙම අංශ මගින් පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී.

## 01. අධ්‍යයන අංශය

එක් එක් විෂානුබද්ධව පැවැත්වූ ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් 2014 අධ්‍යයන වර්ෂය සඳහා නව සිසුන් බඳවා ගත් අතර එහි සංඛ්‍යාත්මක ප්‍රගතිය පහත පරිදි වේ.

| පාඨමාලාව | 2014 වර්ෂය සඳහා බඳවා ගත් සිසුන් ප්‍රමාණය |
|---|---|
| ගල් කැටයම් | 02 |
| පිත්තල වාත්තු සහ කැටයම් | 03 |
| ලී කැටයම් | 03 |
| සෙරමික් | 02 |

ඒ අනුව එක් එක් විෂයයන්ට අදාළ වන අධ්‍යයන කාර්යයන්, අධ්‍යයන චාරිකා හා මාසික වෘත්තීය පුහුණුව ලබා දීම ආදී කාර්යයන් වසර පුරාවට සිදු කරන ලදී.

## 02. නිෂ්පාදන අංශය

මෙම වසර තුළ නිෂ්පාදන අංශය මගින් පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී.

i. කැලි ක්‍රමය යටතේ අනුරූ නිෂ්පාදනය

ii. ලැබී ඇති බාහිර ඇණවුම් නිම කර භාර දීම.

iii. ආයතනයේ, ව්‍යාපෘතිවල හා අමාත්‍යාංශය මගින් ලැබුණු ඇණවුම් නිමකර භාර දීම.

මීට අමතරව පහත සඳහන් විශේෂ කාර්යයන් ද සිදු විය.

1. නයිගල රජමහා විහාරස්ථානයේ වාහල්කඩ කැටයම් සහිත තොරණ සැකසීම
2. කොඩ්ඩිකාමම් යුද හමුදා කඳවුරට සිංහ රූප දෙකක් සහ ලාංඡනයක් සැකසීම
3. 2014 දැයට කිරුළ ප්‍රදර්ශන සඳහා සැරසිලි කටයුතු සිදු කිරීම
5. ආරක්ෂක අමාත්‍යාංශයට සිංහ රූපයක ආකෘතියක් සකස් කිරීම
6. කොළඹ ඉසිපතන විද්‍යාලය සඳහා අනුරූ ලබා දීම
7. කොළඹ නීති විද්‍යාලයේ පිරිත් පිංකමක් සඳහා තොරණක් සකස් කිරීම

## 03. අලෙවි අංශය

පුහුණු සිසුන් සහ ස්ථිර ශිල්පීන් විසින් දෛනික අලෙවිය සඳහා කැබලි ක්‍රමය යටතේ නිෂ්පාදන සිදු කිරීම මෙම අංශය මගින් සිදු කෙරේ. ඒ අනුව මධ්‍යම සංස්කෘතික අරමුදලේ එක් එක් ව්‍යාපෘති වල ක්‍රියාත්මක වන අනුරූ අලෙවිසැල් සඳහා නිෂ්පාදන බෙදා හැරීම වර්ෂය පුරාවටම සිදු කරන ලදී.

| | |
|---|---|
| අලෙවිසැල් වලින් ලද ආදායම | - රුපියල් 797, 801.75 |
| පරිත්‍යාග හා සේවා සඳහා | - රුපියල් 609, 883.08 |
| සම්පූර්ණ ආදායම | - රුපියල් 1, 407, 684. 83 කි. |

# මධ්‍යම සංස්කෘතික අරමුදල ප්‍රකාශන අංශය

ප්‍රකාශන අංශය යටතේ ප්‍රකාශන, මුද්‍රණ, ප්‍රචාරක, ඡායාරූප හා ප්‍රලේඛන කටයුතු සිදු කෙරෙන අතර පුස්කොළ පොත් ගවේෂණය, සුචිගත කිරීම හා පොත් අලෙවිය යන කාර්යයන් ද සිදු කරනු ලැබේ. මීට අමතරව මෙම අංශය යටතේ පුස්තකාලයක් ද පවත්වාගෙන යයි.

මෙම වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා සිදුවූ ප්‍රකාශන කටයුතු පහත පරිදි වේ.

1. අත්පිටපත් යතුරු ලියනය කරමින් පවතින ග්‍රන්ථ - 03
2. සංස්කරණය සහ සෝදුපත් බැලීම සිදු කරන ග්‍රන්ථ - 15
3. මුද්‍රණය සඳහා අවසාන පිටපත සකස් කර ඇති ග්‍රන්ථ - 50

ඒ අනුව අදාළ කාල සීමාව තුළ මුද්‍රණ කටයුතු අවසන් කර ඇති කාර්යයන් ප්‍රමාණය 56 ක් වන අතර ඉන් ලද ආදායම රුපියල් 3,503,719.61 කි.

මීට අමතරව දේශීය විදේශීය සංචාරක ප්‍රවේශපත්‍ර, අත්පත්‍රිකා, පෝස්ටර්, වවුචර් පත්‍ර සහ ආරාධනා පත්‍ර ඇතුළු සැලකියයුතු මුද්‍රණ කටයුතු සංඛ්‍යාවක් මෙම වසර තුළ ද ප්‍රකාශන අංශය මගින් සිදු කරන ලදී.

මීට අමතරව ප්‍රචාරක අංශය මගින් පහත සඳහන් වැඩසටහන් ද ක්‍රියාත්මක කෙරිණි.

- උත්තම ලංකා වැඩසටහන් 67 ක් ක්‍රියාත්මක කිරීම
- විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ප්‍රචාරණ කටයුතු සඳහා මාධ්‍ය සාකච්ඡා 06 ක් පැවැත්වීම
- මාධ්‍ය ගවේෂණ චාරිකා 03 ක් පැවැත්වීම
- 2014 සිත්තම්ගල්ලෙන රජමහා විහාරයේ පෙරහැර මංගල්‍ය සඳහා ප්‍රකාශන සැකසීම හා ප්‍රචාරක කටයුතු ආදිය සිදු කිරීම

එසේම මෙම වසරේ දී ඡායාරූප අංශය මගින් ප්‍රවීන ඡායාරූප ශිල්පී ගාමිණී ජයසිංහ මහතා වෙතින් මිලදීගත් ඡායාරූප එකතුවට අයත් ඡායාරූප කිහිපයක් සඳහා නාම පුවරු යෙදීම සිදු කරන ලද අතර පුස්තකාලය මගින් ග්‍රන්ථ සුචිගත කිරීම, වර්ගීකරණය කිරීම සහ පුස්කොළ පොත් ගවේෂණ වාර්තා ලේඛනගත කිරීම යන කාර්යයන් ද සිදු විය.

## මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2014 වර්ෂයට අදාළ වෙනත් ක්‍රියාකාරකම්

- **ආගමික සිද්ධස්ථාන ඉදි කිරීම, අලුත්වැඩියා හා නඩත්තු කටයුතු**

  රට පුරා විසිරී පවතින ආගමික සිද්ධස්ථාන වල නව ඉදිකිරීම්, අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා 2014 වර්ෂය ඇතුළත රුපියල් 10,040,520. 00 ක් ප්‍රදාන වශයෙන් ලබා දෙන ලදී.

- **ආගමික සිද්ධස්ථාන වල වාර්ෂික පෙරහැර මංගල්‍ය වෙනුවෙන් ආධාර ලබා දීම**

  මේ යටතේ දිවයින පුරා පිහිටි ආගමික සිද්ධස්ථාන වල වාර්ෂිකව පවත්වනු ලබන පෙරහැර මංගල්‍ය සඳහා රුපියල් 4,183,706. 00 ක ආධාර වශයෙන් ලබා දී ඇත.

- **වෙනත් සංස්කෘතික කටයුතු සඳහා ආධාර ලබා දීම**

  නාට්‍ය සන්දර්ශන, පොහොය වැඩසටහන්, වෙනත් ආගමික උත්සව හා සංස්කෘතික සමුළු සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් මෙම වර්ෂයේ දී ආධාර වශයෙන් ලබා දී ඇති මුදල රුපියල් 9,046,380. 40 කි.

- **විවිධ පුද්ගලයින් සඳහා වෛද්‍යාධාර වශයෙන් මුදල් ලබා දීම**

  මේ යටතේ කලාකරුවන් ඇතුළු විවිධ රෝගී පුද්ගලයින්ට ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රුපියල් 1,850,000. 00 ක මුදලක් පරිත්‍යාග කරන ලදී.

- **විශ්වවිද්‍යාල පර්යේෂණ කටයුතු සඳහා ආධාර ලබා දීම**

  මෙම වසරේ දී විශ්වවිද්‍යාල වල පර්යේෂණ සමුළු සඳහා ආධාර වශයෙන් රුපියල් 320,000. 00 ක මුදලක් ප්‍රදානය කරන ලදී

- **එසේම වෙනත් රාජ්‍ය උත්සව සඳහා රුපියල් 81,250.00 ක මුදලක් ප්‍රදානය කරන ලදී.**

# මධ්‍යම සංස්කෘතික අරමුදල
## 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය

| | 2014 (රු) | 2013 (රු) |
|---|---|---|
| **වත්කම්** | | |
| **ජංගම වත්කම්** | | |
| මුදල් හා බැංකු | 57,339,782 | 76,765,504 |
| ලැබිය යුතු | 61,975,675 | 70,489,618 |
| තොගය | 104,333,735 | 75,879,357 |
| ආයෝජන | 400,357,590 | 150,000,000 |
| | 624,006,782 | 373,134,479 |
| **ජංගම නොවන වත්කම්** | | |
| ලැබිය යුතු | 213,423,009 | 194,307,192 |
| විදේශ ආධාර ව්‍යාපෘති | 676,432 | 676,432 |
| දේපල යන්ත්‍ර හා උපකරණ | 963,042,104 | 962,176,003 |
| පාරිතෝෂිත සඳහා වෙන්කිරීම් | 598,461,894 | 398,461,894 |
| | 1,775,603,439 | 1,555,621,521 |
| **මුළු වත්කම්** | **2,399,610,221** | **1,928,756,000** |
| **වගකීම්** | | |
| **ජංගම වගකීම්** | | |
| උපචිත ගෙවීම් | 101,934,369 | 124,496,229 |
| **ජංගම නොවන වගකීම්** | | |
| පාරිතෝෂිත සඳහා වෙන්කිරීම් | 439,029,478 | 425,353,599 |
| විශේෂ ආධාර ව්‍යාපෘති | 8,803,143 | 8,803,143 |
| විදේශ ආධාර ව්‍යාපෘති | 5,416,638 | 1,969,612 |
| **මුළු වගකීම්** | **555,183,627** | **560,622,582** |
| **ශුද්ධ වත්කම්** | **1,844,426,594** | **1,368,133,418** |
| **ප්‍රාග්ධන දායකත්වය** | | |
| සමුච්චිත අරමුදල | 19,944,705 | 19,944,705 |
| සංචිත | 16,064,386 | 16,064,386 |
| වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය | 444,422,000 | 447,395,000 |
| විදේශ ආධාර අරමුදල | 286,249,551 | 303,121,881 |
| සමුච්චිත අතිරික්ත / ඌනතා ගිණුම | 1,077,745,952 | 581,607,446 |
| | **1,844,426,594** | **1,368,133,418** |

# මධ්‍යම සංස්කෘතික අරමුදල
## 2014 දෙසැම්බර් 31 දින අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | |
|---|---|---|
| **මෙහෙයුම් අයිතම වලින් උත්පාදනය වූ මුදල් ප්‍රභවය** | | |
| වසරේ අතිරික්තය / ඌනතාවය | | 479,462,969 |
| **ගැලපීම් - මූල්‍ය නොවන අයිතම** | | |
| ක්ෂය වීම් | 53,880,089 | |
| පෙර වර්ෂය සඳහා ගැලපීම් | 16,675,536 | |
| ස්ථාවර වත්කම් ඉවත්කිරීම් ලාභය | (131,910) | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 22,651,042 | 93,074,757 |
| **කාරක ප්‍රාග්ධන අයිතම ගැලපීමට පෙර මෙහෙයුම් ප්‍රතිඵල** | | **572,537,726** |
| **කාරක ප්‍රාග්ධනය සඳහා වෙනස්වීම්** | | |
| ලැබිය යුතු | 8,513,943 | |
| තොගය | (28,454,378) | |
| උපචිත ගෙවීම් | (22,561,860) | (42,502,295) |
| **මෙහෙයුම්කටයුතු වලින් උත්පාදනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **530,035,431** |
| **ආයෝජන කටයුතු මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | (74,591,520) | |
| ස්ථාවර වත්කම් ඉවත්කිරීම් | 131,910 | |
| ආයෝජන (වැඩිවීම/අඩුවීම) | (450,357,590) | |
| දිගුකාලීන ආයෝජන (වැඩිවීම/අඩුවීම) | (19,115,817) | |
| **ආයෝජන කටයුතු වලින් උත්පාදන වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(543,933,017)** |
| **මූල්‍ය කටයුතු වලින් මුදල් ප්‍රවාහය** | | |
| විදේශ සම්පත් අරමුදල | | |
| පාරිතෝෂික ගෙවීම | (8,975,163) | |
| විශේෂ ආධාර ව්‍යාපෘති | | |
| විදේශ ආධාර ව්‍යාපෘති | 3,447,027 | |
| **මූල්‍ය අයිතමයන්ගේ භාවිතය** | | **(5,528,136)** |
| **ශුද්ධ මුදල් අඩුවීම- මුදල් හා මූල්‍ය සමාන අයිතම** | | **(19,425,722)** |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන අයිතම | | 76,765,504 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන අයිතම** | | **57,339,782** |

# මධ්‍යම සංස්කෘතික අරමුදල
## 2014 දෙසැම්බර් 31 දින අවසන් වර්ෂය සඳහා
## ආදායම් වියදම් ගිණුම

| | 2014 (රු) | 2013 (රු) |
|---|---|---|
| **ආදායම්** | | |
| ප්‍රවේශපත්‍ර අලෙවි ආදායම | 2,200,143,813 | 1,748,439,894 |
| අනුරූ අලෙවි ආදායම | 8,032,135 | (1,152,741) |
| ප්‍රකාශන අලෙවි ආදායම | 5,132,748 | 1,893,075 |
| මුද්‍රණාලයේ ආදායම | 3,063,186 | 1,245,586 |
| ආයෝජන ආදායම | 76,483,229 | 53,063,839 |
| වෙනත් ආදායම් | 16,417,830 | 15,267,732 |
| | **2,309,272,941** | **1,818,757,385** |
| **වියදම්** | | |
| වැටුප් වේතන හා සේවක දීමනා | 1,029,707,694 | 919,234,392 |
| පාරිතෝෂිත | 22,511,527 | 66,949,750 |
| ස්ථාවර වත්කම් ක්ෂය | 53,880,089 | 42,359,757 |
| අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන් | 67,740,761 | 17,162,616 |
| සැපයීම් හා පාරිභෝජන ද්‍රව්‍ය භාවිතය | 196,845,975 | 136,839,850 |
| දේපල, පිරියත හා උපකරණ අලුත්වැඩියාව | 72,421,815 | 37,778,087 |
| කොන්ත්‍රාත් සේවා | 58,689,460 | 40,732,730 |
| මූල්‍ය පිරිවැය | 334,158 | 135,429 |
| විගණක ගාස්තු | 300,000 | 250,000 |
| ප්‍රසාද දීමනා | 26,886,775 | 22,316,300 |
| වෙනත් වියදම් | 300,491,716 | 232,929,384 |
| | **1,829,809,970** | **1,516,688,295** |
| වර්ෂය සඳහා අතිරික්තය / ඌණතාවය | **479,462,971** | **302,069,090** |

## මධ්‍යම සංස්කෘතික අරමුදල
## 2014 දෙසැම්බර් 31 දිනට අවසන් වසර සඳහා ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

| | සමුච්චිත අරමුදල | ප්‍රාග්ධන සංචිතය | ප්‍රත්‍යාගණන සංචිතය | විදේශීය සංචිතය | සමුච්චිත අතිරික්තය | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2013.01.01 දිනට ශේෂය | 19,944,705 | 16,064,386 | 451,428,000 | 303,121,881 | 267,321,584 | 1,057,880,556 |
| එකතුකළා : | | | | | | |
| වසර සඳහා අතිරික්තය | | | | | 302,069,092 | 302,069,092 |
| පෙර වර්ෂයේ ගැලපීම් | | | (4,033,000) | | 12,216,770 | 8,183,770 |
| 2013.12.31 දිනට ශේෂය | **19,944,705** | **16,064,386** | **447,395,000** | **303,121,881** | **581,607,446** | **1,368,133,418** |
| එකතුකළා : | | | | | | |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | | 2,200,000 | | | 2,200,000 |
| විදේශ අරමුදල් | | | | 4,300,000 | | 4,300,000 |
| වසර සඳහා අතිරික්තය | | | | | 479,462,969 | 479,462,969 |
| පෙර වර්ෂයේ ගැලපීම් | | | (5,173,000) | (21,172,330) | 17,310,412 | (9,034,918) |
| | 19,944,705 | 16,064,386 | 444,422,000 | 286,249,551 | 1,078,380,827 | 1,845,061,469 |
| අඩුකළා: | | | | | | |
| පෙර වසරේ ගැලපුම් | | | | | (634,875) | (634,875) |
| 2014.12.31 දිනට ශේෂය | **19,944,705** | **16,064,386** | **444,422,000** | **286,249,551** | **1,077,745,952** | **1,844,426,594** |

**මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (4) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

මධ්‍යම සංස්කෘතික අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 9 (4) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යාන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

## 02. මූල්‍ය ප්‍රකාශන

### 2.1 විගණන මතය

පසුව ඉදිරිපත් කරනු ලැබේ

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 සම්බන්ධිත පාර්ශවයන් සමග ඇති ගනුදෙනු හෙළිදරව් නොකිරීම

(අ ) සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති පුද්ගලික සමාගමක් වන සී.ස.සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් සමාගම මධ්‍යම සංස්කෘතික අරමුදලේ ඇතැම් ඉදිකිරීම් හා සංරක්ෂණ කටයුතු කොන්ත්‍රාත් පදනම මත ඉටුකරනු ලබයි. සමාලෝචිත වර්ෂය තුළ මධ්‍යම සංස්කෘතික අරමුදලේ ව්‍යාපෘති වැඩබිම්වල කැණීම් / සංරක්ෂණ සහායකයින් ලෙස කම්කරුවන් මෙම සමාගම මගින් සේවයේ යොදවා ඒ සඳහා රු. මිලියන 142 ක් අරමුදලින් සමාගමට ගෙවා තිබිණි.

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තුළට අරමුදලේ අධ්‍යක්ෂ තනතුර දරන නිලධාරීන් දෙදෙනෙකුද, අරමුදලේ කාර්යය මණ්ඩලයේ ගණකාධිවරයෙකු සමාගමේ ගණකාධිකාරී ලෙසද, සමාලෝචිත වර්ෂය තුළදී කටයුතු කර තිබුණි. මධ්‍යම සංස්කෘතික අරමුදල හා සංස්කෘතික සංරක්ෂණ ඉදිකිරීම් පුද්ගලික සමාගම අතර පවත්නා මෙම සම්බන්ධතාවයේ ස්වභාවය හා ගනුදෙනු පිළිබඳ මූල්‍ය ප්‍රකාශවල අනාවරණය කර නොතිබුණි.

## 2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර.)

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3අනුව ගිණුම්වල සිදු කරනු ලබන පෙර කාලපරිච්ඡේද දෝෂ ගැලපීම්වලට අදාල වැරදි නිවැරදි කිරීම් පෙර වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරු නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමක් ලෙස වෙනස් කර සටහනක් මගින් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කල යුතු වුවද එකතුව රු. 44,290,617 ක් වූ පෙර වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරුවලට කල ගැලපීම් ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයට ගලපා තිබුණද ඒ පිළිබඳව සටහන් මගින් තොරතුරු අනාවරණය කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 අනුව සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් දැනටමත් භාවිත කරනු ලබන ස්ථාවර වත්කම් සහ භාවිතයට ගත නොහැකි, අපහරණය සඳහා ඇති වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කල යුතු වුවත්, 1982 සිට පැවත එන සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති රු.110,735,135 ක් පිරිවැය වූ ලීබඩු සවි කාරීම් හා උපකරණ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. තවද, 2013 වර්ෂය තුලදී වෙන්දේසි කර තිබුණු සහ ප්‍රයෝජයට ගත නොහැකිව විනාශ කර තිබුණු භාණ්ඩ වර්ග 758 කට අයත් භාණ්ඩ ඒකක 6984 ක් හඳුනා ගැනීම අත්හැරී වත්කම් (De recognition ) ලෙස මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 අනුව ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කරන විට එක සමාන පන්තියේ ස්ථාවර වත්කම් සියල්ලම ප්‍රත්‍යාගණනය කිරීමට පියවර ගත යුතු වුවත් 2012 දෙසැම්බර් 31 දිනට ක්ෂය අවසන්ව තිබූ වාහන 98 කින් වාහන 39 ක් සහ ඉඩම් හා ගොඩනැගිලිවලින් කොටසක් පමණක් රු. 461,115,000 කට තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

අඩමාණ ණය වෙන් කිරීම සම්බන්ධයෙන් අරමුදල විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කර නොතිබුණි. ණය අයකර ගැනීමේ හැකියාව පිළිබඳ සමාලෝචනය කිරීමකින් තොරව ඉකුත් වර්ෂය දෙක තුළදී අඩමාණ ණය ලෙස වෙන් කළ මුදලට සමාන මුදලක් එනම් රු. 1,964,833 ක් සමාලෝචිත වර්ෂයේද අඩමාණ ණය ලෙස වෙන් කර තිබුණි.

## 2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2014 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පරීක්ෂා කිරීමේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි නිවැරදිතාවය තහවුරු නොවුණි.

i. ස්ථාවර වත්කම් විකිණීමේ ලාභය රු. 131,910 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන් යටතේ වර්ෂයේ අතිරික්තයට එකතුකර ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල වන රු. 131,910 ක් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන් යටතේ අඩුකර දක්වා තිබුණි. නමුත් එම වටිනාකම ලාභය තුල අන්තර්ගත නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ලාභයෙන් අඩුකර වත්කම් විකිණීමෙන් ලද මුදල ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයක් ලෙස දක්වා නොතිබුණි.

ii. ජංගම වත්කම් යටතේ, මූල්‍ය තත්ව ප්‍රකාශණයේ දක්වා ඇති ලැබිය යුතු දෑ (Receivable) පසුගිය වසරට සාපේක්ෂව අඩුවීම රු. 8,513,943 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ එකතු කල යුතු වුවත් එම අගය ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයන් යටතේ අඩුකර දක්වා තිබුණි

iii. ජංගම නොවන වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති ලැබිය යුතු දෑ පසුගිය වසරට සාපේක්ෂව වැඩිවීම රු. 19,115,817ක් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන් යටතේ අඩුකර දැක්විය යුතු වුවත් එය කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ දක්වා ඇත.

iv. 2014 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා වන ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයට අනුව විදේශ සම්පත් අරමුදලෙහි මුදල්මය ගණුදෙනු සිදුවී නොතිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන් යටතේ මුදල් ලැබීමක් ලෙස රු. 23,921,939 ක් අඩුකර දක්වා තිබුණි.

v. මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන් යටතේ විදේශ අරමුදල් ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රවාහය රු. 3,447,027 ක් අඩුකර දක්වා ඇත. නමුත් 2014 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය තත්ව ප්‍රකාශයට අනුව පසුගිය වසරට සාපේක්ෂව මෙය වගකීමක වැඩිවීමක් නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශයට එකතු කිරීම කල යුතුය.

(ආ) දේපල පිරියත හා උපකරණවල අයිතිය සම්බන්ධයෙන් පවතින බාධාවන් හා සීමාවන් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කල යුතුය.එසේ වුවත් මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රධාන කාර්යාලය පිහිටි භූමියේ වටිනාකම රු. 4,064,443 ක් ලෙස ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුලත් කර ගිණුම්ගත කර තිබුණද එම භූමියේ හිමිකම අරමුදල සතු නොවූ හෙයින් ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඇ) විදේශ ආධාර ප්‍රදානයන් ලෙස 1984 සිට 2004 දක්වා කාලය තුල ලැබී තිබුණු වාහන 21 කින් වාහන 10ක සාධාරණ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි. එම වාහනවල රක්ෂිත වටිනාකම රු. 5,460,000 ක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) සුනාමි කෞතුකාගාරයක් ඉදිකිරීම සඳහා 2005 වර්ෂයේදී රු. 2,558,000 කට මිලදී ගෙන තිබුණු ගාල්ල නුගගහවත්ත ඉඩමෙහි වටිනාකම තක්සේරු කර ගිණුම්වලට ඇතුලත් කර නොතිබුණි. මෙම ඉඩම සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත පැවරීමට නියමිත බව විගණනය වෙත දන්වා තිබුණද ඒ සඳහා මෙතෙක් පියවර ගෙන නොතිබුණි.

(ඉ) ප්‍රත්‍යාගණනය කරන ලද ගොඩනැගිලිවලට අදාල 2013 හා 2014 වර්ෂවල ක්ෂය රු. 2,100,000 ක් වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයට හර නොකර විදේශ සම්පත් අරමුදලට හර කර තිබීම හේතුවෙන් විදේශ සම්පත් අරමුදලේ ශේෂය එම වටිනාකමින් අඩුවෙන්ද වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයට එම වටිනාකමින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) ක්ෂය අවසන්ව ඇති රු. 7,413,828 ක පිරිවැය වූ ගොඩනැගිලි මොනවාද යන්න හඳුනාගතහැකි ආකාරයට ගිණුම් පිළියෙල කර නොතිබුණි. එම නිසා එම වත්කම් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට නොහැකි වී තිබූ බව නිරීක්ෂණය විය.

(උ) ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂය තුළදී ලබාදී තිබූරු. 1,000,000 ක මුදල ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත නොකර අනෙකුත් සංස්කෘතික ක්‍රියාකාරකම් යටතේ වර්ෂයේ වියදමක් ලෙස වියදම් කපාහැර තිබුණි.

(ඌ) සීගිරිය ව්‍යාපෘති භූමිය තුළ පවත්වාගෙන යනු ලබන ප්‍රථමාධාර ව්‍යාපෘතිය වෙනුවෙන් රතු කුරුස සංගමයේ මාතලේ ශාඛාව වෙත සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 02 කදී ගෙවා තිබු රු. 620,658 ක මුදල අදාල වියදම් ගිණුමකට හර නොකර ප්‍රචාරණ වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි. තවද,

පුද්ගලයින් 6 දෙනෙකු වෙත වෛද්‍යාධාර සඳහා ලබාදුන් රු. 1,750,000 ක මුදල අනෙකුත් සංස්කෘතික ක්‍රියාකාරකම් යටතේ ගිණුම්ගත කර තිබීම නිසා අනෙකුත් සංස්කෘතික ක්‍රියාකාරකම් රු. 1,750,000 කින් ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ රක්ෂණ වියදම් ලෙස අවසන් මූල්‍ය ප්‍රකාශනවල රු. 1,342,446 ක් දක්වා තිබුණද වර්ෂයේ මෝටර් රථ රක්ෂණය වෙනුවෙන් දරන ලද වියදම රු. 2,293,842ක් විය. සේවක වෛද්‍ය ආධාර රක්ෂණ වන්දි ලැබීම් හා ගෙවීම්ද රක්ෂණ ගිණුම තුළ ඇතුළත් කර තිබීම නිසා වර්ෂයේ මෝටර් රථ වෙනුවෙන් දරන ලද වාර්ෂික රක්ෂණ වටිනාකම ගිණුම්වලින් හෙළිදරව් වී නොතිබුණි.

(ඒ) 2014 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනයේ පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.1.3 මගින් දක්වා ඇත්තේ උරුම වත්කම් අරමුදල සතු නොවන බවත් ඒවා පුරාවිද්‍යා කොමසාරිස් යටතේ අරමුදල විසින් භාරකාරත්වය දරණ බවත්ය. එසේ වුවද උරුම වත්කම් වැඩි දියුණු කිරීම සඳහා 2014 වර්ෂයේදී දරන ලද රු. 11,875,792 ක වියදම සංරක්ෂණ වියදම් ලෙස ගිණුම්ගත නොකර ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. මේ නිසා මූල්‍ය ප්‍රකාශනවල දේපල පිරියත හා උපකරණ වටිනාකම රු. 11,875,792 ක් වැඩියෙන්ද වර්ෂයේ වියදම රු. 11,875,792 ක් අඩුවෙන්ද දක්වා තිබුණි.තවද එම වත්කම්වලට අදාල ක්ෂය රු. 593,790 ක් වර්ෂයේ වියදමට ලියා හැර තිබීම නිසා වර්ෂයේ වියදම සාවද්‍ය ලෙස රු. 593,790 කින් වැඩිවී තිබුණි.

(ඔ) සීගිරිය ව්‍යාපෘතියේ සංචාරක කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ජපන් රජයේ ආධාර මත 2010 වර්ෂයේදී ලැබී තිබුණු වෑන් රථයේ ප්‍රත්‍යාගණන වටිනාකම වූ රු. 4,300,000 මෝටර්රථ ගිණුම හර කර විදේශ සම්පත් අරමුදල් සංචිතයට බැර කර තිබුණි. සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු එම වාහනයේ රු. 5,067,106 ක් වූ පිරිවැය වටිනාකම වත්කම් ගිණුමෙන් හා ඊට අදාල සමුච්චිත ක්ෂය රු. 5,067,106 ක් සමුච්චිත ක්ෂය ගිණුමෙන් ඉවත් කර නොතිබීම නිසා මෝටර් රථ ගිණුම හා සමුච්චිත ක්ෂය ගිණුම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඕ) ඉහත ප්‍රත්‍යාගණික වාහනයේ සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය ප්‍රමාණය වූ රු. 860,000 ක වටිනාකම හර කළ යුත්තේ විදේශ සම්පත් අරමුදල් ගිණුමට වුවද එය හර කර තිබුණේ වත්කම් ප්‍රත්‍යාගණන සංචිත ගිණුමටය. මේ නිසා විදේශ සම්පත් අරමුදල් ගිණුම රු. 860,000 ක් වැඩියෙන්ද, වත්කම් ප්‍රත්‍යාගණන සංචිත ගිණුම එම වටිනාකමින් අඩුවෙන්ද දක්වා තිබුණි..

(ක) පරිත්‍යාග වශයෙන් වියදම්වල දක්වා තිබූ රු. 4,618,938 ක්ද, දැයට කිරුළ වියදම් ලෙස දක්වා තිබුණු රු. 1,299,000 ක්ද සඳහා 2014 අයවැය ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණි.

(ග) පරිත්‍යාග ලෙස ලබාදී, දැයට කිරුළ වියදම් හා පරිත්‍යාග වශයෙන් ගිණුම්ගත කර තිබූ අනුරූ නිෂ්පාදනයන්හි මුළු පිරිවැය වූ රු. 4,278,305 තුළ ඇතුළත් ගණනය කර තිබූ ද්‍රව්‍ය, ශ්‍රමය හා පොදු කාර්යය පිරිවැය පිළිවෙලින් රු. 2,246,802, රු. 542,242 හා රු. 1,490,261 ක් විය. එම සම්පූර්ණ වටිනාකම අනුරූ නිෂ්පාදන ද්‍රව්‍ය පරිත්‍යාග වශයෙන් අනුරූ ද්‍රව්‍ය ගැණුම් (Purchases Replica Materials) ගිණුමට බැර කර තිබීමෙන් අනුරූ ද්‍රව්‍ය ගැණුම් ගිණුමෙහි ශේෂය රු. 2,032,503 ක් අඩුවෙන් දක්වා තිබුණි. තවද වැටුප් හා වේතන රු. 542,242 ක් වැඩියෙන්ද, පොදු කාර්යය වියදම රු. 1,490,261 ක් වැඩියෙන්ද ගිණුම්වල දක්වා තිබුණි.

(ච) අනතුරට පත් කැබ් රථයක අලාභ හානි වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් 2013 දෙසැම්බර් මස ලැබී තිබුණු චෙක්පතක් බැංකු ගත නොකර 2014 මාර්තු 19 දින ආපසු යවා තිබුණි. රු. 5,139,050 ක් වූ චෙක්පතේ වටිනාකම 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂයක් ලෙස ණයගැතියන් යටතේ ගිණුම්ගත කර තිබීමෙන් ණය ගැතියන් සාවද්‍ය ලෙස එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඡ) අනුරූ නිෂ්පාදන අලවියෙන් ලද ලාභය ගණනය කිරීමේදී නිෂ්පාදන පොදු කාර්යය පිරිවැය ගලපා ගිණුම්වල දක්වා නොතිබුණි. අනුරූ ද්‍රව්‍ය පිරිවැය හා සෘජු ශ්‍රම පිරිවැය පමණක් ගැලපීමෙන් අනුරූ අලවියෙන් ලද දායකය ගණනය කර රු. 8,032,135 ක් මුලා ප්‍රකාශනවල ආදායම් යටතේ දක්වා තිබුණි. එසේ වුවද සටහන් අංක 11 ට අනුව අනුරූ නිෂ්පාදන පරිත්‍යාග ගැලපීමේදී එහි ඇතුළත් පොදු කාර්යය පිරිවැය රු. 1,490,261 ක්ද ගලපා තිබීමෙන් අනුරූ අලවියෙන් ලද දායකය රු. 1,490,261 ක් අඩුවෙන් අනුරූ ආදායම් යටතේ දක්වා තිබුණි.

(ට) තිස්සමහාරාම ව්‍යාපෘතියේ 2013 වර්ෂයේ අබලි භාණ්ඩ වෙන්දේසියකදී ලැබී තිබූ රු. 140,660 ක මුදල 2013 දෙසැම්බර් 31 දිනට ගිණුම්වලට ගෙන නොතිබුණු අතර එය 2014 වර්ෂයේදීද ගිණුම්වල සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඨ) 2013 වර්ෂයේදී මෝටර්රථ ගිණුමට හර කර උපචිත ගිණුමට බැර කර තිබූ රු. 1,479,975 ක් වූ මෝටර් රථ වැඩි දියුණු කිරීමේ වටිනාකම සඳහා සමාලෝචිත වර්ෂයේ මුදල් ගෙවීමේදී උපචිත ගිණුම හර කරනු වෙනුවට නැවත මෝටර් රථ ගිණුමට හර කර තිබුණි. මේ නිසා වර්ෂයේ මෝටර් රථ වටිනාකම රු. 1,479,975 ක් වැඩියෙන් පෙන්නුම් කරන අතර උපචිත ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණන සඳහා ඉදිරිපත් නොකෙරුණි.

| | විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (අ) | විශේෂ අරමුදල් ව්‍යාපෘති 10 ක් | 8,803,143 | එක් එක් අරමුදලට අදාල තොරතුරු ඇතුළත් ලිපිගොනු හා උපයෝගී ලියවිලි |
| (ආ) | විදේශ අරමුදල් ව්‍යාපෘති 3 ක් | 1,969,612 | - එම - |
| (ඇ) | සමුච්චිත ලාභයට හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයට කර තිබුණු ගැලපීම් | 59,331,279 | ගැලපීම් සිදු කල ආකාරය හා ගැලපීම් විස්තර |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කහවිල්ගොඩ පුරාණ විහාරයේ ජාතික උරුම උයන භාරය වෙත ගෙවීම් | 30,500,000 | පිරිවැය ඇස්තමේන්තු, ප්‍රමාන පත්‍ර, ඉදිකිරීම්වලට අදාල ගෙවීම් වවුචර්, රිසිට්පත්, බිල්පත් ආදිය, සැලසුම්, කලවැඩ වාර්තා, ඉංජිනේරු සහතික |
| (ඉ) | සී/ස සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් සමාගමේ සේවකයින්ට වැටුප් ගෙවීම් | 167,911,290 | සමාගම මගින් ඉටුකරවාගත් සංරක්ෂණ කටයුතු සැලසුම්, ඇගයීම් වාර්තා, කලවැඩ වාර්තා ගිවිසුම් ආදිය |

2.2.6 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ස්ථිර සේවකයින් වෙත ලබාදී තිබු වසර 6 කට වඩා පැරණි රු. 32,366 ක ආපදා ණය ශේෂ එකතුවක් හා ස්ථිර කාර්ය මණ්ඩලයේ නොවන කම්කරු සේවකයින්ගෙන්අයවිය යුතු වසර 7 කට වඩා පැරණි රු. 180,389 ක ආපදා ණය ශේෂ එකතුවක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය නොවී පැවතුණි.

(ආ) ජංගම වත්කම් යටතේ ලැබිය යුතු ශේෂ ලෙස දක්වා ඇති වර්ෂ 6 කට වඩා පැරණි රු. 1,245,900 ක්වූ උත්සව හා විශේෂ අත්තිකාරම් ශේෂ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනටත් අයනොවී පැවතුණි.

(ඇ) වර්ෂ 17 කට වැඩි කාලයක සිට අය නොවී පවතින රු. 153,784 ක්වූ ණයගැති ශේෂ 05 ක් හා වර්ෂ 5 කට වැඩි කාලයක සිට අය නොවී පවතින රු. 75,300 ක ණයගැති ශේෂයක් අයකර ගැනීමට කටයුතු නොකර දිගින් දිගටම ගිණුම්වල දක්වා තිබුණි.

(ඈ) සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයෙන් අය නොවී වර්ෂ 3 කට වඩා වැඩි කාලයක සිට පවතින රු. 772,577 ක් හා වර්ෂ 05 කට වඩා පැරණි රු. 20,598 ක් අයකර ගත නොහැකිව ගිණුම්වල තවදුරටත් දක්වා තිබුණි.

(ඉ) ව්‍යාපෘති 02 ක් වෙත ලබාදී තිබු රු. 1,025,420 ක අත්තිකාරම් මුදලක් වර්ෂ 02 කට වඩා වැඩි කාලයක සිට නිරවුල් නොවී පවතින අතර, සීගිරිය ව්‍යාපෘතිය වෙත ලබාදී තිබු රු. 343,329 ක අත්තිකාරම් මුදලක්ද වර්ෂ 05 කට වැඩි කාලයක සිට නිරවුල් නොවී ලැබිය යුතු ගිණුම් ශේෂ යටතේ දක්වා තිබුණි.

(ඊ) කාර්යය මණ්ඩලය වෙත ලබාදී තිබු රු. 79,924 ක අත්තිකාරම් ශේෂයක් වර්ෂ 5 කට වැඩි කාලයක සිට අය නොවී පවතින අතර වර්ෂ 8 කට වැඩි කාලයක සිට පවතින රු. 44,534කළසාවි තැන්පතු ශේෂයක්ද තවදුරටත් අය නොවී පැවතුණි.

(උ) 2014 දෙසැම්බර් 31 දින වන විට පැවති ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකමින් වර්ෂ 05 කට වඩා පැරණි හඳුනා නොගත් ගෙවිය යුතු ශේෂ වටිනාකම රු. 397,019 ක් විය. මෙම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.7 **නීති, රීති රෙගුලාසිවලට අනුකූල නොවීම**

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | විස්තරය |
|---|---|---|
| (අ) | **1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනත** | පනතේ 8 වැනි වගන්තිය අනුව අරමුදලේ මුදල් ණය පදනම මත ලබා දිය නොහැකි වුවත් කහවිල්ගොඩ ජාතික සංකල්ප කෞතුකාගාරය ඉදිකිරීම් සඳහා රු. මිලියන 30.5 ක් ජාතික උරුම උයන භාරය වෙත ලබාදී තිබුණි. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| (i) | XLVIII පරිච්ඡේදයේ 29.1 වගන්තිය | යම්කිසි නිලධාරියකු විසින් බල පවත්වන නීති රීති හා රෙගුලාසි අනුව කටයුතු නොකිරීමෙන් යම් විෂමාචාරයක් හෝ අක්‍රමිකතාවයක් සිදු කර ඇති බවට විගණකාධිපති වාර්තාවක් වාර්තාවක් මගින් පෙන්වාදී ඇති අවස්ථාවන්හි අදාල නිලධාරියාට එරෙහිව වහාම විනය පියවරක් ගත යුතු වුවත් හිටපු ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයකු එකම කාලය තුළ ආයතන දෙකක සේවය කර වර්ෂ 9 ක් සඳහා අරමුදලින් රු. 6,330,453 ක් වැටුප් හා දීමනා ලබා ගැනීමසම්බන්ධව විනය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. |
| (ii) | XLVII (8) (1) හා 8.2 ඡේදය | ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි සංග්‍රහයෙහි දැක්වෙන විධිවිධාන සහ රාජ්‍ය සේවා කොමිෂමේ විධිවිධාන මෙන්ම භාණ්ඩාගාර චක්‍රලේඛ ස්ථාවර නියෝග හා උපදෙස්වලට පටහැනිව කටයුතු කරන නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතු වුවත්, යාපහුව ව්‍යාපෘතියේ සංරක්ෂණ කටයුතු |

| | | |
|---|---|---|
| | | සඳහා රු. 1,163,525 ක් වැයකර නීතිවිරෝධි දැව මිලට ගැනීමට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව කටයුතු කර නොතිබුණි. |
| (iii) | II පරිච්ඡේදයේ 1.10 වගන්තිය | කැණීම් පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරිනියකට ව්‍යාපෘති කළමනාකරු II හා I තනතුරු සඳහා උසස්වීම් 2010 පෙබරවාරි 22 හා 2011 අගෝස්තු 09 සිට බල පැවැත්වෙන පරිදි පෙරදාතම් කර 2012 මැයි 06 හා 2013 ජනවාරි 07 දින ලබාදී තිබුණි. පත්වීම් පෙරදාතම් කිරීම සඳහා ආයතන අධ්‍යක්ෂගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (iv) | XLVII පරිච්ඡේදයේ (1) (1) වගන්තිය | රාජ්‍ය මුදල් හෝ දේපළ පෞද්ගලික කටයුතු සඳහා යොදවාගත නොහැකි වුවත් මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හා පවුලේ සාමාජිකයන් විසින් රත්මලාන සිට යාපහුව, සීගිරිය, කුරුණෑගල, දඹදෙණිය හා නැවත රත්මලාන දක්වා යාමට ගුවන් හමුදා යානයක් යොදාගෙන ඒ සඳහා අරමුදලින් රු. 850,067 ගෙවා තිබුණි.මේ සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා නොතිබුණි. |
| (ඇ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) | මුදල් රෙගුලාසි අංක 396 (ඈ) ඡේදය | ගෙවීම සඳහා නිකුත් කරන ලද නමුත් ඉදිරිපත් කර නොතිබු චෙක්පත්වලින්, නිකුත් කර මාස හයකට වඩා පැරණි චෙක්පත් අවලංගු කළ යුතු වුවත් අරමුදල විසින් මාස 06 ඉක්මවූ රු. 110,908 ක් වටිනා චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 315 (1) , 880 | මුදල් භාරව කටයුතු කරන නිලධාරීන් වෙතින් ඇප සුරක්ෂිත ලබාගත යුතු වුවත් දෛනිකව රු. මිලියන 2 කටවැඩි ආදායමක් උපයන සීගිරිය ව්‍යාපෘතියේ ප්‍රවේශ පත්‍ර අලෙවිකරුවන් වෙතින් එසේ සුරක්ෂණ ලබාගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 237 (අ) | කිසියම් කොන්ත්‍රාත්තුවක් සඳහා ගෙවීම් කිරීමට පෙර එම කාර්ය ගිවිසුම් ප්‍රකාරව නියමිත ප්‍රමිතියට අනුව මනා නිමාවකින් කර ඇති බවට ඊට වගකිව යුතු අධීක්ෂණ නිලධාරියෙකු විසින් සහතිකයක් ලබාදිය යුතු වුවත් සීගිරිය කෞතුගාර ගොඩනැගිල්ල තීන්ත ආලේප කිරීමේ කාර්යය සඳහා එබඳු සහතිකයකින් තොරව නියමිත ප්‍රමිතියට නොතිබියදී රු. 1,397,000 ක් ගෙවීම් කර තිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 751 (4) | තොග සටහන් පොත්, තොග කාඩ්පත්, බඩු ලේඛන යන ආදිය සමඟ සසඳා පහසුවෙන් හා ක්ෂණිකව හරිවැරදි බැලිය හැකි පරිදි භාරයේ තිබෙන භාණ්ඩ ක්‍රමානුකූලව පිළියෙල කර තැබිය යුතු වුවද සීගිරිය ව්‍යාපෘතියේ ගබඩා භාරකරු විසින් ගබඩා භාණ්ඩ පිළිබඳ නඩත්තු කරනු ලබන ලේඛන ඒ අනුව නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 751 වගන්තිය | රජයේ ආයතනවලට ලැබෙන සියලුම භාණ්ඩ වහාම බඩු ලේඛන පොතෙහි හෝ ගබඩා ව්‍යවස්ථාවල නියමිත වෙනස් සටහන් පොත්වල ඇතුළත් කල යුතු වුවත් සීගිරිය ව්‍යාපෘතියේ "මැටිකළය" ප්‍රදර්ශනය සඳහා පැවති උත්සවයේදී මිලදීගෙන තිබුණු රු. 570,455 ක් වටිනා භාණ්ඩ අයිතම 7 ක් බඩුලේඛණ පොත්වලට ඇතුළත් කර නොතිබුණි. |
| (vi) | මුදල් රෙගුලාසි 685 වගන්තිය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1 වන පරිච්ඡේදය | සැම විටකදීම වැඩ හා සේවාවන් ටෙන්ඩර් පටිපාටිය මගින් මහජන තරඟයට ඉදිරිපත් කල යුතු වුවද සීගිරිය ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 3,176,708 ක් වැය කර අඩි 80 x 40 ප්‍රමාණයේ ජංගම පැරබොලික් ප්‍රදර්ශන කුටියක් මිලට ගැනීමේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | **2006 අංක 9 දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | |
| (i) | 7 , 8 වගන්තිය | සීගිරි ව්‍යාපෘතියේ අභ්‍යන්තර මාර්ගවල ඇතිරීම සඳහා බොරළු මිලදී ගැනීමේදී මිල ගණන් කැඳවීම ටෙන්ඩර් මණ්ඩල අනුමැතියකින් තොරව සිදු කර තිබූ අතර ආයතනයේ ලියාපදිංචි නොවූ හා ව්‍යාපාර නාම පනත යටතේ ව්‍යාපාර ලියාපදිංචි කර නොමැති සැපයුම්කරුවන් වෙතින් සීමිත මිල ගණන් කැඳවීම සිදු කර රු. 1,718,725 කට ටෙන්ඩර් ප්‍රදානය කර තිබුණි. |
| (ii) | 3.4.3 හා 3.9.4 වගන්තිය | සීමිත මිල කැඳවීම ආයතනයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් / සැපයුම්කරුවන්ගෙන් සිදු කල යුතු වුවද සීගිරිය කෞතුකාගාරයේ තීන්ත ආලේප කිරීමේ කොන්ත්‍රාත්තුව රු. 1,397,000 කට ව්‍යාපෘතියේ ලියාපදිංචි නොවූ කොන්ත්‍රාත්කරුවකු වෙත පවරා තිබුණි. |
| (iii) | 5.3.13 (අ) වගන්තිය | කොන්ත්‍රාත්තුවක් සඳහා මිල ගණන් කැඳවීමේදී ආපසු ගෙවනු ලබන ඇප තැන්පත් මුදල ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 1 ක් වුවද සීගිරිය කෞතුකාගාර ගොඩනැගිල්ල තීන්ත ආලේප කිරීම සඳහා කොන්ත්‍රාත්කරු තෝරා ගැනීමේ දී එම ඇප තැන්පතුව රු. 4000 කට සීමා කර මිලගණන් කැඳවා තිබුණි. |
| (iv) | 5.4.6 වගන්තිය | කොන්ත්‍රාත්තුවක් සඳහා ගෙවීම් කිරීමේදී ඉටුකළ වැඩ වටිනාකමෙන් සියයට 10 කට නොඅඩු මුදලක් රඳවුමක් වශයෙන් දෝෂ වගකීම් කාල සීමාව අවසන් වන තුරු තබාගත යුතු අතර ඒ මගින් අඩුපාඩු හා දෝෂ නඩත්තු කාලය තුළ ඉටුකර ගත හැකි නමුත් ඉහත කොන්ත්‍රාත්තුවට අදාල එකී මුදල රඳවාගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (v) | 4.3.1 , 5.2.1 , 5.3.1 වගන්තිය | සීගිරිය ව්‍යාපෘතියේ සනීපාරක්ෂක සේවාව සැපයීම කොන්ත්‍රාතුව රු. 3,468,000 ක වාර්ෂික ගාස්තුවකට පැවරීමේදී මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකසා නොතිබීම, සියලු වැදගත් තොරතුරු ලංසු ලේඛන තුළ ඇතුළත් කර නොතිබීම, ටෙන්ඩර් ලියවිලි, පිරිවැය ඇස්තමේන්තුව හා ඉදිරිපත් වූ ලංසු තාක්ෂණික ඇගැයීම් කමිටුව වෙත ඉදිරිපත් නොකිරීම. |
| (vi) | 6.2.2 වගන්තිය | ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 14 ක කාලයක් ලබාදී නොතිබීම වැනි අක්‍රමිකතා නිරීක්ෂණය විය. |
| (vii) | 2.7.7 වගන්තිය | ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන් ආයතන ප්‍රධානියා විසින් එම අධිකාරි බලය යටතේ විධිමත් පරිදි පත්කිරීම කර නොතිබීම. |
| (viii) | 6.3.1 වගන්තිය | ලංසු මුද්‍රා තබන ලද කවරයක් තුළ බහා ලබා ගැනීමට කොන්දේසි පනවා නොතිබීම වැනි අවිධිමත් හා විනිවිදභාවයෙන් තොර සිදුවීම් නිරීක්ෂණය විය. |
| (ix) | 2.6.7 ඡේදය | භාණ්ඩ හෝ සේවා ප්‍රසම්පාදනයේදී අවශ්‍යතාවය පිළිබඳ ඇගැයීමක් සිදුකල යුතු වුවත් රු. 15,576,656 ක් වැයකර “අපේ උරුමය” නමින් ශ්‍රව්‍ය දෘශ්‍ය වාර්තාමය වැඩසටහනක් නිෂ්පාදනය කිරීමේදී එහි අවශ්‍යතාවය හා අපේක්ෂිත අරමුණු පිළිබඳ ඇගැයීමක් සිදුකර නොතිබුණි. |
| (ඉ) | **2003 ජුනි 02 දිනැති PED/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදය** | ආයතන සතු සම්පත් ජේඛිය අමාත්‍යාංශයට හෝ කිසිදු රාජ්‍ය ආයතනයකට ලබා නොදිය යුතු බව දක්වා තිබුණද සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හා ටවර්හෝල් රඟහල පදනම වෙත රු. 1,000,000 බැගින් මධ්‍යම සංස්කෘති අරමුදලෙන් මුදල් ලබාදී තිබුණි. |

(ඊ) **2011 පෙබරවාරි 11 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/57 6 ඡේදය**

අරමුදලේ අධ්‍යක්ෂ ජනරාවල්වරයාගේ අනුමැතිය මත විවිධ බාහිර පාර්ශවයන් වෙත පිරිවැය රු. 5,917,937 ක්වූ අනුරූ නිෂ්පාදන, ප්‍රකාශන තොග සහ මුද්‍රණ ද්‍රව්‍ය පරිත්‍යාග වශයෙන් ලබාදී තිබුණි. මේ සඳහා චක්‍රලේඛ උපදෙස් පරිදි මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර 2014 අයවැයෙන් ප්‍රතිපාදන සලසාගෙනද නොතිබුණි.

(උ) **මැතිවරණ කොමසාරිස්ගේ අංක PRE/2015/19/ALLD/177 හා 2015 ජනවාරි 02 දිනැති චක්‍රලේඛය සහ අංක PRE/2015/43 හා 2014 නොවැම්බර් 22 දිනැති චක්‍රලේඛය**

2 ඡේදය

මැතිවරණයක් පවත්වනු ලබන කල සීමාව තුළ රජයට, යම් රාජ්‍ය සංස්ථාවකට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයකට අයත් නිශ්චල හෝ චංචල දේපලක් දේශපාලන පක්ෂ අපේක්ෂක ප්‍රවර්ධනය හෝ වළක්වාලීම සඳහා යොදා නොගත යුතු බව දක්වා ඇතත් ඊට පටහැනිව අරමුදලේ ජංගම ප්‍රදර්ශන කුටිය ජනාධිපතිවරණ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා හිටපු සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යවරයාගේ නිවසේ මාස 03 ක කාලයක් රඳවා තිබුණි.

<u>ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>

(අ) 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල පනතේ 7 වන වගන්තිය අනුව සංස්කෘතික කටයුතු විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා නිල බලයෙන්ම මධ්‍යම සංසකෘතික අරමුදලේ ප්‍රධාන පරිපාලන නිලධාරියා වේ. මේ තනතුර වෙනුවෙන් දීමනාවක් ගෙවීම සඳහා පනත මගින් ප්‍රතිපාදන සලසා නොතිබුණද අරමුදල විසින් ලේකම්වරයාගේ මාසික වැටුපෙන් සියයට 33 1/3 ක් වන පරිදි දීමනාවක් මාසිකව ගෙවා තිබූ අතර 2014 වර්ෂයේදී ගෙවන ලද මුළු මුදල රු. 241,356 ක් විය. මේ සඳහා ආයතන සංග්‍රහයේ ix පරිච්ඡේදයේ 1.2 වගන්තිය හා 1999 මැයි 04 දිනැති අංක 374 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ආයතන අධ්‍යක්ෂකගේ හා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොතිබුණි.

(ආ) ලැබිය යුතු ශේෂ ලෙස වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එනු ලැබූ විවිධ තැන්පත් ශේෂ 09 ක එකතුව රු. 152,252 ක්ද, වැටුප් අත්තිකාරම් ශේෂ 03 ක එකතුව රු. 141,791 ක් හා මුදල් වංචාවන් 8 ක වටිනකම රු. 1,472,848 ක්ද වශයෙන් මුළු එකතුව රු. 1,791,507 ක් 2012 වර්ෂයේදී බොල්ණය වශයෙන් ගිණුම්වලින් කපාහැර තිබුණි. මේ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) සීගිරිය ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරුගේ ප්‍රසම්පාදන සීමාව රු. මිලියන 2 ක් වුවද එම ව්‍යාපෘතියේ 2014 සනීපාරක්ෂක සේවාව සපයා ගැනීමේ ටෙන්ඩර්යේ මුළු පිරිවැය රු. 3,648,000 කි. ඒ අනුව මෙම ප්‍රසම්පාදනය ප්‍රධාන කාර්යාලය මගින් මිල ගණන් කැඳවා කලයුතු වුවත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධානවලට පටහැනිව ව්‍යාපෘති කළමනාකරු විසින් මෙම ටෙන්ඩර් කැඳවීම හා ප්‍රදානය කිරීම දක්වා සියලු කටයුතු සිදුකර තිබුණි.

## 03. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් වලින් රු.479,462,969 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ ඊට අනුරූපී අතිරික්තය වූ රු.302,069,090 හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.177,393,879 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී අරමුදලේ මෙහෙයුම් වියදම් රු. 313,121,676 කින් වැඩිවී තිබුණද ඊට පටහැනිව සංචාරක ප්‍රවේශපත් අලෙවි ආදායම රු. 451,703,919 කින් වැඩිවීම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 3.2 <u>විග්‍රාහත්මක මූල්‍ය සමාලෝචනය</u>

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව අනෙකුත් සංස්කෘතික ක්‍රියාකාරකම් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 115,677,464 ක් වැයකර තිබුණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී එම වියදමේ වැඩිවීම සියයට 86 ක් එනම් රු. 53,332,548 ක් විය. මේ යටතේ පන්සල් නවීකරණය හා පෙරහැර සඳහා අනුග්‍රහක ආධාර ලබාදීම ප්‍රධාන වශයෙන් සිදුකර තිබූ අතර ලබාදෙන මුදල් ඒ සඳහාම යොදවන බවට සහ අදාල කාර්යයන් නිසි පරිදි ඉටුකර ඇති බවට තහවුරු කර ගැනීමේ ක්‍රමවේදයක් නොවුණි. මෙම ආධාර මුදල් ලබාදීම සඳහා ප්‍රමුඛතා ලැයිස්තුවක්, නිර්නායකයක්, සැලැස්මක් හෝ ඇස්තමේන්තුවක් වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි. 2014 වර්ෂයේදී මෙම වියදම් විෂයය සඳහා අරමුදලේ අයවැය ඇස්තමේන්තුව අනුව රු. මිලියන 100 ක් ඇස්තමේන්තු කර තිබුණද මූල්‍ය ප්‍රකාශන අනුව එම ප්‍රතිපාදන ඉක්මවා රු. 15,677,464 ක් වැයකර තිබුණි. එම වැඩිවීම අයවැය ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 15.68 ක් විය.

4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

4.1 <u>කාර්යසාධනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) <u>ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර ඇස්තමේන්තු සකසා තිබුණද ක්‍රියාත්මක නොවූ කාර්යයන්</u>

2014 වර්ෂය තුළදී නිම කිරීමේ අපේක්ෂාවෙන් ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කර ඇස්තමේන්තු සකසා තිබූ කැණීම් වැඩබිම් 6 ක ඇස්තමේන්තුගත පිරිවැය රු. 18,611,152 ක් වූ වැඩ ඒකක රු. 7,622 ක්ද, සංරක්ෂණ වැඩබිම් 22 ක ඇස්තමේන්තු පිරිවැය රු. 28,755,710 ක් වූ වැඩ ඒකක රු. 61,088 ක්ද වර්ෂය තුළ ආරම්භ කර හෝ නොතිබුණි. ඉන් කිහිපයක් පහත දැක්වේ.

| ව්‍යාපෘතිය හා වැඩබිම | කැණීම් | | සංරක්ෂණ | |
|---|---|---|---|---|
| | ඒකක ගණන | ඇස්තමේන්තුගත පිරිවැය රු. | ඒකක ගණන | ඇස්තමේන්තුගත පිරිවැය රු. |
| සීගිරිය - Outer Moat (Western Section) | 4514 | 9,034,500 | - | - |
| නුවර - Improvement to display of queens' Museum (Contract) | 927.39 | 4,636,950 | - | - |
| තිස්මහාරාම - Research Excavation at Alu Lena | 534 | 1,610,152 | - | - |
| දඹදෙණිය - Excavation of the ancient mound at Ruvangiri Kanda Raja Maha Vihara | 736.20 | 1,477,400 | - | - |
| පඬුවස්නුවර - Excavation of Bamunumulla Stupa | 698 | 1,449,900 | - | - |

| | | | | |
|---|---|---|---|---|
| <u>ජේතවනාරාමය -</u> | | | | |
| Paving in front of the Museum | - | - | 261 | 2,449,125 |
| <u>පොළොන්නරුව -</u> | | | | |
| Inner City Western Boundary wall | - | - | 1803 | 10,124,446 |
| Eastern Stupa Including Landscaping | - | - | 250 | 1,004,907 |
| <u>යාපහුව -</u> | | | | |
| Kadawala Jampita Vihara | - | - | 234 | 1,118,755 |
| <u>කුරුණෑගල -</u> | | | | |
| Roof of the Preaching Hall, Sri Gangaramavihara | - | - | 265 | 3,332,947 |
| | ----------- | ---------------- | ------------ | ------------- |
| | 7409,59 | 18,208,902 | 2813 | 18,030,180 |
| | ======= | ========== | ======= | ======== |

(ආ) <u>භෞතික හා මූල්‍ය කාර්යසාධනය ප්‍රමාණවත් නොවීම</u>

(i) ව්‍යාපෘති 11 ක කැණීම් හා සංරක්ෂණ වැඩබිම් 24 ක් සඳහා වැඩ ඒකක 19,422 ක් 2014 වර්ෂය තුළදී නිම කිරීමට සැලසුම් කර රු. 88,744,470 ක් ඇස්තමේන්තු කර තිබුණද 2014 දෙසැම්බර් 31 දිනට නිම කර තිබුණේ වැඩ ඒකක 2657 ක් පමණි. ඒ සඳහා තථ්‍ය වියදම රු. 6,565,697 ක් වූ හෙයින් භෞතික හා මූල්‍ය කාර්ය සාධනය පිළිවෙලින් සියයට 13 ක් හා සියයට 7 ක් වැනි ඉතා අඩු මට්ටමක පැවතුණි.

(ii) 2014 වර්ෂය අවසාන වන විට කැණීම් වැඩබිම් 105 ක්ද සංරක්ෂණ වැඩබිම් 196 ක්ද වශයෙන් මුළු වැඩබිම් 301 ක් නිම කිරීමට සැලසුම් කර තිබුණද වැඩබිම් 48 ක පමණක් වැඩ අවසන් කර තිබුණි. වැඩබිම් 253 ක් නිම කර නොතිබුණද ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබූ හා ඇස්තමේන්තු නොකළ වෙනත් වැඩ ඒකක ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා වියදම් දැරීම හේතුවෙන් නිම කල වැඩ ඒකක ප්‍රගතිය සියයට 65 ක් වන අතර ඒහි මූල්‍ය ප්‍රගතිය සියයට 54 ක් විය.

(ඇ) <u>ඇස්තමේන්තුගත වියදම හා තථ්‍ය වියදම සැසඳීම</u>

2014 වර්ෂය තුළදී ව්‍යාපෘති 15 ක නිම කිරීමට සැලසුම් කර තිබූ වැඩබිම් 301 ක් සඳහා ඇස්තමේන්තුගත ද්‍රව්‍ය පිරිවැය රු. 210,722,168 ක් වූ අතර සෘජු ශ්‍රම පිරිවැය රු. 367,698,199 ක් විය. එසේ වුවද 2014 දෙසැම්බර් 31 දිනට සත්‍ය වශයෙන් වැයකර තිබුණේ ඇස්තමේන්තුගත ද්‍රව්‍ය පිරිවැයෙන් සියයට 24 ක් එනම් රු. 52,177,452 ක් සහ ඇස්තමේන්තුගත සෘජු ශ්‍රම පිරිවැයෙන් සියයට 110 ක් එනම් රු. 402,875,598 වේ. මේ අනුව 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති වැඩබිම් ක්‍රියාත්මක කිරීම තුළින් අත්පත් කර ගෙන තිබූ සියයට 53 ක් වූ රු. 470,208,517 ක සමස්ත මූල්‍ය කාර්යසාධනයේ සියයට 86 ක් සෘජු ශ්‍රමය සඳහා ගෙවනු ලබන වැටුප් හා දීමනා වෙනුවෙන් ගෙවා තිබුණි.

## 4.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) අරමුදල විසින් 2014 වර්ෂය සඳහා පාලක මණ්ඩල රැස්වීම් පවත්වා තිබුණේ 4 ක් පමණි. අවසන්වරට පාලක මණ්ඩල රැස්වීම පවත්වා තිබුණේ 2014 ජුනි 06 දිනදීය.

(ආ) දෛනිකව රු.මිලියන 3 ක පමණ ප්‍රවේශපත් අලෙවියක් සිදු වන සීගිරිය ව්‍යාපෘතියේ ප්‍රවේශපත් අලෙවි කවුළු තුළ ප්‍රවේශපත් අලෙවිකරු හා අලෙවි සහායක තනතුරු සඳහා කම්කරු ශ්‍රේණියේ නිලධාරීන් 5 දෙනෙකු වර්ෂ 3 කට වැඩි කාලයක සිට යොදවා සිටින අතර, මේ සඳහා නිත්‍ය තනතුරේ නිලධාරීන් යෙදවීමට අරමුදලේ කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කරන නිලධාරියකු එම කාලය තුලදීම මධ්‍යම සංස්කෘතික අරමුදලේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ලෙස කටයුතු කරමින් ආයතන සංග්‍රහයේ XXX පරිච්ඡේදයේ 2.1 වගන්තියේ විධිවිධාන වලට පටහැනිව එම ආයතන දෙකෙන්ම එකම කාලය තුල වැටුප් හා දීමනා ලබාගෙන තිබුණි. වර්ෂ 9 ක් සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් ලබාගත් මුළු මුදල රුපියල් 6,330,453 ක් බව විගණන වාර්තා මගින් හෙලිදරව් කර තිබුණද කළමණාකාරිත්වය විසින් නීතියට පටහැනිව ලබාගත් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධානවලට අනුව කැණීම් පරීක්ෂක I ශ්‍රේණියේ සිට ව්‍යාපෘති කළමණාකරු තනතුරු සඳහා පුරප්පාඩු පිරවීම සම්මුඛ පරීක්ෂණ කැඳවා සිදුකල යුතු වුවත් එබඳු පුරප්පාඩුවකින් තොරව කැණීම් පරීක්ෂක I ශ්‍රේණියේ නිලධාරිනියකට ව්‍යාපෘති කළමනාකරු තනතුරේ පත්වීම වැටුප් වර්ධක 13 ක්ද සමග ලබාදී තිබුණි.

(ඉ) අතපත්තු කාර්යාලය මගින් දින 14 කට වලංගු සංචාරක ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම නිසා සීගිරිය අවට මාර්ගෝපදේශකයන් අතර ප්‍රවේශපත්‍ර සංසරණය වන බව සීගිරිය ව්‍යාපෘතියේ කළමණාකරු විසින් අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපි මගින් දන්වා තිබූ නමුත් ඊට සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මේ නිසා සීගිරිය අවට ව්‍යාපාරික ස්ථානවල සමාන සංචාරක ප්‍රවේශපත්‍ර අලෙවියට තිබූ අවස්ථා හෙළිදරව් වී ඇතත් ඒ සම්බන්ධව අරමුදලේ කළමනාකාරීත්වය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඊ) යාපහුව ව්‍යාපෘතිය වෙත දැව ලබා ගැනීමේදී රජයේ අනුමත ලියාපදිංචි දැව කම්හල් හිමියන්ගෙන් හෝ දැව නියෝජිතයන් වෙතින් මිලට ගැනීම වෙනුවට බලපත්‍ර රහිතව දැව රඳවාගෙන තබා ඇති අයගෙන් මිලදී ගෙන තිබුණි. මේ අනුව 2014 වර්ෂයේදී රු. 1,163,525 ක් ගෙවා ලබාගත් දැව අධිකරණ භාරයට ගෙන තිබූ අතර විධිමත් ක්‍රමවේදයක් අනුව දැව ලබා ගැනීමට කටයුතු කර නොතිබීම ඒ සඳහා හේතුවී තිබුණි. තවද අරමුදලට ලබාගත්රු. 1,165,525ක් වටිනා දැව තොග වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව භාරයට ගැනීම හේතුවෙන් ඒ සඳහා ගෙවූ වටිනාකම අරමුදලට සිදුවූ අලාභයක් බව නිරීක්ෂණය වේ.

(උ) සීගිරිය ව්‍යාපෘතියේ කෞතුකාගාර ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීමේ කාර්යයේදී කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීම සඳහා මිල ගණන් කැඳවීම, ඇගයීම් කමිටු පත් කිරීම, ගිවිසුම් අත්සන් කිරීම ආදිය සම්බන්ධයෙන් විනිවිදභාවයෙන් කටයුතු කර නොතිබූ අතර අදාල කාර්යය නියමිත ප්‍රමිතියට සිදුකල බවට කිසිදු සහතිකයකින් තොරව රු.1,397,000 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට කටයුතු කර තිබුණි. මේ පිළිබඳව විගණන වාර්තා මගින් හෙළිදරව් කල නමුත් අරමුදලේ කළමනාකාරීත්වය ඒ පිළිබඳව කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.

(ඌ) 2014 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය කර ගෙන තිබූ ප්‍රධාන කාර්යාලයේ හා කාර්යාල ගබඩාවේ තැන්පත් කර තිබෙන අවලංගු කරන ලද හා මුද්‍රණයේදී දෝෂ සහිත වූ ප්‍රවේශ පත්‍ර 42706 ක ප්‍රමාණයක් විධිමත් අනුමැතියක් මගින් විධිමත් පරිදි ඉවත් කිරීම සඳහා කටයුතු සිදුකර නොතිබුණි. විධිමත් පරිදි මෙම ප්‍රවේශ පත්‍ර ඉවත් නොකිරීමෙන් ඉදිරියේදී ප්‍රවේශ පත්‍ර වංචාවක් සිදුවීමට ඇති ඉඩකඩ බැහැර කල නොහැක.

(එ) පොළොන්නරුව ගල් විහාරයේ විද්‍යාධාර ලෙනට ඉහළින් පියස්සක් නිර්මාණය කිරීමේ කොන්ත්‍රාත්තුව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත පවරා තිබුණි. මෙම කාර්ය 2014 වර්ෂයේ අවසන් කර තිබුණද 2012 වර්ෂයේ දී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත කොන්ත්‍රාත්තුව පැවරීමේදී ගෙවා තිබූ රු. 1,427,866 ක් වූ සියයට 20 ක අත්තිකාරම් මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර එම මුදල නොපියවූ අත්තිකාරම් ලෙස ගිණුම්වලට ඇතුළත් කර තිබුණි.

4.3 **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

(අ) වාර්ෂික ඇස්තමේන්තුව මගින් ප්‍රතිපාදන වෙන්කර නොමැතිව ක්‍රියාකාරී සැලැස්මටද ඇතුළත් කර නොතිබූ සීගිරිය ව්‍යාපෘතියේ නිරිතදිග පොකුණ හා ගිණිකොනදිග පොකුණ සංරක්ෂණ කිරීම සඳහා රු. 2,618,607 ක් වටිනා ඇස්තමේන්තුවකින් රු. 1,294,562 ක් 2014 අගෝස්තු වන විට ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘතිය 2014 අගෝස්තු අවසන් වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණද එහි වැඩ කොටස් 2014 ඔක්තෝබර් තෙක් අවසන් කර නොතිබුණි. තවද මෙහි වැඩබිම් පරීක්ෂක වශයෙන් පුහුණුවන උපාධිධාරී නිලධාරියකු යොදවා තිබීම හා ඔහු යටතේ ස්ථිර කාර්ය මණ්ඩලයේ සේවකයන් යොදවා කාර්ය පැවරීමෙන් කටයුතු මන්දගාමීව සිදුවීම හා කාර්ය පිරිවැය ඉහළ යාම සිදුවී තිබුණි.

වැඩබිම්වල අධීක්ෂණ කටයුතු සඳහා සුදුසුකම්වලින් සමන්විත පළපුරුදු නිලධාරීන් සිටියදී පුහුණුවන උපාධිධාරී නිලධාරියකු අධීක්ෂණයට යොදවා තිබීම මගින් වගකීමක් සහිතව මෙම කාර්යය ඉටු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

4.4 **<u>මතභේදයට තුඩුදෙන ගනුදෙනු</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2011 ජූලි 21 දිනැති අංක DMS/E1/54/9/241 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව විධිමත් අනුමැතියකින් තොරව නව තනතුරු ඇතිකිරීම හා තනතුරුවල අනුමත සීමාව ඉක්මවා බඳවා ගැනීම් නොකරන ලෙස උපදෙස් දී තිබියදී ඊට පටහැනිව කටයුතු කරමින් සමාලෝචිත වර්ෂයේදී සහකාර අධ්‍යක්ෂ තනතුරු හයක්ද, ව්‍යාපෘති කළමනාකරු තනතුරු 03 ක්ද සඳහා අනුමත සංඛ්‍යාව ඉක්මවා පත්වීම් ලබාදී වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(ආ) 2013 ජුලි 01 දින ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අයත් බෙල් 12 දරන හෙලිකොප්ටර් යානය මගින් රත්මලාන, යාපහුව, සීගිරිය, කුරුණෑගල, දඹදෙණිය සහ ආපසු රත්මලාන දක්වා ගමන් කිරීම වෙනුවෙන් රු. 850,067 ක මුදලක් 2014 ජුනි 12 දින මධ්‍යම සංස්කෘතික අරමුදලින් ගෙවීම් කර තිබුණි. අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් හා චිත්‍රපට අධ්‍යක්ෂවරයකු ඇතිකර ගත් ගිවිසුම් පරිදි " අපේ උරුමය " වාර්තාමය චිත්‍රපටියේ රූගත කිරීම් සඳහා මෙම ගමන යොදාගෙන තිබුණද අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පවුලේ සාමාජිකයින්ද මෙම ගමනට සහභාගී වී තිබුණි.

(ඇ) සීගිරිය ව්‍යාපෘතිය මගින් එහි සේවකයින් යොදා කරගෙන ආ ව්‍යාපෘතියේ සනීපාරක්ෂක කටයුතු 2013 වර්ෂයේ සිට පෞද්ගලික ආයතනයක් වෙතින් කරගෙන යාමට අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියෙන් සිදුකර ලබාදී තිබූ අතර ඒ සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. මේ සඳහා අරමුදලට 2014 වර්ෂය වෙනුවෙන් රු. 3,468,000 ක අමතර පිරිවැයක් දැරීමට සිදුවී තිබූ අතර ආයතනයේ සිටින ස්ථිර සනීපාරක්ෂක කම්කරුවන්ට සේවයක් නොලබා වැටුප් හා දීමනා ගෙවීමට සිදුවී තිබුණි. තවද මෙම ටෙන්ඩරය ප්‍රදානය කිරීමට තෝරා ගත් පෞද්ගලික ආයතනය මෙම විෂයය සඳහා ව්‍යාපාර නාම පනත යටතේ ලියාපදිංචි ආයතනයක් නොවන බව නිරීක්ෂණය විය.

(ඈ) සීගිරිය කෞතුකාගාර ගොඩනැගිල්ල සඳහා තීන්ත ආලේප කිරීම සම්බන්ධයෙන් කරන ලද භෞතික පරීක්ෂාවේදී 2013 වර්ෂයේ එහි තීන්ත ආලේප කරන ලද වර්ග අඩි 25400 ප්‍රමාණයේ ස්ථාන පෙන්වීමට නොහැකි වූ අතර ඒවායේ ලබාගත් මිනුම් කිසිවක්ද නොතිබුණි. 2014 ජුලි 18 දින සීගිරි ව්‍යාපෘතියේ ප්‍රගති සමාලෝචන රැස්වීමට සංරක්ෂණ පරීක්ෂක විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව වර්ග අඩි 189,223ක් සඳහා තීන්ත ආලේප කිරීම ඇස්තමේන්තු කිරීමේදී කලින් ඉටුකල වර්ග අඩි 25,400 ක ප්‍රමාණය අඩු කර නොතිබීම හේතුවෙන් එම තීන්ත ආලේපය සිදුකර නොමැති බව හා ඒ වෙනුවෙන් කරන ලද රු. 1,397,000 ක් සාවද්‍ය ගෙවීමක් බව නිරීක්ෂණය විය. තවද 2014 ජුලි 18 දින ඉදිරිපත් කල ඇස්තමේන්තු අනුව වර්ග අඩි 1 ක තීන්ත ආලේප කිරීමට ඇස්තමේන්තුව රු. 15.60 ක් වුවද 2013 වර්ෂයේදී වර්ග අඩි 25,400 ක තීන්ත ආලේප කිරීම සඳහා වර්ග අඩි 1 කට රු. 55 ක් ගෙවා තිබීම හේතුවෙන් රු. 1,000,760 ක අලාභයක් සිදුවී ඇති බවද නිරීක්ෂණය විය.

(ඉ) සීගිරිය ව්‍යාපෘතියේ ආපනශාලාව නවීකරණය කිරීම සඳහා ටෙම්පර්ඩ් යුගල දොරවල් සවි කිරීම වෙනුවෙන් රු. 1,790,000 කට කොන්ත්‍රාත්තුව පවරා තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි මේ සඳහා විවෘත මිල ගණන් කැඳවීම සිදු කල යුතු වුවත් එසේ කර නොතිබුණි. තවද පිරිවිතර, නිර්මාණ සැලසුම් ආදී කිසිවක් ව්‍යාපෘතිය මගින් ඉදිරිපත් කර නොතිබූ අතර තාක්ෂණික ඇගැයීම් කමිටුවක නිර්දේශයද ලබා නොතිබියදී කිසිදු ප්‍රමිත සහතිකයකින් තොරව කොන්ත්‍රාත්තුව සඳහා සම්පූර්ණ මුදල් ගෙවා තිබුණි.

(ඊ) සීගිරිය ආරක්ෂක අංශයේ ලේඛන අනුව 2014 වර්ෂයේදී සීගිරිය ව්‍යාපෘතිය නැරඹීම සඳහා විදේශීය සංචාරකයින් 537,595ක් පැමිණ තිබූ නමුත් ප්‍රවේශ පත්‍ර අලෙවි කර තිබුණේ 526,908ක් පමණි. ඒ අනුව ප්‍රවේශ පත්‍ර නොමැතිව හෝ අක්‍රමවත් ආකාරයෙන් සංචාරකයින් 10,687 ක් සීගිරියට ඇතුල් වී තිබීම නිසා අරමුදලට ලැබිය යුතු රු.41,679,300 ක මුදලක් අහිමි වී තිබුණි.

(උ) රාජ්‍ය ළමා නාට්‍ය උළෙල සඳහා වූ වියදම් වෙනුවෙන් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම සංස්කෘතික අමාත්‍යාංශය වෙත ලබාදෙන ලද රු. 1,000,000 ක මුදල සංස්කෘතික අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත ගත නොකිරීම හේතුවෙන් අරමුදලට ලැබිය යුතු රු. 1,000,000 ක මුදල ඉදිරියේදී නොලැබී යාමට ඇති ඉඩකඩ බැහැර කළ නොහැකි බවත් මෙම මුදල ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා අරමුදල විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ බවත් නිරීක්ෂණය විය.

(ඌ) සීගිරිය ව්‍යාපෘතිය සඳහා ජංගම ප්‍රදර්ශන කුටියක් රු. 3,176,708 ක් වැය කර මිලට ගැනීමේදී සැලසුම් හා පිරිවිතර කිසිවක් සකස් කර නොතිබූ අතර සැපයුම්කරු තෝරාගත් ආකාරය අනාවරණය නොවුණි. සැපයුම්කරු වෙත නිල ඇණවුමක්ද නිකුත් කර නොතිබූ හෙයින් මෙම ගනුදෙනු විනිවිදභාවයෙන් යුතුව සිදු වී නොතිබූ බව නිරීක්ෂණය විය. තවද මෙම කුටිය අවස්ථා 5 කදී සංස්කෘතික හා කලා කටයුතු හිටපු ඇමතිවරයාගේ දේශපාලන රැස්වීම් සඳහා ලබාදී තිබූ අතර, එම අවස්ථාවලදී අරමුදලේ සේවකයන් හා වාහන එම ප්‍රදර්ශන කුටිය ප්‍රවාහනය, ස්ථානගත කිරීම හා ගැලවීම වැනි කටයුතු සඳහා යොදවාගෙන තිබුණි.

(එ) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ රු. 7,900,000 කට රක්ෂණය කර තිබූ 2013 වර්ෂයේදී අනතුරට පත් කැබ් රථයක් සඳහා අලාභහානි රක්ෂණ වන්දි ලෙස 2013 දෙසැම්බර් මස ඒවා තිබුණු රු. 5,139,050 ක් වූ චෙක්පත භාර නොගෙන රක්ෂිත වටිනාකම මත හිමිකම් ඉල්ලා 2014 මාර්තු 19 දින ආපසු යවා තිබුණි. රක්ෂණ සංස්ථාවේ 2015 ජනවාරි 28 දිනැති ලිපිය අනුව, හිමිකම් මුදලෙහි වෙනසක් සිදුකළ නොහැකි බව දන්වා චෙක්පත නැවත ඒවා තිබුණි. අනතුරට පත් මෙම කැබ් රථය සමඟ මිලදී ගෙන තිබූ අනිකුත් කැබ් රථවල 2014 වර්ෂයට අදාල නව රක්ෂිත වටිනාකම රු. 8,000,000 ක් බව නිරීක්ෂණය වූ හෙයින් රක්ෂිත වටිනාකම අනුව හිමිකම් ලබා ගැනීමට අරමුදල විධිමත් පරිදි කටයුතු කර නොතිබීමෙන් රු. 2,800,000 ක පමණ අලාභයක් අරමුදලට සිදුවී තිබුණි.

(ඒ) අරමුදලේ ප්‍රකාශන අංශය විසින් 2013 වර්ෂයේදී රු. 1,069,636 ක් වැයකර මුද්‍රණය කර තිබූ " මල්වතු විහාරවංශ මහනාහිමිවරුන් " ග්‍රන්ථයේ පිටපත් 1000 කින් ග්‍රන්ථ 901 ක් පරිත්‍යාග වශයෙන් ලබාදී තිබුණි. පරිත්‍යාග වශයෙන් ලබාදී තිබූ ග්‍රන්ථ 901 කින් රු. 953,884 ක් පිරිවැය වූ ග්‍රන්ථ 890 ක් සංස්කෘතික හා කලා කටයුතු විෂයභාර අමාත්‍යවරයා වෙත නිකුත් කර තිබූ අතර මෙම ග්‍රන්ථය අරමුදලේ අවශ්‍යතාවයක් මත මුද්‍රණය කර නොතිබූ බව නිරීක්ෂණය විය. තවද මෙය නිසි ප්‍රමිතියෙන් මුද්‍රණය කර නොතිබීමෙන් පිටු එකිනෙකට ඇලී භාවිතයට ගත නොහැකි පරිදි හානියට පත් වෙමින් පැවතුණි.

4.5 <u>දෘශ්‍ය අනුමිකතා</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) <u>" අපේ උරුමය" ශ්‍රව්‍ය දෘශ්‍ය වාර්තාමය වැඩසටහන</u>

(i) 2011 වර්ෂයේ සිට 2015 පෙබරවාරි 02 දක්වා මෙම කාර්යය සඳහා වරින්වර රු. 15,576,655 ක මුදලක් "ස්වර්ණ නිර්මාණ" ආයතනය වෙත ගෙවා තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.7 ප්‍රකාරව අවශ්‍යතාවය හා අපේක්ෂිත අරමුණු පිළිබඳ ඇගැයීමක් කර නොතිබුණි. තවද විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුළින් සැපයුම්කරු තෝරාගෙන නොතිබුණි.

(ii) වාර්තා වැඩසටහන් තුනක් පිළියෙල කිරීම සඳහා අවස්ථා තුනකදී මුළු එකතුව රු. 18,725,700 ක් වන ගිවිසුම් 3 කට "ස්වර්ණ නිර්මාණ" හිමිකරු සමග අධ්‍යක්ෂ ජනරාල්වරයා එළඹී තිබූ අතර ඒ සඳහා පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා නොතිබුණි.

(iii) 2011 ඔක්තෝබර් 21 දින එලඹි රු. 4,701,000 ක් වූ පළමු ගිවිසුම අනුව නියමිත කාලය තුළ DVD නිෂ්පාදනය කර භාරදී නොතිබියදී ගිවිසුමේ සඳහන් සම්පූර්ණ මුදල ගෙවා තිබූ අතර සැපයුම්කරුට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. 2012 දෙසැම්බර් 21 දින එලඹි දෙවන ගිවිසුම අනුව නියමිත කාලය තුළ කාර්යය නිමකර භාරදී නොතිබුණද ගෙවූ මුදල රු. 3,448,188 ක් මෙහිදී මාස 21 ඉකුත්වී හෝ තිබුණද DVD පට භාරදී නොතිබුණි. 2014 අගෝස්තු 19 දින රු. 11,488,700 කට එලඹි තෙවන ගිවිසුම අනුව නියමිත කාලය තුළ DVD නිෂ්පාදනය කර භාරදී නොතිබියදී ගිවිසුම්ගත මුදලෙන් සියයට 40 ක් එනම් රු. 4,595,480 ක් ගෙවා තිබුණි. ගිවිසුමේ කොන්දේසි අනුව නියමිත කාලය තුළ වැඩ අවසන් කර භාර නොදෙන්නේ නම් ගිවිසුම අවසන් කර මුදල් නොගෙවා සිටිය යුතු වුවද එසේ සිදුකර නොතිබුණි. ගිවිසුම අනුව මෙම නිර්මාණයේ පූර්ණ අයිතය මධ්‍යම සංස්කෘතික අරමුදල සතු වුවද සැපයුම්කරු විසින් එහි පටපත් ජාතික රූපවාහිනිය වෙත විකුණා මුදල් ලබාගෙන තිබුණි.

(iv) උඩු ගුවනේ රූගත කිරීම් සඳහා ගුවන් ගාස්තු ලෙස අවස්ථා තුනකදී රු. 3,448,388 ක් ගෙවා තිබුණද රු. 2,297,740 ක් ගෙවීම සඳහා ගුවන් හමුදා ඉන්වොයිසියක් හෝ බිල්පත් කිසිවක් නොමැතිව ගෙවීම් කර තිබුණි. තවද ගුවන් හමුදාව වෙත ගෙවනු වෙනුවට සැපයුම්කරු වෙත සෘජුවම ගෙවීම සිදුකර තිබුණි.

(ආ) <u>කහවිල්ගොඩ ජාතික උරුම සංකල්ප කෞතුකාගාරය ඉදිකිරීම.</u>

(i) ඉහත ඉදිකිරීම සඳහා ජාතික උරුම උයන භාරය නමින් වූ කිසිදු නීත්‍යානුකූල පදනමක් නැති ආයතනයක් සමග, වසර 3 ක් තුළ රු. මිලියන 60 ක මුදලක් මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් එම භාරය වෙත ණය පදනම මත ලබාදීම සඳහා 2014 පෙබරවාරි 19 දින ගිවිසුමකට එලඹි 2015 ජනවාරි 30 වන විට රු. මිලියන 30.5 ක් ගෙවීම් කර තිබුණි.

(ii) 1980 අංක 57 දරන මධ්‍යම සංස්කෘතික අරමුදල් පනතේ 8 වගන්තියට පටහැනිව කටයුතු කරමින් අරමුදලේ මුදල් ණය පදනම මත ලබාදී තිබූ අතර ඊට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවත් එය ලබාගෙන නොතිබුණි.

(iii) ඉදිකිරීම්වල සැලැස්මක්, ඇස්තමේන්තුවක්, ප්‍රමාන පත්‍රයක් හෝ ඉටුකර ලබන කාර්යභාරය, මුදල් වැය කරන ආකාරය පිළිබඳ විස්තරද කලවැඩ වාර්තා, ඉංජිනේරු

සහතික ආදිය ඉදිරිපත් කර නොතිබියදී, රු. මිලියන 30.5 ක මුදල මෙම භාරය වෙත මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් ගෙවා තිබුණි. මෙම මුදලින් රු. 18,811,046 ක් වැය කළ ආකාරය පිළිබඳ කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් කර නොවුණි.

(iv) මෙම භාරය නමින් පවත්වාගෙන යන මහජන බැංකු ශාඛාවෙන් රු. මිලියන 24.5 ක් 2015 ජනවාරි 30 වන විට ඉවත් කරගෙන තිබුණද එම මුදලේ වියදමට අදාල රිසිට්පත්, ගෙවීම් වවුචර් හා තහවුරු ලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි.

(v) මෙවැනි විශේෂිත ඉදිකිරීමක් සඳහා අවශ්‍ය රජයේ ආයතනවල අනුමැතීන් කිසිවක් ලබාගෙන නොතිබූ අතර ඉදිකිරීම් සිදු කරනු ලබන ඉඩමට අදාලව එහි හිමිකරු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවරා තිබියදී ඒ පිළිබඳවද නොසලකා මධ්‍යම සංස්කෘතික අරමුදලින් මුදල් නිදහස් කර තිබුණි.

(ඇ) <u>විදේශීය සංචාරක ප්‍රවේශපත් සමග නොමිලේ ලබාදීම සඳහා DVD සපයා ගැනීම</u>

සීගිරිය, පොළොන්නරුව හා අනුරාධපුර යන සිද්ධස්ථාන ඇතුළත් DVD ලක්ෂ 5 ක් සපයා ගැනීම සඳහා රු. 51,099,925 ක් චිත්‍රපට නිෂ්පාදනවරයකු වෙත ගෙවා තිබුණි. පහත කරුණු නිරීක්ෂණය විය.

(i) විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කිරීමෙන් තොරව මෙම ගනුදෙනුව සිදුකර තිබුණි. ඒ අනුව අවශ්‍යතාවය හා එහි ප්‍රතිලාභ පිළිබඳ ඇගැයීමක් සිදු නොකිරීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 ඡේදය පරිදි ප්‍රමාණවත් තරම් ප්‍රතිපාදන තිබෙන බවට තහවුරු කර නොගැනීම මෙන්ම ලංසු කැඳවීමට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා නොගැනීම, ප්‍රසම්පාදන කාල සටහන්, පිරිවිතර, සැලසුම්, ලංසු ලේඛන, පිරිවැය ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හා උපදේශකයින් පත් නොකිරීම, ලංසු ලේඛන තාක්ෂණික ඇගැයීම් කමිටුවක් විසින් අනුමත කර නොතිබීම වැනි විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරවීම් නිරීක්ෂණය විය.

(ii) අදාල කොන්ත්‍රාත්කරු විසින් පෙර නිපදවා තිබූ ඉහත සිද්ධස්ථාන ඇතුළත් වාර්තාමය චිත්‍රපටවල දර්ශන පරිගනක පිටපත් කිරීමක් තුළින් යලි සකසා නව නිර්මාණයක් ලෙසින් ඉදිරිපත් කර තිබීම පිළිබඳ අරමුදලේ අවධානය යොමු නොකර ඉහත මුදල සම්පූර්ණයෙන්ම ගෙවා තිබුණි.

(iii) ඉදිරිපත් වු අවම ලංසුව නොසලකා හැර උපරිම ලංසුව තෝරා ගැනීම නිසා අරමුදලට රු. 18,125,000 ක පාඩුවක් සිදුවී තිබුණි.

(iv) මෙම කොන්ත්‍රාත්කරු විසින් මෙම විෂයගත කරුණට අදාලව මීට පෙර පැවරු රු. 7,237,000 ක් වු කොන්ත්‍රාත්තු 2 ක ගිවිසුම් කඩකර තිබියදී ඔහු අසාධුලේඛනගත කිරීමෙන් බැහැරව නැවතත් කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි. මේ පිළිබඳව 2012 හා 2013 වර්ෂවල විගණකාධිපති වාර්තාවලද දක්වා ඇත.

(v) ලංසු සුරක්ෂණ හා කාර්යසාධන සුරක්ෂණ පිළිවෙලින් රු. 446,250 ක් හා රු. 2,281,250 ක් වශයෙන් අඩුවෙන් කොන්ත්‍රාත්කරුට වාසිදායක වන අයුරින් ලබාගෙන තිබුණි.

4.6 <u>ඌන උපයෝජිත වත්කම්</u>

(අ) අලහාන ව්‍යාපෘතියේ ගොඩගසා තිබෙන පැරණි උළු කැට 11,377 ක් වෙන්දේසි කිරීම හෝ අපහරණය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) සීගිරිය ව්‍යාපෘතියේ ගබඩා පරිශ්‍රය තුළ ගාල් කර තිබෙන ලොරි රථයක් වසරකට වැඩි කාලයක සිට භාවිතා කළ නොහැකිව අබලන් තත්වයේ පවතින අතර එය අළුත්වැඩියා කිරීම හෝ වෙන්දේසි කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) අරමුදල සතුව පවතින වාහන 15 ක් වසරකට වැඩි කාලයක් ප්‍රයෝජනයට නොගෙන අබලි වශයෙන් අනාරක්ෂිතව ගාල් කර තිබු අතර එම වාහනවලින් 8 ක් 2014 වර්ෂය සඳහා රක්ෂණය කිරීමද සිදුකර තිබුණි.

(ඈ) සීගිරිය ව්‍යාපෘති සඳහා අවශතාවයකින් තොරව 2014 වර්ෂයේදී ලබාගෙන තිබු රු. 3,176,708 ක් වටිනා ජංගම පැරබොලික් කුටිය සීගිරි ව්‍යාපෘතියේ පැවති “ මැටිකළය” ප්‍රදර්ශන උත්සවය සඳහා 2014 ජනවාරි මාසයේ භාවිතා කිරීමෙන් පසු අරමුදලේ අවශ්‍යතා සඳහා උපයෝගී නොවීමෙන් එය ඌන උපයෝජිත තත්වයට පත්ව තිබුණි.

(ඉ) සීගිරිය ව්‍යාපෘතිය සඳහා 2013 වර්ෂයේදී මිලට ගත් රු. 263.536 ක් වටිනා බොරළු කියුබ් 135.44ක් වර්ෂ එකහමාරක කාලයක් තුල අනාරක්ෂිතව එම පරිශ්‍රයේ ගොඩගසා තිබුණි.මෙම බොරළු තොගය කාර්මික නිලධාරීන් හෝ සංරක්ෂණ නිලධාරීන් කිසිවකු විසින් ඉල්ලා නොසිටි බව නිරීක්ෂණය වු අතර ව්‍යාපෘති කළමනාකරුගේ අවශ්‍යතා මත ගෙනවිත් ප්‍රයෝජනයකට නොගෙන ගබඩා කර තිබුණි.

4.7 **ආර්ථික නොවූ ගනුදෙනු**

(අ) සීගිරිය ව්‍යාපෘතියේ පැරණි ආපනශාලාව රු. 6,599,746 ක් වැය කර සම්පූර්ණයෙන්ම නිවීකරණය කරන ලද නව ගොඩනැගිල්ලකට ගෙන ගොස් තිබූ අතර නවීකරණය කරන ලද ආපනශාලාව 2014 වර්ෂය තුළදී පවත්වාගෙන යාම සඳහා පිටස්තර පුද්ගලයෙකුට පවරා තිබුණි. ව්‍යාපෘතියේ සේවක සුභසාධක සංගමය විසින් පවත්වාගෙන ගිය පැරණි ආපන ශාලාවෙන් මාසික රු. 24,000 ක බදු කුලියක් අයකර තිබුණද නව ආපනශාලාව පවත්වාගෙන ගිය පුද්ගලයා වෙතින් කිසිදු බදු මුදලක් 2014 වර්ෂය තුළ අයකර නොතිබූ අතර කිසිදු ගිවිසුමකටද එළඹී නොතිබුණි. තරඟකාරී මිල කැඳවීම මගින් ඉහළ මිලකට මෙම ආපනශාලාව බදු දිය හැකිව තිබුණිද ඒ සඳහා පියවර ගෙන නොතිබුණි. තවද ආපනශාලාවේ 2014 වර්ෂයේ විදුලි බිලද සීගිරි ව්‍යාපෘතිය මගින්ම ගෙවා තිබූ අතර නව පාර්ශවකරුට ආපනශාලාව පැවරීමෙන් පසු එහි විදුලි බිල සියයට 125 කින් පමණ ඉහළ ගොස් තිබුණි.

(ආ) පාලක මණ්ඩල පත්‍රිකා අංක 189 අනුව ප්‍රයෝජනයට ගත නොහැකිව තිබූ වාහන 17 ක් අලෙවි කිරීම සඳහා මිල ගණන් කැඳවීම වෙනුවෙන් 2014 ජුලි 11 දින පලකර තිබූ පුවත්පත් දැන්වීම් වෙනුවෙන් රු. 103,774 ක් වැය කර තිබුණි. නමුත් මෙම වාහන අලෙවි කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබීමෙන් මෙම වියදම අනාර්ථික තත්වයට පත්ව තිබුණි.

4.8 **හඳුනාගන්නා ලද පාඩු**

(අ) මධ්‍යම සංස්කෘතික අරමුදලේ ප්‍රයෝජනයට ගත නොහැකි වාහන 17 ක් අලෙවි කිරීම සඳහා 2014 ජුලි 11 දින ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පලකර තිබූ අතර ඉල්ලුම්කරුවන් 49 දෙනෙකුගෙන් ලැබී තිබූ මිල ගණන් 2014 අගෝස්තු 06 දින විවෘත කර තිබුණි. වාහන 15 ක තක්සේරු වටිනාකම රු. 6,110,000 වූ අතර ලැබී තිබූ වැඩිම ලංසුවට අනුව ලංසු වටිනාකම් එකතුව රු. 11,147,999 ක් විය. වැඩිම ලංසුවට වාහන අලෙවිකර ගැනීමේ හැකියාව තිබුණද ඒ අනුව වාහන අලෙවි නොකිරීම හේතුවෙන් 2015 ජනවාරි වන විට ඉල්ලුම්කරුවන් 34 දෙනෙකුගේ රු. 340,000 ක් වූ තැන්පත් මුදල් ඔවුන් ආපසු ලබාගෙන තිබුණි. මේ අනුව මෙම ටෙන්ඩරය අහෝසි කිරීමට අරමුදලට සිදුවී තිබුණි.

(ආ) අරමුදල විසින් පවත්වාගෙන යන අනුරූ පාසලේ අනුරූ නිෂ්පාදනය කරනු ලබන්නේ අලෙවිය සඳහා වේ. සමාලෝචිත වර්ෂය තුළදී අරමුණින් බැහැරව හා විධිවිධාන පරිදි ලබාගත යුතු අනුමැතියෙන් බැහැරව පරිත්‍යාග වශයෙන් බාහිර පාර්ශවයන් වෙනුවෙන් නිෂ්පාදනය කර භාරදී තිබූ අනුරූ නිෂ්පාදනවල මුළු පිරිවැය රු. 4,278,305 ක් වූ අතර එහි

අලෙවි වටිනාකම රු. 9,271,550 ක් විය. මේ අනුව මෙම පරිත්‍යාග නිසා අරමුදලට රු. 4,933,245 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ඇ) අරමුදලේ අධ්‍යක්ෂවරියක ලෙස සේවය කල නිලධාරිනියගේ වයස අවුරුදු 58 දක්වා සේවා දිගුව අංක 60/2011 හා 2011 අප්‍රේල් 29 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පදනම් කර ගෙන 2012 ඔක්තෝබර් 04 දක්වා ලබා දී තිබුණි. 2012 ඔක්තෝබර් 05 සිට ඇය විශ්‍රාම ගන්වා තිබු අතර ඊට එරෙහිව අවුරුදු 58 න් ඔබ්බට සේවා දිගුව ලබාදෙන ලෙසට ඇය කල අභියාචනයකට අනුව 2013 අප්‍රේල් 10 දිනැති අංක 188-26-1 පාලක මණ්ඩල තීරණය මගින් වසරක සේවා දිගුවක් ලබාදී තිබුණි. 2011 අප්‍රේල් 29 දිනැති අංක 60/2011 හා 2013 ජනවාරි 15 දිනැති අංක 01/2013 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුව අවුරුදු 58 න් ඔබ්බට සේවා දිගුව ලබාදීමට නීතිමය ප්‍රතිපාදන තිබියදී එසේ නොකිරීම හේතුවෙන් මාස 8 ක පමණ කාලයක් ඇගෙන් සේවය ලබා නොගෙන වැටුප් ගෙවීමට සිදුවී තිබු අතර දළ වශයෙන් රු. 452,336 ක පමණ මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවීමට සිදුවී තිබුණි.

4.9 <u>අරමුණට පටහැනි වියදම්</u>

අරමුණු වලට පටහැනි පහත සඳහන් වියදම් සමාලෝචිත වර්ෂය තුළදී දරා තිබුණි.

(අ) හිටපු ජනාධිපතිවරයාගේ ජන්ම දිනය හා පදවි ප්‍රාප්තිය වෙනුවෙන් 2014 නොවැම්බර් 19 දින සංස්කෘතික හා කලා කටයුතු ඇමතිතුමාගේ මාධ්‍ය ලේකම් විසින් පණිවුඩයක් පල කිරීම වෙනුවෙන් අරමුදල විසින් වැය කරන ලද මුදල රු. 1,635,200 ක් වු අතර එම ජනපති පදවි ප්‍රාප්තිය 2 වන සැමරුම වෙනුවෙන් සුභ පැතීම සඳහා පුවත්පත් දැන්වීම් ගාස්තු ලෙස රු.351,000 ක් ගෙවා තිබුණි.

(ආ) හිටපු සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යවරයා වෙත මල්වතු මහා විහාරයේ ද්වර්ගික කාරක සංඝ සභාව විසින් පිරිනමන ලද කීර්ති ශ්‍රී ජනරංජන හා ගෞරව සම්මාන ප්‍රදානය වෙනුවෙන් උපහාර දැක්වීමට පුවත්පතක දැන්වීමක් පලකිරීම වෙනුවෙන් අරමුදල විසින් රු. 414,000 ක මුදලක් වැයකර තිබුණි.

(ඇ) රාජකීය ආසියාතික සමිතිය නමින් වූ බාහිර පුද්ගලික ආයතනයක් විසින් සංවිධානය කළ ශාස්ත්‍රීය සම්මේලනය සඳහා අනුග්‍රාහක දීමනාවක් ලෙස අරමුදල විසින් රු.400,000 ක් ගෙවා තිබුණි.

(ඈ) 2015 වසරේදී ඇමතිතුමාගේ උපදෙස් මත ඔහුගේ මාධ්‍ය ලේකම් විසින් සුභ පැතුම් පත් 7500 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් වැය කරන ලද මුදල රු. 199,634 ක් ආයතනය විසින් ගෙවීම් කර තිබුණි.

4.10 **බාහිර පාර්ශවයන්ට ලබාදුන් අරමුදලේ සම්පත්**

(අ) සීගිරිය ව්‍යාපෘතියට අයත් රු. 1,614,965 ක් වටිනා GI බට 474 ක් හා කප්ලින් 677 ක් බාහිර පාර්ශව වෙත ලබා ඇතත් ඒවා ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම භාණ්ඩ අරමුදලේ කටයුතුවලට යොදා නොගෙන වර්ෂ 1 ½ ක් පමණ කාලයක් ඉන් බැහැර පුද්ගලයන්ට ලබාදී තිබුණි.

(ආ) රාජ්‍ය ව්‍යවස්ථාපිත ආයතනවල සම්පත් අධීක්ෂණ අමාත්‍යාංශයේ ප්‍රයෝජනය සඳහා ලබා නොදිය යුතු වුවත් සීගිරිය ව්‍යාපෘතියට අයත් කැබ් රථයක් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ අවශ්‍යතා වෙනුවෙන් 2014 මාර්තු 12 සිට අප්‍රේල් 21 දක්වා කාලය තුළ ලබා දී එම කාලය තුළ කි.මී.2065 ක් ධාවනයේ යොදවා තිබුණි.

(ඇ) මධ්‍යම සංස්කෘතික අරමුදලට අයත් තවත් කැබ් රථයක් හිටපු සංස්කෘති හා කලා කටයුතු අමාත්‍යවරයාගේ ප්‍රයෝජනය සඳහා 2012 ජුනි 12 දින රැගෙන ගොස් තිබුණද එම වාහනය 2015 ජුලි 15 තෙක් ආපසු භාරදී නොතිබුණි. මෙම වාහනය ආපසු ලබා ගැනීම සඳහා අරමුදල විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) අභයගිරිය ව්‍යාපෘතිය සතු GI බට 3204 ක් සහ බට අල්ලු 4320 ක් 2010 දෙසැම්බර් 31 දින සිට 2014 නොවැම්බර් 10 දක්වා කාලය තුළ අවස්ථා 12 කදී ව්‍යාපෘතියෙන් බාහිර පුද්ගලයින්ට අවිධිමත් ආකාරයෙන් ලබාදී තිබු අතර ඒවායේ වටිනාකම රු. 11,520,000 ක් විය. 2015 ජුලි 15 දින තෙක් මෙම ද්‍රව්‍ය ආපසු ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

4.11 **කාර්ය මණ්ඩල පරිපාලනය**

(අ ) සීගිරිය ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 8 දෙනෙකු රාජකාරි ඉටු කිරීමේ පදනම මත වර්ෂ 2 කට අධික කාලයක් සේවයේ යොදවා තිබු අතර රු. 272,760 ක මුදලක් 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය වෙනුවෙන් ගෙවීම් කර තිබුණි.

(ආ) සීගිරි ව්‍යාපෘතියේ කම්කරු තනතුරේ සේවකයන් 45 දෙනෙකු වර්ෂ 3 කට වැඩි කාලයක සිට නිත්‍ය තනතුරේ රාජකාරිවලින් බැහැරව ව්‍යාපෘති කාර්යලය තුළ හා මුර සේවයේ රාජකාරිවල යොදවා සිටින අතර කම්කරුවන්ගේ සේවය ලබා ගැනීම සඳහා කුලී පදනම මත සේවකයින් යොදවා ගැනීමට සිදුවී තිබුණි.

(ඇ) සීගිරි ව්‍යාපෘතියේ ආරක්ෂක නියාමක නිලධාරීන් 10 දෙනෙකු 2014 අගෝස්තු මාසය තුළ අඛණ්ඩව පැය 36 ක් සේවයේ යොදවාගෙන තිබීමෙන් කම්කරු පනතේ විධිවිධාන නොසලකා කටයුතු කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2015 පෙබරවාරි 28 දිනට පෙර විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් එම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2015 ජූලි 02 දිනදීය.

(ආ) 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීමට පෙර පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. පාලක මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම භාරගෙන ඒවා අනුමත කලයුතු වුවද එසේ කර නොතිබුණි.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

2014 වර්ෂය සඳහා සකස් කර තිබූ අයවැය ලේඛනය සහ 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව තථ්‍ය ආදායම හා වියදම සැසඳීමේදී සියයට 20 සිට සියයට 123 දක්වා විචලනයන් සිදුවී තිබෙන බව නිරීක්ෂණය විය. අයවැය ලේඛනය මනා මූල්‍ය පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව ඒ අනුව නිරීක්ෂණය වේ.

### 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

(අ) පොළොන්නරුව පූජා භූමියේ අභ්‍යන්තර ප්‍ර වේශ මාර්ගය කි.මී. 1 ක් දුරට සිමෙන්ති බ්ලොක් ගල් අසුරා සංවර්ධනය කිරීමේ කාර්යය වෙනුවෙන් කොන්ත්‍රාත් සමාගමක් වෙත රු. 28,255,312 ක් ගෙවා තිබූ අතර 2013 වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් පහත සඳහන් අඩුපාඩු පෙන්වා දී තිබුණද මෙතෙක් ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි.

(i) නිසි ප්‍රමිතියට නොමැති කොන්ක්‍රීට් ගල් ඉදිකිරීම් සඳහා යොදාගෙන ඒ වෙනුවෙන් රු. 22,099,917 ක් ගෙවා තිබීම.

(ii) ප්‍රමාන පත්‍රය අනුව ඉටු නොකළ වැඩ වෙනුවෙන් රු. 4,660,998 ක් ගෙවීම.

(iii) ABC ස්ථරය සියයට 40 ක් හා ගල්කුඩු මිශ්‍රණය සියයට 50 ක් අඩුවෙන් යොදා තිබීම හේතුවෙන් මාර්ගය සමතුලිතතාවයෙන් තොරව තිබීම.

(ආ) අරමුදලේ නීති නිලධාරී තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු 2013 ජුනි 01 සිට බඳවා ගැනීමේදී පැවති අඩුපාඩු සම්බන්ධයෙන් 2013 විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී තිබුණද තවදුරටත් එම නිලධාරියා අරමුදලේ සේවයේ යොදවාගෙන 2014 වර්ෂය සඳහා වැටුප් හා දීමනා රු. 478,620 ක් ගෙවා තිබුණි.

(i) නීති නිලධාරියා හට අනුමත බඳවා ගැනීම් පටිපාටිය අනුව පැවතිය යුතු සුදුසුකම් නොතිබියදී බඳවා ගෙන එම තනතුරට අදාල වැටුප් කාණ්ඩයේ වැටුප් හා වෙනත් දීමනාද ලබා තිබුණි.

(ii) වසරක් සඳහා සේවා කාලය දීර්ඝ කිරීමට දී තිබූ පාලක මණ්ඩල අනුමැතියට පටහැනිව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔහුගේ සේවා කාලය වසර 2 කින් දීර්ඝ කර තිබුණි.

(ඇ) සී/ස සංස්කෘතික සංරක්ෂණ හා ඉදිකිරීම් පෞද්ගලික සමාගමෙන් පුහුණු සංරක්ෂණ / කැණීම් සහයකයින් ලෙස ශ්‍රමිකයින් කොන්ත්‍රාත් පදනම මත ලබා ගැනීම සම්බන්ධයෙන් පහත අඩුපාඩු 2013 විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දී තිබුණද 2014 වර්ෂයේද එම සමාගමන් ශ්‍රමිකයින් ලබාගෙන වර්ෂය සඳහා රු. 167,911,290 ක් ගෙවා තිබුණි.

(i) සමාගම පිහිටුවීමේ අමාත්‍ය මණ්ඩල අනුමැතියට පටහැනිව එම සමාගමේ සේවකයන්ට අරමුදල මගින් වැටුප් ගෙවීම

(ii) ගිවිසුමේ කොන්දේසිවලට පටහැනිව සේවකයන් සේවයේ යෙදවීම.

(iii) අරමුදල මගින් එක් ශ්‍රමික දිනකට රු. 1,200 මගින් වැටුප් ගෙවීමේදී එක දිනයකින් රු. 500 ලාභයක් සමාගමට උපයා ගැනීමට ඉඩ සලසා තිබීම.

(iv) ව්‍යාපෘතිවල අවශ්‍යතාවය ඉක්මවා ශ්‍රමිකයන් සේවයේ යොදවා තිබීම

(ඈ) මධ්‍යම සංස්කෘතික අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවන හා මධ්‍යම සංස්කෘතික අරමුදල් පනතේ සඳහන් නොවන ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරක් සඳහා 2006 ජනවාරි සිට 2013 දෙසැම්බර් දක්වා මාසික දීමනා ලෙස රු. 4,494,105 ක් ගෙවා තිබීම

පිළිබඳ 2013 වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් පහත අඩුපාඩු පෙන්වා තිබුණද ඒ පිළිබඳ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබු අතර 2014 වර්ෂයේ ජනවාරි සිට 2015 ජනවාරි තෙක් මාසික දීමනා ලෙස රු. 886,730 ක් තවදුරටත් ගෙවා තිබුණි.

(i) දීමනා ගෙවීම සඳහා 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොතිබීම.

(ii) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ සේවයේ යෙදෙමින් මෙම නිලධාරියා වැටුප් ලබා ගනිමින් මධ්‍යම සංස්කෘතික අරමුදල මගින්ද සම්පූර්ණ වැටුප් ලබා ගැනීම.

(iii) එම ආයතන දෙකෙහිම වෙන් කල වාහන ලබාගෙන භාවිතා කිරීම හා ඉන්ධන දීමනා ලබා ගැනීම.

6. **පද්ධති හා පාලනය**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දූර්වලතා පිළිබඳව වරින්වර අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කර ඇත. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි තවදුරටත් විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) සංචාරක ප්‍රවේශපත් මුද්‍රණය අලෙවිය, තොග පාලනය හා ආදායම් එකතු කිරීම

(ඇ) ප්‍රසම්පාදනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) වාහන උපයෝජනය

(ඊ) සේවක මණ්ඩල කළමනාකරණය

විගණකාධිපති